ජාතික ජලජ සම්පත් නියෝජිතායතනය

தேசிய நீரியல்வள முகாமை

# NATIONAL AQUATIC RESOURCES AGENCY

NARA
06-12-1994
LIBRARY

# 1990

# NARA
(නාරා)

## වාර්ෂික වාර්තාව සහ ගිණුම්

## வருடாந்த அறிக்கையும் கணக்கு

## ANNUL REPORT AND ACCOUNTS

# සමුද්‍රීය ජෛව විද්‍යාත්මක සම්පත් අංශය.

## වාර්ෂික වාර්තාව - 1990.

මෙම අංශය විසින් භාරගනු ලැබූ වැඩ කටයුතු හිම කිරීම සඳහා පර්යේෂණ නිලධාරීන් හය දෙනෙකු යෙදී සිටියහ. වර්ෂය තුළදී පර්යේෂණ වැඩසටහනේ කටයුතු බාධාවකින් තොරව සිදු කෙරිණ. අන්තර් ජාතික සහයෝගීතාවය සමග සංවර්ධනය වන රටවල් (සාරෙක්) සඳහා වූ ස්වීඩන් නියෝජිතායතනය විසින් මුදල් යොදවන ලද පුත්තලම්/ මුන්දල් කලපුවල ජලය හා ඒ සම්බන්ධ වෙරළ ජලය පිළිබඳ අධ්‍යයනයක් ජූලි මාසයේ දී ආරම්භ කෙරිණ. මේ සඳහා නරේසා මගින් පර්යේෂණ නිලධාරියෙකු බඳවා ගනු ලැබීය. ඉන් පසුව වර්ෂය තුළදී තවත් සේවක පිරිස් එනම් ක්ෂේත්‍ර සහකාර වරුන් දෙදෙනෙකු ද කාර්යාල කම්කරුවෙකු ද මෙම අංශයේ සේවා කටයුතු සඳහා සාරෙක් ව්‍යාපෘතිය යටතේ බඳවා ගනු ලැබූහ. පර්යේෂණ වැඩ සටහනට අමතරව පහත සඳහන් කෙටි විස්තර වලින් පැහැදිලිවන ආකාරයේ තවත් කෙටි කාලීන පර්යේෂණ අධ්‍යයන කිහිපයක් මෙමි අංශය විසින් කරනු ලැබීය. ඒ ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශයේ ඉල්ලීම් අනුව කරන ලද වැඩ කටයුතුය.

### 1. පර්යේෂණ වැඩ සටහන.

1990 වර්ෂය තුළ මෙම අංශය විසින් ප්‍රධාන ව්‍යාපෘති හයක වැඩ කටයුතු භාරගෙන තිබිණ. මෙම ව්‍යාපෘතියේ සියල්ලම දීර්ඝ කාලීන ඒවා වන අතර ඉදිරි වර්ෂ වලදීත් එම කටයුතු නොකඩවාම කරනු ඇත.

### 1.1 විශාල සාමුද්‍රීය මසුන් පිළිබඳ අධ්‍යයනය .

වර්ෂයේ මුල් භාගයේ දී පර්යේෂණ නිලධාරීන් තුන් දෙනෙකු මෙම අධ්‍යයන කටයුතුවල නිරත වූ අතර ජූලි මාසයේ දී නිලධාරීන්දෙදෙනෙකු එනම් කොටස් කාල සේවයෙහි යෙදුණු ජේ.ඒ.ද සිල්වා මහතාත්, ආර් මල්දෙනිය මහත්මියත්පශ්චාත් උපාධි පාඨමාලාවක් හැදෑරීම සඳහා විදේශ ගත වූහ.

### 1.1.1 නාරා/අයිපීටීපී තියැඳි වැඩසටහන.

1990 වර්ෂය තුළදී මෙම වැඩසටහනේ කටයුතු උතුරු ප්‍රදේශයේ කල්පිටියේ සිට දකුණු ප්‍රදේශයේ හම්බන්තොට දක්වා වූ ප්‍රධාන ගොඩ බෑම් ස්ථාන වලදී සිදු කෙරිණ. මෙම ස්ථානවල දත්ත රැස්කරන්නන් විසින් විශාල සාමුද්‍රීය මසුන් ඇල්ලීම්/ප්‍රයත්නයන් හා දිගු සංඛ්‍යානයන් පිළිබඳ දත්ත රැස් කරනු ලැබේ. ව්‍යාපෘතියට අනුයුක්ත කර ඇති පර්යේෂණ නිලධාරීන් විසින් මෙම දත්ත රැස් කරන්නන්ගේ වැඩ අධීක්ෂණය කරනු ලබයි. වර්ෂය තුළ දී රැස් කරන ලද දත්ත පරිගණක දත්තාගාරය තුලට ඇතුළු කර ඇති අතර ඉන් සමහර දත්ත විශ්ලේෂණය කිරීමෙන් ලබා ගත් ප්‍රතිඵල ඇතුළත් කොට පර්යේෂණ පත්‍රිකා වශයෙන් 1990 ජූලි මස බැංකොක් නුවර පැවැති ඉන්දියානු සාගරයේ ටූනා

(කෙලවල්ලා) මුසුන් තොග තක්සේරු කිරීම යන මැයෙන් වූ හතර වැනි විශේෂඥ හමුවේ දී ඉදිරිපත් කරන ලදී.

1.1.2 ඉංජිනේරු හා තාක්ෂණික අංශයන් සමග සිදු කරන ලද එච්.ඩබ්.35 යාත්‍රාවේ ධීවර ගවේෂණය.

එච්.ඩබ්.35 යාත්‍රාව විකරණය කිරීමෙන් පසු 1990 දෙසැම්බර් මාසයේදී ගවේෂණ සමීක්ෂණයකට භාජනය කරන ලදී. 1990 දෙසැම්බරයේදී දින 10 යේ මුහුදු චාරිකා දෙකක් මෙහෙයවනු ලැබූ අතර මසුන් ඇල්ලීමේ කටයුතු බටහිර හා දකුණු ප්‍රදේශවලට පමණක් සීමා කරනු ලැබීය.

1.1.3 ජෛව විද්‍යාත්මක අධ්‍යයන.

1990 වර්ෂය තුළ දී කාවා කාවා සහ ඇට වුනා (කෙලවල්ලා) මසුන් ගේ වැඩීම හා ආයුෂ පිළිබඳ අධ්‍යයනයන් දිගටම කරගෙන යන ලදී.

## 1.2 කුඩා සාමුද්‍රීය මසුන් පිළිබඳ අධ්‍යයනය.

මෙම අධ්‍යයනයේ ප්‍රධාන කාර්යය වූයේ මූලික වශයෙන් කරමල දැල්, මා දැල් හා ගෑඹිලි දැල් ධීවර කර්මාන්තයන් පිළිබඳ කුඩා සාමුද්‍රීය මසුන් වර්ග නිෂ්පාදනය අධ්‍යයනය කිරීමය.

නාරා /අයිපීපී නියැදි වැඩසටහන මගින් සේවයෙහි යොදවා ගනු ලැබූ තාවකාලික දත්ත රැස් කරන්නන් ගේ ආධාර ඇතිව හම්බන්තොට හා තන්දකුලිය යන තෝරාගත් මසුන් ගොඩබෑමේ ස්ථාන වල කරමල දැල් ධීවර කර්මාන්තය අධීක්ෂණය කරන ලදී. මෙම ස්ථාන වල කෙරෙන වැඩ නාරා ආයතනයේ සේවක මණ්ඩලය විසින් අධීක්ෂණය කරනු ලැබීය. හලාවත නියැදි කටයුතු සම්පූර්ණයෙන්ම නාරා සේවකයින් විසින් ඉටු කරන ලදී. රැස් කරන ලද දත්ත නාරා හි දත්තාගාරයට එකතු කරන ලද අතර ඒ ඒ අවස්ථාවන් හිදී අවශ්‍යවූ තොරතුරු ලබා ගන්නා ලදී. දත්තයන් දැනට විශ්ලේෂණයකට භාජනය කොට ඇත. මේ වර්ෂයේ ධීවර කර්මාන්තයෙහි වැදගත්ම ලක්ෂණය වන්නේ ශ්‍රී ලංකාවේ දකුණු හා බටහිර වෙරළ ජලයෙහි හෙල් සාඩින් ( Sardinells Longiceps) නම් මසුන් වර්ගය ඉතා විශාල වශයෙන් ලැබීමය.

මෙම වර්ෂය තුළ දී කුඩා සාමුද්‍රීය මත්ස්‍ය සම්පත් පිළිබඳව පර්යේෂණ පත්‍රිකා ගණනාවක්ම සකස් කොට ධීවර යහරාවල පළ කිරීම සඳහා යවනු ලැබ ඇත.

ශ්‍රී ලංකාවේ මීගමුව අවට වෙරළෙහි කුඩා කරමල දැල් මසුන් ( Amblygaster Sirm ) කර්මාන්තය හා ජෛව විද්‍යාව යන හිසින් ප්‍රබන්ධයක් සකස් කොට 1990 අගෝස්තු මස දී කැළණිය විශ්ව විද්‍යාලයට ඉදිරිපත් කරන ලදී. මෙය ඇන් කරුණාසිංහ මහත්මියගේ දර්ශන විද්‍යාපති උපාධි අවශ්‍යතා අංශයක් සපුරා ලීම වශයෙනි.

## 1.3 ඉස්සන් ධීවර කර්මාන්තය.

1990 වසරේ දී මෙම ව්‍යාපෘතියෙන් ආවරණය කරන ලද ප්‍රදේශයන් නම් මීගමුව හා හලාවතය. මීගමුවේ ඉස්සන් කර්මාන්තය කරනු

ලබන්නේ කඹ රුවල් යොදා ඔරු මගිනි. හලාවත මේ සඳහා යොදා ගනු ලබන්නේ ටොන් 3 1/2 යාන්ත්‍රික බෝට්ටුය. මෙම මසුන් ගොඩ බෑමේ ස්ථානයකටම මසකට දෙවරක් බැගින් ගොස් ඒ ඒ ඉස්සන් වර්ග අල්ලා ගැනීමේ දත්ත හා ප්‍රයත්න රැස්කරනු ලැබේ. කිරිඉස්සන් හෙවත් ඉන්දියන් ඉස්සා ( Penaaens Indicus ) මෙහි ඇති ආර්ථික වශයෙන් වැදගත් විශාල ඉස්සන් වර්ගයකි. ජනගහණ ගතිකයන් අධ්‍යයනය කරනු වස් සෑම මසකම මෙම ඉස්සන්ගේ සාම්පලයක මුළු දිග ප්‍රමාණය මැන බලනු ලැබේ.

ප්‍රතිඵල වලින් පෙනී යන්නේ මීගමුවෙන් අල්ලා ගත් මුළු ඉස්සන් ප්‍රමාණයේ ඒකක ප්‍රයත්න මාධ්‍යයකය 1989 සිට 1990 වන විට 21.9% කින් අඩුවී ඇති බවය.

හලාවත ඉස්සන් ඇල්ලීමේ ඒකක/ ප්‍රයත්න මාධ්‍යයකය 10.8 % කින් ඉහළ ගොස් ඇත.

මීගමුවේ ඉස්සන් ඇල්ලූ ඉහලම ඒකක ප්‍රයත්න මාධ්‍යකය අගෝස්තුවේ දී බව පෙනී ගිය අතර හලාවත අධික ප්‍රයත්න මාධ්‍යකය දෙසැම්බර් මස දී බව සටහන් වී ඇත.

## 1.4. පොකිරිස්සන් ධීවර සමීක්ෂණය.

සියළුම මසුන් ගොඩ බෑමේ ස්ථානවලට සෑම මසකම ක්ෂේත්‍ර චාරිකා වල යෙදී ඇත. අල්ලා ගත් සම්පූර්ණ මසුන් ප්‍රමාණය, පූර්ණ ප්‍රයත්න යත් හා මසුන් වර්ගවල සැදියාව පිළිබඳ දත්ත ක්ෂේත්‍රයේ දීම රැස් කරනු ලැබීය මෙම දත්ත ඇසුරින් පහත සඳහන් මත්ස්‍ය ගහණ පරාමිති එළිමන් (Eleman ) පරිගණක වැඩ සටහන් මගින් ඇස්තමේන්තුකර ඇත.

1. මුළු පොකිරිස්සන් නිශ්පාදිතය මෙ.ටො. 110
2. සම්පූර්ණ ප්‍රයත්නය ඔසුන් ඇල්ලීමේ දින) චාරිකා 52000
3. වැඩීමේ නියාංකය (කේ) ගැහැණු වර්ගින් සඳහා 0.41
4. සම්පූර්ණ මැරීයාමේ ප්‍රමාණය (ඉසෙඩ්) 1.55
5. ස්වාභාවික මැරීමේ ප්‍රමාණය (එම්) 0.35
6. උපයෝගී කර ගැනීමේ ප්‍රමාණය(ඊ) 0.774

මෙයින් පැහැදිලි වන්නේ ඉහළ මට්ටමක උපයෝගී කර ගැනීමේ තත්ත්වයක් තිබෙන බවයි. එබැවින් කළමනාකරණ ක්‍රමෝපායයන් හඳුන්වාදීමේ අවශ්‍යතාවයද මෙයින් පෙන්නුම් කෙරේ. ස්වයෙහි යෙදීමෙන් පෙනී යන්නේ වර්ෂයක දී මසුන් බහුල වාරකාල දෙකක් සහිතව නොකඩවාම ඵල ලැබෙන රටාවක් තිබෙන බවය.

## 1.5 උපතිතල ධීවර සමීක්ෂණය.

මෙම සමීක්ෂණයේ ප්‍රධාන අරමුණු වන්නේ ශ්‍රී ලංකාවේ ඇති උපතිතල මත්ස්‍ය සම්පත් තක්සේරු කිරීමත් දැනට ඇති උපයෝගීකර ගැනීමේ මට්ටම නිර්ණය කිරීමත්ය. නොයෙකුත් හේතූන් මත පනම් මුදල් හා සේවක පිරිස් සීමිත වූ හෙයින් මෙම අධ්‍යයනය මුලින්ම බටහිර වෙරළට

පමණක් සීමා කරන ලදි. මීගමුව හා හලාවත ප්‍රදේශවල ප්‍රධාන මසුන් ගොඩබෑමේ ස්ථාන වල ධීවර කර්මාන්තය පිළිබඳ දත්ත රැස්කිරීම සඳහා සතිපතා චාරිකා කරන ලදි. මීගමු ප්‍රදේශයේ අත්යොත් යොදා මසුන් ඇල්ලීමේ ප්‍රයත්නයන් අධික ලෙස වැඩි වෙමින් පවතින බැව් පෙනීගොස් ඇත. මෙ මගින් අල්ලා ගනු ලබන මසුන් සඳහා හොඳ මිලක් ලැබෙන බවත් මෙම වර්ෂයේ ජනවාරියේ දී දිනකට බෝට්ටු 70-80 ප්‍රමාණයක් හා දෙසැම්බරයේ දී දිනකට බෝට්ටු 125-150 ක් අතර මසුන් ඇල්ලීමේ යෙදී ඇති බවක් පෙනී ගොස් ඇත.
උපතිහල මසුන් ඇල්ලීම පිළිබඳ තත්ත්වය නිශ්චයනය කිරීම පිණිස දකුණු දිග වෙරළ පෙදෙසට චාරිකා දෙකක් මෙහෙයවන ලදි. බලපිටිය හා ගන්දර හැරුණු විට කලුතර සිට තංගල්ල දක්වා උපතිහල මසුන් ඇල්ලීම් ගැන එතරම් සැලකිල්ලක් දක්වා ඇති බවක් නොපෙනේ. මෑතක දී සිට ගන්දර ප්‍රදේශයේ මුදු පතුලේ ලෝන් ලයින් ක්‍රමයට මසුන් ඇල්ලීමේ ක්‍රමයක් පටන් ගෙන තිබේ.

## 1.6 සාරෙක්.

සාරෙක් ව්‍යාපෘතියේ (පුත්තලම/මුන්දල් මෝයකට හා ඒ ආශ්‍රිත වෙරළ ජල ප්‍රදේශවල) මුහුදු ජෛව විද්‍යාත්මක සමීක්ෂණ කටයුතු 1990 අගෝස්තු වේ දී ආරම්භ කෙරිණ. මූලික වශයෙන් පුත්තලම් කලපුවේ හා වෙරළ ජල ප්‍රදේශ අවට වැදගත් මසුන් ගොඩ බෑමේ ස්ථාන තෝරාගැනීම සඳහා මාසීම් සමීක්ෂණයක් කරන ලදි. පුත්තලමේ සිට කල්පිටිය දක්වා වූ මසුන් ගොඩ බෑමේ ස්ථාන හයක් තෝරා ගන්නා ලදි. ආරක්ෂක හේතූන් මත පුත්තලමෙන් උතුරු දෙසට ඇති මසුන් ගොඩබෑමේ ස්ථාන වලට නොයන ලදි. විශේෂ මසුන් වර්ගවල මත්ස්‍ය ගහණ පරාමිති සහ ධීවර කර්මාන්තය පිළිබඳ දත්ත රැස්කිරීම සඳහා මෙම මසුන් ගොඩ බෑමේ ස්ථාන හයටම සති දෙකකට වරක් චාරිකා කරන ලදි. මේ දක්වා කටු සහිත මසුන් හා වරල් සහිත මසුන් වර්ග 50 ක් පමණ හඳුනා ගෙන ඇතත් මේ අතර ප්‍රමුඛ ගණයට වැටෙන මසුන් හඳුනාගෙන ඇත්තේ ඉතා සුළු වශයෙනි. මෙම මසුන් අතර දුඹුරු ගල්මාලු( Mugil Spp, Clupaids(Sardinella Spp, Signus Spp සහ Leiognahus Spp ද වේ. Penaeus Indicus සහ Penaeus Semisulcatus යනුවෙන් වර්ග වාණිජමය වශයෙන් වැදගත්වන ඉස්සන් වර්ගවේ. මෙයට අමතරව Plankton වර්ගය පිළිබඳ තත්ත්ව හා ප්‍රමාණ විශ්ලේෂණයන් ද කරන ලදි. මූලික නිශ්පාදින පිළිබඳ අධ්‍යයනයන් ඉදිරියේ දී කිරීමට ඇත.

## 2. වෙනත් කටයුතු.

### 2.1 ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශයට සපයන ලද සේවාවන්.

2.1.1 මීගමු ප්‍රදේශයේ කොටුදැල් ධීවර කර්මාන්තය පිළිබඳ සමීක්ෂණය.

මීගමු ප්‍රදේශයේ කොටුදැල් ධීවර කර්මාන්තය නිසා කුඩා සාමුද්‍රිය මසුන් සම්පත් කෙරෙහි බලපාන පල විපාක පිළිබඳව පුරා එක් මසක ගැඹුරු පරීක්ෂණයක් කරන ලදි. මේ සම්බන්ධයෙන් වාර්තාවක් ගරු ධීවර හා ජලජ සම්පත් ඇමතිතුමාට ඉදිරිපත් කරනු ලැබීය.

5 .....

2.1.2 හම්බන්තොට දිස්ත්‍රික්කයේ ඇඹිලිගහ කලපුව හා මාතර, චිත්‍රපල, කලමැටිය, රැකව සහ හාවැල්ල යන ස්ථානවල සංවර්ධන විභවය පිළිබඳ අධ්‍යයනයක් සඳහා යෝජනා පිළියෙල කිරීමට ක්ෂේත්‍ර චාරිකා කරන ලදී.

2.2 වෙනත් ආයතන සඳහා සැපයූ සේවාවන්.

2.2.1 කොළඹ විශ්ව විද්‍යාලයේ ධීවර ජෛව විද්‍යාව 03 වැනි වසර (සාමාන්‍ය) හා 04 වැනි වසර (විශේෂ) සිසුන් සඳහා සත්ත්වවිද්‍යා දෙපාර්තමේන්තුවේ බාහිර දේශන පැවැත්වීම සඳහා ආචාර්ය පී. දයාරත්න ගේ සේවය ලබා දෙන ලදී.

## 3. පුහුණු/වැඩ මුළු/ සම්මන්ත්‍රණ.

1. 1990 පෙබරවාරි 21 - 22 දින දක්වා පැවැති මීගමුවේ වෙරළට ඔබ්බෙන් ධීවර කර්මාන්තය යන මැයෙන් වූ සම්මන්ත්‍රණයකට ආචාර්ය පී. දයා රත්න, සී. අමරසිරි මහත්මිය, ආර්. මල්දෙනිය මහත්මිය, සහ ජේ. ඒ. ද. සිල්වා යන අය සහභාගී වූහ.
2. කොළඹ ටාජ් සමුද්‍ර හෝටලයේ 1990 මාර්තු 12 - 16 දින දක්වා පරිසර විද්‍යාව හා ඉඩම් සැකසුම් කළමනාකරණය යන මැයෙන් වූ සම්මන්ත්‍රණයකට සී. ජයවික්‍රම මහත්මිය සහභාගී වූවාය.
3. කොළඹ කාර්මිකර්ම පර්යේෂණ හා පුහුණු ආයතනයේ දී 1990 මාර්තු 20-22 දින තෙක් තාක්ෂණික නවීකරණයෙහි කාන්තාවගේ කාර්ය භාරය යන මැයෙන් පැවැති සම්මන්ත්‍රණයට ආචාර්ය පී. දයාරත්න සහභාගීවිය.
4. කොළඹ බණ්ඩාරණායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ 1990 අප්‍රේල් 5 -6 දක්වා පැවැති 1990/1994 ධීවර සංවර්ධන සැලැස්ම පිළිබඳ වැඩ මුළුවකට ආචාර්ය පී. දයාරත්න, ඩී. ඇස්. ජයකොඩි මහතා සහ සී. අමරසිරි මහතා සහ ආර්. මල්දෙනිය යන මහත්මිය ද සහභාගී වූ හ.
5. 1990 මැයි මස 21 -23 දින දක්වා කොළඹ පැවැති අයි. ඇෆ්. ඇෆ්, සී. හි 23 වැනි සැසි වාරයට ආචාර්ය පී. දයාරත්න හා ඩී. ඇස්. ජයකොඩි මහතා ද සහභාගී වූහ.
6. 1990 මැයි 03 -19 දින දක්වා මාලදිවයිනේ පැවැති ටූනා මත්ස්‍යයන්ගේ සටහන් කැබලි එල්ලීම පිළිබඳ පුහුණුවකට ජේ. ඒ. ද සිල්වා සහ එච්. ඩී. විමලසේන යන මහත්වරු සහභාගී වූහ.
7. 1990 ජූලි 01 -12 දින දක්වා තායිලන්තයේ බැංකොක් නුවර පැවැති ඉංදියන් සාගරයේ ටූනා තොග තක්සේරු කිරීමේ 4 වැනි විශේෂඥයින්ගේ හමුවට හා ඉංදියානු සාගර ධීවර කොමිසමේ 11 වැනි සැසි වාරයට ආචාර්ය පී. දයාරත්න හා ආර්. මල්දෙනිය මහත්මිය සහභාගී වූහ.

8. නෝර්වේ බර්ජන් නුවර පැවැත්වුණ ධීවර ජෛව විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාවකට සහභාගිවීම සඳහා ආර්. මල්දෙනිය මහත්මිය 1990 අගෝස්තු 03 වැනි දින පිටත්ව ගියාය.

9. මලයාසියාවේ පිනෑං නුවර 1990 ඔක්තෝබර් 01 සිට 12 දින දක්වා පැවැත් වෙන කුඩා පරිමාණ ධීවර කර්මාන්තයේ ජෛවාර්ථිකය පිළිබඳ වූ පළමු වැඩ මුළුවට ආචාර්ය පී. දයාරත්න සහභාගිවිය.

10. කොළඹ මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ 1990 නොවැ.05-16 දින දක්වා පැවැති දුරස්ථ සංවේදී තාක්ෂණය පිළිබඳ වැඩ මුළුවට සී. අමරසිරි සහ සී. ජයවික්‍රම යන මහත්මීහු සහභාගී වූහ.

11. 1990 නොවැ. 17 -18 දින දක්වා ශ්‍රී ලංකාවේ විද්‍යාභිවර්ධක සංගමයේ ශ්‍රවනාගාරයේ දී පැවැති " ශ්‍රී ලංකාවේ කරන ලද ජෛවික පර්යේෂණ පිළිබඳ සමුළුවකට ආචාර්ය පී. දයාරත්න සහභාගිවූවාය.

## 4. පත්‍රිකා ලේඛණය.

පළකරන ලද පත්‍රිකා.

1. ශ්‍රෝත්‍රාශ්මයෙහි දෛනික වැඩීම වර්ධනය මැනීම මගින් බාල වයස් කාවා කාවා ( Euthynnus Affinis ) නම් මත්ස්‍යයාගේ වයස හා වර්ධනය තක්සේරු කිරීම. ආචාර්ය ප. දයාරත්න විසින් 1990 ජූලි මස 2-6 දින තායිලන්තයේ බැංකොක් නුවර ඉන්දියානු සාගරයේ කෙලවල්ලා මසුන් තොග තක්සේරු කිරීම පිළිබඳව පැවැති විශේෂඥ සමුළුවක දී ඉදිරිපත් කරන ලද වාර්තාවකි.

2. ශ්‍රී ලංකාවේ කෙලවල්ලන් ධීවර කර්මාන්තය. මෙය යාවත් කාලීනයකි. ආචාර්ය පී. දයාරත්න සහ ජේ. ඒ. ද සිල්වා විසින් 1990 ජූලි 2 සිට 6 දින දක්වා තායිලන්තයේ බැංකොක් නුවර ඉන්දියානු සාගරයේ කෙලවල්ලන් තොග තක්සේරු කිරීමේ තේමාව යටතේ පැවැති විශේෂඥ හමුවේ තබන ලද වාර්තාවකි.

3. ශ්‍රී ලංකාවේ ගයාගෙන යන කරමල්දැල් ධීවර කර්මාන්තය. ආචාර්ය පී. දයාරත්න විසින් 1990 ජූලි 2-6 දක්වා තායිලන්තයේ බැංකොක් නුවර ඉන්දියානු සාගරයේ කෙලවල්ලන් මසුන් තොග තක්සේරු කිරීමේ තේමාව යටතේ පැවැති විශේෂඥ හමුවේ දී ඉදිරිපත් කරන ලද වාර්තාවකි.

4. ශ්‍රී ලංකාවේ වෙරළට ඔබ්බෙන් ධීවර කර්මාන්තය හා සම්පත්. ආචාර්ය පී. දයාරත්න විසින් ශ්‍රී ලංකා/කෘ.ආ.ස/බෙං.බො.වැ/ මගින් සංවිධානය කොට පෙබරවාරි 21 -22 දින දක්වා මීගමුවේ පැවැති සම්මන්ත්‍රණයේ දී ඉදිරිපත් කරන ලද වාර්තාවකි.

5. 1990 මාර්තු 20 –22 දින දක්වා කොළඹ කෘෂිකර්ම පර්යේෂණ හා පුහුණු ආයතනයේ දී තාක්ෂණික තවීකරණ භාවිතයේ දී කාන්තාවගේ කාර්ය භාරය යන මැයෙන් පැවැති සම්මන්ත්‍රණයට ආචාර්ය පී.දයාරත්න විසින් ඉදිරිපත් කරන ලද " ධීවර කර්මාන්තයෙහි කාන්තාවගේ කාර්ය භාරය" යන හිසින් වූ පත්‍රිකාවකි.

6. 1990 අප්‍රේල් මස 5 – 6 දිනවල කොළඹ බ.ආ.ජා.ස.ශාලාවේ දී 1990–1994 ධීවර සංවර්ධන සැලැස්ම යන තේමාව යටතේ පැවැති වැඩ මුළුවට "මුහුදු සම්පත් පර්යේෂණ" නමින් ආචාර්ය පී.දයාරත්න ඉදිරිපත් කළ පත්‍රිකාවකි.

7. 1990 නොවැම්බර් මස 17 – 18 යන දිනයන්හි ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමයේ ශ්‍රවනාගාරයේ " ශ්‍රී ලංකාවේ කරන ලද භෞතික පර්යේෂණ" යන තේමාව යටතේ පැවැති ඉහළ පෙළේ හමුවේ දී ආචාර්ය පී.දයාරත්න විසින් ඉදිරිපත් කරන ලද " ශ්‍රී ලංකාවේ කරන ලද ධීවර පර්යේෂණ භෞතිකය" යන හිසින් වූ පත්‍රිකාවකි.

8. ආචාර්ය පී.දයාරත්න සහ ජේ.ඒ.ද සිල්වා විසින් රචිත "ශ්‍රී ලංකාවේ බටහිර වෙරළේ කාවා කාවා (Euthynnus Affinis මත්ස්‍ය තොග" නම් වූ ලිපිය, ආසියානු ධීවර විද්‍යා සභාවේ පළකිරීමට පිළිගන්නා ලදි.

9. 1990 ජූලි 2 – 6 දින දක්වා තායිලන්තයේ බැංකොක් නුවර ඉන්දියානු සාගරයේ කෙලවල්ලා තොග තක්සේරු කිරීම මැයෙන් පැවැති විශේෂඥ උපදේශක හමුවේ දි "ශ්‍රී ලංකාවේ කුඩා කෙලවල්ලන් ධීවර කර්මාන්තය සඳහා මෑතක දී ඇතිවූ නැඹුරුව" මැයෙන් ආචාර්ය පී.දයාරත්න හා ජේ.ඒ.ද සිල්වා විසින් ඉදිරිපත් කරන ලද පත්‍රිකාව.

10. "ශ්‍රී ලංකාවේ බටහිර වෙරළේ අත්යොත් ධීවර කර්මාන්තය පිළිබඳ මූලික පරීක්ෂණයක්" යන හිසින් ආචාර්ය පී.දයාරත්න සහ සී.අමරසිරි විසින් සකස් කරන ලද ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය මගින් ප්‍රසිද්ධ කරන ලද ලිපියකි.

11. ශ්‍රී ලංකාවේ මෑතකදී සංවර්ධනය කරන ලද වෙරළෙන් ඔබ්බෙහි ස්කිප්ජැක් ටූනා (කෙළවල්ලා) සහ යෙලෝෆින් ටූනා (කෙලවල්ලා) මසුන් කර්මාන්තය ගැන සංග්‍රහයක්. ජේ.ඒ.ද සිල්වා සහ ආචාර්ය පී.දයාරත්න විසින් ඉදිරිපත් කරන ලද්දකි. 1990 ජූලි 2 – 6 දින දක්වා තායිලන්තයේ බැංකොක් නුවර දී ඉන්දියානු සාගරයේ කෙළවල්ලන් තොග තක්සේරුවක් යන මැයෙන් වූ විශේෂඥ හමුවේ වාර්තාවකි.

12. ඩොල්ෆින් මසුන් යොදාගෙන යෙලෝෆින් කෙලවල්ලන් සෙවීමේ ක්‍රමය විශේෂ කොටගත්, ශ්‍රී ලංකාවේ බටහිර වෙරළේ අත්යොත් ධීවර කර්මාන්තය පිළිබඳ අධ්‍යයනයක්. ජේ.ඒ.ද සිල්වා සහ බී.බොත්පස් (1990) ගේ පත්‍රිකාවකි.මෙය 1990 ජූලි 2 – 6 දින දක්වා තායලන්තයේ බැංකොක්නුවර ඉන්දියානු සාගරයේ කෙලවල්ලන් තොග තක්සේරු කි රීම මැයෙන් පැවැති විශේෂඥ හමුවේ වාර්තාවකි.

8 .....

13. " ශ්‍රී ලංකාවේ නිරිත දිග වෙරළෙන් අල්ලා ගත් කෙලවල්ලා මසුන් අතර තිබූ ලාබාල ඇස්ගෙඩි කෙලවල්ලා " ආර්.මැදදනිය සහ ආචාර්ය පී.දයාරත්න විසින් 1990 දී රචිතය. 1990 ජූලි මස 2 -6 දින දක්වා තායිලන්තයේ බැංකොක් නුවර ඉන්දියානු සාගරයේ කෙලවල්ලන් තොග තක්සේරු කිරීම යන මැයෙන් පැවැත්වූ විශේෂඥ හමුවේ දී ඉදිරිපත් කරන ලද වාර්තාවකි.

14. විද්‍යෝදය විද්‍යා සභාරාවට සපයන ලද " ශ්‍රී ලංකාවේ අනාගතයට යමින් තිබෙන රිටි සහ යොත් " සී.අමරසිරි (1990)

15. ශ්‍රී ලංකාවේ බටහිර වෙරළේ කුඩා ඇස් සහිත කරමල දැල් මසුන් කර්මාන්තයෙහි කුඩා කරමලදැල් මසුන් තෝරා ගැනීම ඇස්තමේන්තු කිරීම. දැනට මුද්‍රණයේය. ඩබ්.පී.එන්.කරුණාසිංහ සහ එම්.ජේ.ඇස්. විජයරත්න යන අයගේ නිර්මාණයකි.

16. ශ්‍රී ලංකාවේ නිරිත දිග වෙරළේ 1983 සැප්තැම්බර් මස සිට 1986 අගෝස්තු මස දක්වා වූ කාලය තුල මාදැල් ධීවර කර්මාන්තයේ තත්ත්වය" දැනට මුද්‍රණයේය. ඉන්දියාවේ කොචින් නුවර 1988 පැවැති නිවර්ථන කලාපීය මුහුදු ජීවී සම්පත් පිළිබඳ ඉහළපෙළේ සමුළුවට ඩබ්.පී.එන්. කරුණාසිංහ විසින් ඉදිරිපත් කරන ලද පත්‍රිකාවකි.

17. ආසියානු ධීවර විද්‍යා සභාරාවට යවනු ලැබූ " ශ්‍රී ලංකාවේ මීගමුව අවට වෙරළබඩ ජලයෙහි කුඩා කරමලදැල් මසුන්ගේ ජනගහණ ගති විද්‍යාව" එම්.ජේ.ඒස්. විජයරත්න සහ ඩබ්ලිව්.පී.එන්.කරුණාසිංහ විසිනි.

18. ධීවර ජෛව විද්‍යා සභාරාවට ඉදිරිපත් කළ " ශ්‍රී ලංකාවේ බටහිර වෙරළ ජලයෙහි කුඩා කරමලදැල් මසුන්ගේ නිෂ්පාදන ජෛව විද්‍යාව" ඩබ්.පී.එන්.කරුණාසිංහ සහ එම්.ජේ.එස්. විජයරත්න විසින් සකස් කරනු ලැබූ ලිපියකි.

19. ශ්‍රී ලංකාවේ බටහිර වෙරළේ ට්‍රෙන්චි සාඩින් හෙවත් Amblygaster Srim(Walbaum ) නම් කුඩා කරමල දැල් මසුන් වර්ගය වාර කාලයේ දී බහුලවීම" යන හිසින් ඩබ්.පී.එන්. කරුණාසිංහ සහ එම්.ජේ.එස්.විජේරත්න විසින් සකස් කරන් ලද පත්‍රිකාවකි.

## ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශයට ඉදිරිපත් කරන ලද වාර්තා.

1. මීගමු කොටු දැල්,මා දැල් හා පෙප්පම් ධීවර කර්මාන්තය පිළිබඳ වාර්තාව.

2. ධී.හා.ජ.ස. අමාත්‍යාංශයේ ඉල්ලීමක් අනුව ශ්‍රී ලංකාවේ දකුණු දිග වෙරළේ තෝරාගත් කලපු කිහිපයක් සංවර්ධනය කිරීමට යෝජනාවක්. මෙම වාර්තාව ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශයට හා නෝරාඩ් ආයතනයට ද ඉදිරිපත් කරන ලදී.

3. ම.කො.ආ.කො. ඉල්ලීමක් අනුව මුතුරාජවෙල පිරවීම හේතුවෙන් මීගමු කලපුවේ මුහුදු ජීවීන්ට බල පෑ හැකි ප්‍රති විපාක තක්සේරු කොට වාර්තාවක් සකසන ලදී.

## 6. ව්‍යාප්ති වැඩ.

සම්මන්ත්‍රණ/ගුවන් විදුලි වැඩසටහන්/පුවත්පත් ලිපි ආදී ජනමාධ්‍යතුලින් ධීවරයාට දැනුමක් ලබා දීම.

### 6.1. සම්මන්ත්‍රණ.

6.1.1 1990 පෙබරවාරි මස 9 වැනි දින හුංගල්ලේ දී පොකිරිස්සන් සම්පත් පර්යේෂණය පිළිබඳ සම්මන්ත්‍රණයක් පවත්වන ලදී.

6.1.2 1990 මාර්තු 09 වැනි දින නාරා ආයතනයේ දී එන්.ඩබ්.35 යාත්‍රාව මගින් ගවේෂණ ධීවර කර්මාන්තය යන මැයෙන් සම්මන්ත්‍රණයක් පැවැත්විණි.

### 6.2. ගුවන් විදුලි වැඩසටහන.

6.2.1 1990 ජුලි 29 දින ආචාර්ය පි.දයාරත්න විසින් හැඹිලිදැල් ධීවර කර්මාන්තය අධ්‍යයනය කිරීම හා සම්පත් ලබා ගැනීමේ මට්ටම " යන මැයෙන් ගුවන් විදුලි වැඩ සටහනක් පවත්වනු ලැබීය.

6.2.2 පොකිරිස්සන් සම්පත් කළමනාකරණය යන මැයෙන් ගුවන් විදුලි වැඩසටහනක් ආචාර්ය පි.දයාරත්න විසින් 1990 ජුනි 24දින පවත්වන ලදී. මෙය බෙංගාල බොක්ක වැඩ සටහන යටතේය.

6.2.3 1990 අගෝස්තු 02 දින, ගුවන්විදුලි ප්‍රවෘත්ති ප්‍රකාශයක් මගින් කෙලවල්ලා මත්ස්‍යයාගේ සටහන් කැබලි එල්ලා හැරීම නැවත ඒවා ලබා ගැනීම හා ඒ සඳහා ත්‍යාග පිරිනැමීම පිළිබඳ ප්‍රචාරයක් කෙරිණ.

### 6.3. පුවත්පත් ලිපි.

නාරා ආයතනය විසින් පළ කරන ලද විද්‍යුසර සඟරාවේ 13 වැනි කාණ්ඩයේ 3 කලාපය මගින් ආචාර්ය පි.දයාරත්න විසින් පිළියෙල කරන ලද " අපගේ මුහුදෙන් වටිනා ජීවී සම්පත්" යන සිරස්තලය යටතේ ලිපියක් පළවිය.

අ.ක.
ආචාර්ය පි.දයාරත්න.
අධ්‍යක්ෂ - මුහුදු ජීව විද්‍යා අංශය.

## කොරල් පර පර්යේෂණ වැඩ සටහන 1990.

### වාර්ෂික වාර්තාව.

අංශය: කොරල්පර පර්යේෂණ වැඩසටහන

ව්‍යාපෘති සේවකපිරිස- අර්ජන් රාජසූරිය (ප්‍රධාන නිලධාරී)
රමණි ප්‍රනාන්දු (පර්යේෂණ නිලධාරී)
ලක්ෂ්මන් ගිහිගේ ( කිමිදුම්කරු/තාක්ෂණිකයා)
ලක්සිරි කරුණාරත්න ( කිමිදුම්කරු/තාක්ෂණික)

සේවක පිරිස් බඳවාගැනීම- පර්යේෂණ නිලධාරීන් 01
කිමිදුම්කරු /තාක්ෂණික 01

උපකරණ - නාරෙක් ආධාර ලත් මුහුදු විද්‍යා වැඩසටහන යටතේ පහත සඳහන් උපකරණ ලබාදෙන ලදී.

| | |
|---|---|
| ෆයිබර් ග්ලාස් බෝට්ටු | 01 |
| පිටත සවිකරන මෝටර් සහිත බෝට්ටු | 02 |
| ස්කූබා ටැංකි | 04 |
| රෙගියුලේටර් | 04 |
| බෝයන්සි කොම්පෙන්සේටර්ස් ( Boyancy Compensators ) | 02 |

**ක්‍රියා කටයුතු.**

කප්පරතොට, උණවටුන, කොළඹ, තලවිල, කන්දකුලිය, සහ බාර් රීෆ් යන ස්ථාන වල කොරල්පර තක්සේරු කිරීමේ වැඩකටයුතු කරන ලදී. මෙම පරීක්ෂණ වලින් බලාපොරොත්තුවූයේ ඒවායෙහි තත්ත්වය, ඒවා විවිධ වර්ගවලින් සැදුම් ලත් ආකාරය, අනුක්‍රමනය වීමක් ඇතොත් එසේ වීම, හා මිනිස් ක්‍රියාකාරකම් වලින් සිදුවන පල විපාක යනාදිය සොයා නිශ්චයනය කිරීමය. මෙම අධ්‍යයන යන් පණ ඇති කොරල්පර ආවරණය හා සැදියාව නිශ්චය කිරීමට හැකිවන ලෙස් අනුච්ඡේද ක්‍රමයට කරන ලදී. ඒ එක් එක් අනුච්ඡේදයක දී නියමිත කාලසීමාවක් තුල මුහුදු පඳුවන් හා මසුන් වර්ග ද වාර්තා කරනු ලැබීය. කොරල් පරවල වැඩීම නිශ්චයනය කිරීම පිණිස ඉහලට නෙරා ඇති පරවල එනම් ( Acropora )පරවල ශාඛා බොහොමයක්ම ඇලිසොරින්( Alizorin ) ආලේප කරන ලදී. සය මසක් ගතවූ පසු කප්පරතොට ඇති එම පරවල ශාඛා නැවත ලබාගනු ඇත. පුරතල් මසුන් අල්ලන්නන් විසින් මොක්සි ( Moxy ) දැල් භාවිතා කිරීම හේතුවෙන් ගල්පර කැඩී බිඳී යා හැකි බැවින් එම පර ශාඛ නිතිපතා පරීක්ෂා කරනු ලැබේ. මෙම ස්ථානයේ දැනට කොරල්පර බොහොමයක් කැඩී බිඳී ගොස් තිබේ.

11 ......

අපනයනය කිරීම සඳහා තෝරාගත් ස්ථාන කිහිපයකින් ජීවී ඓන්ද්‍රිකයන් පිළිබඳ තොරතුරු රැස්කරන ලදී. ජාතික ජල ශාස්ත්‍රීය කාර්යාලයේ ද ආධාරය ඇතිව කප්පරතොට වෙරළාසන්නව ඇති කොරල්පරවල සිතියම් අඳින ලදී.

සරෙක් ආයතනය විසින් මුදල් යොදවා ඇති මුහුදු විද්‍යා වැඩසටහන ජූනි මාසයේ දී ආරම්භ කරනු ලැබුවේ නිලධාරීන් දෙදෙනෙකු බඳවා ගැනීමෙන් අනතුරුවයි. ඒ රාජ්‍යසූරිය මහතා විසින් මෙම නිලධාරීන් දෙදෙනා පුහුණු කරනු ලබයි. කොරල්පර වර්ගීකරණය හා පර නයාසේරුකම පුහුණුවට අදාල විෂයයන්ය. ජාතික කෞතුකාගාරලේ ලිපි ලේඛණ ඇශු කොටගෙන කොරල් පර මසුන් හා ඒ සම්බන්ධ සත්ත්ව වර්ග ද ගල්මාල් ගොමු පිළිබඳව ද සමීක්ෂණයක් මෙහෙයවන ලදී. බාර් රීෆ් ප්‍රදේශයේ සවිස්තරාත්මක සමීක්ෂණයක් 1990 නොවැම්බර් මස දී ආරම්භ කරන ලදී. බාර් රීෆ් සමීක්ෂණයේ දී සාරෙක් ආයතනය පර්යේෂණ නිලධාරීන් කණ්ඩායමක් ද පසුගිය නොවැම්බර්/දෙසැම්බර් යේ දී ඊට සහභාගී කරවූහ. හාරා හි ජාතික ආගු රැස්කිරීම් යාවත්කාලීන කිරීම පිණිස කොරල්පර ආදර්ශ රැස්කරන ලදී. ශ්‍රී ලංකාවට අලුත් යැයි කිව හැකි කොරල් රාශියක් හඳුනාගෙන ඇත.
වැලිගම පිහිටුවා ඇති මසුන් සමුහන උපකරණ ඇදිය සවිකිරීම සම්බන්ධයෙන් ද මෙම සාරෙක් නියෝජිත කණ්ඩායම විසින් සහයෝගය දක්වන ලදී.

රැස්වීම්වලට හා සම්මන්ත්‍රණවලට සහභාගීවීම.

දකුණු දිග වෙරළේ සංචාරක ව්‍යාපාරය සංවර්ධනය සැලසුම් කිරීම පිළිබඳ ගාල්ලේ නගර ශාලාවේ පැවැති රැස්වීමකට සහභාගී විය.

හික්කඩුව මුහුදු අභය භූමියේ අපවිත්‍ර වීමේ කරුණු සම්බන්ධ ලංකා සංචාරක මංඩලය විසින් සංවිධානය කරන ලද හික්කඩුවේ හෝටෙල් සුපර් කොරල්ස් හි දී පවත්වන ලද රැස්වීමට සහභාගී විය.

අන්තර් ජාතික සංවර්ධනය සඳහා වූ ඇමෙරිකා එක්සත් ජනපද ඒජන්සිය විසින් මුදල් යොදවනු ලබන මුහුදු අභය භූමි පිළිබඳව වූ පාරිසරික අමාත්‍යාංශයේ පැවැති රැස්වීම් දෙකකට සහභාගී විය.

වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවත් මගින් සංවිධානය කරන ලද ගුරු පුහුණු වන්නන් සඳහා වූ සම්මන්ත්‍රණ දෙකකට ඒ. රාජ්‍යසූරිය මහතා දේශකයකු වශයෙන් සහභාගී විය.

ලංකා සංචාරක මණ්ඩලය විසින් සංවිධානය කරන ලද දකුණු දිග වෙරළ ප්‍රදේශ වල හෝටල් කළමනාකරුවන් සඳහා වූ සම්මන්ත්‍රණයක දේශකයකු වශයෙන් ඒ. රාජ්‍යසූරිය මහතා සහභාගී විය. ස්වීඩනයේ, මැල්මෝ නුවර සත්වේ දී මුහුදු ප්‍රදේශ ආරක්ෂා කිරීම යන මැයෙන් වූ සම්මන්ත්‍රණයකට ඒ රාජ්‍යසූරිය මහතා සහභාගීවීය. එදින රැස්වීමේ න්‍යාය පත්‍රයට ඇතුලත් කිරීම පිණිස ශ්‍රී ලංකාවේ කොරල්පර පිළිබඳ පත්‍රිකාවක් ද සකස් කොට ඉදිරිපත් කරනු ලැබීය.

බාර් රීෆ් පිළිබඳ වාර්තාව වන සත්ත්ව ආරක්ෂක දෙපාර්තමේන්තුව හා පාරිසරික අමාත්‍යාංශයට ද ඉදිරිපත් කරන ලදී.

" ප්‍රොටෙක් කොරල් රීෆ්, අ නැෂනල් හෙරිටේජ් " යන හිසින් යුතු පෝස්ටරයක් නාරා යි ජාතික උරුම පෝස්ටර් කාණ්ඩ යටතේ මුද්‍රණය කරනු ලැබීය.

ඇ.ක.

ඒ. රාජසූරිය.

කොරල්පර පර්යේෂණ වැඩසටහන.

නා රා .

-- o --

<u>වාර්ෂික වාර්තාව. (ප්‍රගති)</u>

<u>ගොඩබිම ජලජ සම්පත් අංශය.</u>

1-අ. <u>ස්ථිර සේවක මණ්ඩලය.</u>

පර්යේෂණ නිලධාරීන්.

පී. ඇම්. ඒ. ජයසූරිය.
පී. පී. පී. ඇස්. ඇන්. සිරිවර්ධන
ජේ. ඇම්. පී. කේ. ජයසිංහ.
යූ. එස්. අමරසිංහ.
ඒ. ද අල්විස්.
ඇස්. සී. ජයමාන්න
ඇම්. ඩී. අමරසිංහ.
ඩබ්. ඇම්. ටී. බී. වන්නිනායක
ඇම්. ඇම්. කුරුප්පු.
රමේෂ් පෙරේරා.
ජේ. ද සිල්වා
ඩී. ඊ. එස්. ජයමහ
පී. කේ. ඇම්. විජේගුණවර්ධන
වී. පහළ වත්ත ආරච්චි
පී. ඒ. ජේ. සී. පෙරේරා ( සමාජ ආර්ථික)

13 .......

පර්යේෂණ සහකාර වරුන්.

ඩබ්.කේ.ටී.පෙරේරා ( කෞතුකාගාරය.)
කේ.ඒ.පෙරේරා
කේ.ඩී .රත්දුනු
එන්.එන්.ර. කුරේ
ඩබ්.ඒ.සුමනදාස (කල්පිටිය)
ඒ.ඇම්.එස්.පුෂ්පානන්ද
උදුල ප්‍රනාන්දු (කල්පිටිය)

රසායනාගාර සහකරුවන්.

පී.ජී.ගුණසිංහ
ඒ.ඇම්.ජේ.කොස්තා
පී.ඒ.එච්.කීර්තිරත්න
පිලිප් පෙරේරා
ඩබ්.පී.ජයරත්න

යතුරු ලේඛක.

කේ.ඒ.ඩී.එස්.සී.රත්නායක

කම්කරුවන්.

බී.එල්.දයාරත්න
එස්.නවරත්න

ආ. අන්යම් සේවක පිරිස්.

පර්යේෂණ නිලධාරීන්.

එච්.එම්.ඝාලිත කිත්සිරි ( බෙල්ලන් වගාව්‍යාපෘතිය.)

පර්යේෂණ සහකාරවරුන්.

වසන්ත බණ්ඩාර ( මුහුදු පැලෑටි ව්‍යාපෘතිය)
ඇන්ඩෲ සැටතියස් එම -
පැරකුම් විජේසුන්දර

රසායනාගාර සහකරුවන්.

ජී.ඒ.ඒ.රත්නායක

කම්කරුවන්.

එච්.ඒ.ඩොනල්ඩ්
කපිල ජයසේන
එස්.එම්.ලෝරන්ස්

ඇ. කෙත්‍රාත් පදනමමත සේවය කරන පිරිස.

පර්යේෂණ නිලධාරීන්.

පී.වී.එල්.ඩී.පිත්තගොඩ ( යුඑන්ඩීපී ව්‍යාපෘතිය)
ඒ.බී.ඒ.කේ. ගුණරත්න ( සාරෙක් ව්‍යාපෘතිය)

පර්යේෂණ සහකාරවරුන්.

එම්.එස්.ප්‍රනාන්දු (ඊඩීඩී/එන්ඩීඩී)

සැලසුම්කරු.

ලලිත ආදිපොල

2. බඳවා ගැනීම්.

වී.පහළවත්තආරච්චි මෙනෙවිය ස්ථිර පර්යේෂණ නිලධාරිනියක වශයෙන් බඳවා ගනු ලැබූවාය. අංශයේ ස්ථිර යතුරු ලේඛිකාවක් වශයෙන් කේ.ඒ.ඩී.සී.රත්නායක මහත්මිය බඳවා ගනු ලැබූවාය. පී.ඒ.ජේ.සී.පෙරේරා මෙනෙවිය පර්යේෂණ නිලධාරී (සමාජ ආර්ථික) වශයෙන් බඳවා ගනු ලැබූවාය.

3. ඉල්ලා අස්වීම්.

පර්යේෂණ නිලධාරීන් තුන් දෙනෙකු එනම් ඒ.ද අල්විස් මහත්මිය, රමේෂ් පෙරේරා මහතා සහ ඩී.ඊ.එස්.ජයමහ මහතාත් මෙම වසර තුළදී ඉල්ලා අස්වූහ.

4. ස්ථාන මාරුවීම්.

ජනක ද ,සිල්වා ( පර්යේෂණ නිලධාරී), මුහුදු ජීව විද්‍යාත්මක අංශයට ද ඒ.ඇම්.ජේ.කොස්තා මහතා මුදල් අංශයට ද ස්ථාන මාරුවීම් ලදහ.

5. පශ්චාත් උපාධි අධ්‍යයන.

පී.එම්.ඒ. ජයසූරිය මහත්මිය,පී.පී.ජී.එස්.එන්.සිරිවර්ධන මහතා, ඩබ්.එම්.ටී.බී.වන්නිනායක සහ එම්.ඩී.අමරසිංහ මහත්මිය යන පර්යේෂණ නිලධාරීහු පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු සඳහා විදේශ ගත වූහ.

6. උසස්වීම්.

පී.පී.ජී.එස්.එන්.සිරිවර්ධන මහතා I ශ්‍රේණියට ද, පී.එම්.ඒ.ජයසූරිය මහත්මිය සහ ඩබ්.එම්.ට.බී.වන්නිනායක මහතා II ශ්‍රේණියට ද,එස්.සී.ජයමාන්න මහත්මිය III ශ්‍රේණියට ද, ඩී.පිත්තගොඩ යන කෙත්‍රාත් පදනම මත පර්යේෂණ නිලධාරී හැටිය ට ද උසස්වීම් ලදහ.

## 7. විශේෂ පුහුණුව , සම්මන්ත්‍රණ , වැඩමුළු.

1. "කල්චර් ඇන්ඩ් ප්‍රොසසිං එජ් යි විඩ්ස් " නම් පාඨමාලාව හැදෑරීම සඳහා පී.ඇම්.ඒ.ජයසූරිය මහතා චීනයට යන ලදි.

2. කොරියාවේ ඇබලෝන් වගාව පිළිබඳ පුහුණු පාඨමාලාවකට ඩබ්.ඇම්.ටී.බී.වන්නිනායක මහතා සහභාගී විය.

3. ඉන්දියාවේ පැවැති වැඩ මුළුවකට පී.පී.පී.එස්.එන් සිරිවර්ධන මහතා සහභාගී විය.

4. 1990 වර්ෂය තුළ පහත සඳහන් පුහුණු කටයුතු සහ වැඩ මුළු සඳහා යූ.එස්.අමරසිංහ මහතා සහභාගී විය.

   අ. (එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩ සටහන මගින් මුදල් යෙදවූ) පිලිපීනයේ මැනිලා නුවර ඉක්ලාම්හි 1990 පෙබරවාරි 11 සිට මාර්තු 09 දින තෙක් පැවැති තොග සක්සේරුව පිළිබඳ පුද්ගල පාඨමාලාව.

   ආ. (ආසියානු ධීවර සංගමයෙන් මුදල් යෙදවූ) සිංගප්පූරුවේ ජාතික විශ්ව විද්‍යාලයේ දී 1990 අගෝස්තු මස 20 දින සිට සැප්තැම්බර් මස 03 දින දක්වා මහාචාර්ය ඇස්.ඇස්.ද ඩිල්වා ගේ උපදෙස් සේවා ලබා ස්වකීය ආචාර්ය උපාධිය අවසන් කිරීම සඳහා වූ ප්‍රවාදය සැකසීම.

   ඇ. ආසියාවේ ජලාශ ධීවර කළමනාකරණයෙහි දියුණුව යන මැයෙන් චීනයේ හැන්සෝන් නුවර 1990 ඔක්තෝබර් 15 - 19 දින දක්වා පැවැති වැඩ මුළුවට.

## 8. දේශීය පුහුණු.

තාරාහි මාසයක් පුරා ඇවැති සුරතල් මසුන් බෝකිරීම හා නඩත්තුව පිළිබඳ පුහුණු පාඨමාලාවකට අංශයේ පහත සඳහන් සේවක පිරිස් සහභාගී වූහ.

ඩබ්.ඇම්.කුරුප්පු සහ එය්.සී.ජයමාන්න යන මහත්මීහු.
ඩී.පින්නගොඩ, කේ.පෙරේරා, ආර්.පී.කේ.තිස්ස, ඇන්.ඇන්.ඊ.කුරේ, ඇම්.ඇස්. ප්‍රනාන්දු සහ පී.පී. ගුණසිංහ යන මහත්වරු.

1990.08.30 සිට 1990.09.01 දින දක්වා පිළියන්දල සුබෝධා හි පැවැති ධීවර ව්‍යාප්තිය පිළිබඳ වැඩ මුළුවකට පී.පී.පී.එස්.එන්. සිරිවර්ධන මහතා සහභාගී විය.

## 9. කෙරෙමින් පවතින ව්‍යාපෘති.

### 1. ආටේමියා ව්‍යාපෘතිය – එම්.එම්.කුරුප්පු.

(I) මඩ පොකුණුවල ආටේමියා වගා කිරීමේ ශක්‍යතාවය අධ්‍යයනය කිරීම සඳහා වගා අත්හදා බැලීමක් වශයෙන් පලාවිහි පිහිටි ලුණු ලේවායන්වල පරීක්ෂණ පොකුණු හතරක දේශීය ආටේමියා වික්‍රියා යොදා ආමුඛලනය කරන ලදී. ලවණතාවය අංශක 130 ක් පමණ වැඩිවූ පසු වැඩිහිටි ආටේමියාවන් විසින් කෝෂ්ඨ නිපදවන ලදී. එම කෝෂ්ඨ රැස්කොට විශ්ලේෂණය කරන ලදුව රැක්කවීමේ සුදුසු කම හා පෝෂ්‍යදායක අගයන් සොයා බලන ලදී. ඒ අනුව ඉතා හොඳ එනම් 95 % රැක්කවීමේ හැකියාවක් සහ අතිශය ඉහල පෝෂ්‍ය දායක අගයක් ඒවායෙහි තිබෙන බව හෙළිදරව් වී ඇත. වියලි සමයේ දී ලවණතාවය වැඩි වූ පසු ගහණතාවය අඩුවී ගොස් තිබිණ. වැසි ආරම්භවීමත් සමගම නැවත බෝවීම සීඝ්‍රයෙන් වැඩි වනු දක්නා ලදී.

(II) හම්බන්තොට ලුණු ලේවායන්වලට යාමෙන් පෙනී ඇති කරුණක් නම් ලවණ පොකුණු නිතිපතා වාරිමාර්ගකරණය කළ බැවින් ඒවායෙහි ගහණතාවය ක්‍රමයෙන් වැඩිවන බවයි. දකුණේ පැවැති නොසන්සුන්තාවය හේතුකොට ගෙන ආටේමියා ගහණතාවය බහුල ලෙස අඩුවී ගොස් තිබිණ. 1991 ලුණු නිශ්පාදන කාල සීමාව තුළ කෝෂ්ඨවල යහපත් නිශ්පාදනයක් බලාපොරොත්තු විය හැකිය.

### 2. මුහුදු පැලෑටි වගා ව්‍යාපෘතිය – ඒ.ජයසූරිය මහත්මිය වෙනුවෙන් එම්.එම්.කුරුප්පු විසිනි.

(I) ස්වාභාවික ග්ලැසිලේරියා තට්ටු තිබේ දැයි සොයා බැලීමට පුත්තලම් කලපුවේ සතිපතා සමීක්ෂණ කටයුතු මෙහෙයවනු ලැබීය. අප්‍රේල් සිට ජූනි දක්වා කාලය තුල ස්වාභාවික ග්ලැසිලේරියා තට්ටු සොයා ගැනීමට නොහැකි විණි.

(II) පුත්තලම් කලපුවේ සති දෙකකට වරක් කළ සමීක්ෂණ වලදී හයිඩ්‍රජන් අයන් සාන්ද්‍රණය, ලවණතා උෂ්ණත්වය දියර ඔක්සිජනය හා පෝෂකයන් යන ජල තත්ත්ව පරාමිති නිශ්චයනය කර ඇත.

(III) බීජාණු ලබා ගැනීමේ මාතෘ පැලෑටි ලබාගත නොහැකිවූයෙන් යෝජිත පරිදි බීජාණු තැන්පත් කිරීමේ තාක්ෂණික කටයුතු නිම කිරීමට නො හැකි විය.

(IV) වගාකරන ලද ග්ලැසිලේරියා පැලෑටිවල දිග මැනීමේ කටයුතු දෙසතියකට වරක් මෙහෙයවනු ලැබීය.

(v) ශ්‍රී ලංකාවේ මුහුදු පැලෑටි කටයුතු පිළිබඳ ව්‍යාපෘති යෝජනාවක් පිළියෙල කොට ලිවර්පූල් විශ්ව විද්‍යාලයේ ආචාර්ය උපාධිය හදාරමින් සිටින ඒ. ජයසූරිය මහත්මිය වෙත පිටත් කර හරිනු ලැබීය.

(vi) ග්ලැසිලේරියා වගාවේ වෘක්ෂලතා වැඩීම සඳහා කොටු දෙකක් තැන්පත් කරනු ලැබීය.

(vii) ශ්‍රී ලංකාවේ මුහුදු පැලෑටි වගාව හා භාවිතය යන මැයෙන් මුහුදු පැලෑටි පිළිබඳ දේශ පත්‍රිකාවක් ප්‍රාදේශීය සමුළුවක් සඳහා සකස් කරන ලදී.

3. <u>මයික්‍රෝබියල් ව්‍යාපෘතිය</u> - ( එස්. සී. ජයමාන්න, වී. පහලවත්ත ආරච්චි සහ ඒ. බී. ඒ. කේ. ගුණරත්න )

මෙම ව්‍යාපෘතිය දෙසැම්බර් මස දී ආරම්භ වූ අතර ඒ සඳහා මුදල් යොදවනු ලබන්නේ උතුරු තැගෙනහිර පළාත් සභාව විසිනි. ඉස්සන් වගාව සඳහා ලබාගත හැකිව ඇති රජයේ ඉඩම් ප්‍රමාණය හා උතුරු නැගෙනහිර පළාතේ දැනට ඇති ටැංකි ප්‍රමාණය හා ඒවා දැනට කුමක් සඳහා භාවිතා වන්නේ ද යනු සොයාබැලීම සඳහා මූලික පරීක්ෂණයක් කරන ලදී.

4. <u>කකුළුවන් ධීවර ව්‍යාපෘතිය</u> - එස්. සී. ජයමාන්න

මීගමුව හා හලාවත කලපුවල මඩ කකුළුවන් ධීවර කර්මාන්තයේ තත්ත්ව අධ්‍යයනයක් සඳහා මෙම කලපුවල අල්ලා ගත් කකුළුවන් පිළිබඳ සංඛ්‍යා ලේඛණයන් රැස්කරන ලදී.

I. කකුළු ධීවර කර්මාන්තයේ යෙදී සිටින ධීවරයින් ගණන, ඒ සඳහා ගත කරනු ලබන කාලය, අල්ලා ගත් මසුන් ප්‍රමාණය ආදිය වාර්තා කරන ලදී.

II. මාසික නිශ්පාදනය හා ඒකක ප්‍රයත්නයක දී අල්ලා ගත් ප්‍රමාණය බැලීම සඳහා දත්ත විශ්ලේෂණය කරන ලදී.

III. මීගමු කලපුවෙන් අල්ලා ගත් කකුළුවන් ප්‍රමාණය හලාවත කලපුවෙන් ලබාගත් කකුළුවන් ප්‍රමාණයට වඩා වැඩිබව සමීක්ෂණයෙන් හෙළිවිය.

IV. මීගමු කලපුවෙන් ලබාගත් වැඩිම නිශ්පාදනය නොවැම්බර් මාසයේ වූ අතර හලාවත කලපුවෙන් අඩුවෙන්ම කකුළුවන් ලැබුණේ එම මාසයේ දීය.

18 ....

5. ඒඩීබී/එන්ඩීබී/නාරා ව්‍යාපෘතිය – එම්.එම්.කුරුප්පු විසින් ජේ.ඇම්.පී.කේ. ජයසිංහ හා වී.ප. වත්තආරච්චි සඳහා සකස් කරන ලදී.

2 වන අදියර – ශ්‍රී ලංකාවේ දකුණු දිග වෙරළ තීරුවේ ඉස්සන් සඳහා ස්ථාන හඳුනා ගැනීම.

3 වන අදියර – මුහුදුල් සහ ගලාවන විවිධ ඉස්සන් ගොවිපල පහක අපද්‍රව්‍ය අධීක්ෂණය.

ඒඩීබී/එන්ඩීබී/නාරා ඉස්සන් ගොවිපල ස්ථාන සමීක්ෂණයේ 2 වැනි අදියර 1990 ජූලි මාසයේ දී අවසන් කෙරුණු අතර එම වාර්තා වල පිටපත් අදාල ආයතන වෙත ඉදිරිපත් කරනු ලැබීය. ව්‍යාපෘතියේ 3 වන අදියර ලෙස 1980 අගෝස්තු මාසයේ දී අපද්‍රව්‍ය අධීක්ෂණ ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී. 1990 අගෝස්තු සිට අපද්‍රව්‍ය අධීක්ෂණ සඳහා ජල නියැදි ලබා ගැනීම කරන ලදී.

අපවිත්‍ර ද්‍රව්‍ය නියැදි එමෙන්ම ඇතුලට ගලා එන ජලය නියැදි ද විශ්ලේෂණය කොට හයිඩ්‍රජන් අයන් සාන්ද්‍රණය, ලවණතාවය, ආම්ලිකතාවය, $No^{3-}$, $No_2^-$, $Po_4^{-3}$ සහ $D_o$ අගයන් ලබා ගන්නා ලදී. පිටවෙන අපවිත්‍ර ද්‍රව්‍ය සනත්ත්වය ද, පෝෂක ධාරකය ලබා ගැනීම සඳහා වාර්තාගත කරන ලදී.

ප්‍රතිඵල වගුගතකොට තබා දත්ත විශ්ලේෂණය සඳහා සකස් කරන ලදී.

6. මීගමු කලපුවේ කුණුරොඩු නිශ්පාදනය, කොළරොඩු දිරාපත්වීම සහ කඩොලාන ප්‍රජාවගේ ඒ ආශ්‍රිත වෙනත් සත්ත්ව ගහණයන් –( එම්.බී.අමරසිංහ හා වී.පහලවත්ත ආරච්චි. )

මෙම ව්‍යාපෘතියෙන් අපේක්ෂාකෙරන දීර්ඝ කාලීන පරමාර්ථ නම් වෙරළබඩ ඝනිදායක ආහාර රඳන දැල් වලට චෛන්ද්‍රික ද්‍රව්‍ය ප්‍රභවයන් ලෙස මෙම කඩිතිවල පරිසර විද්‍යාත්මක අගයන් ඉස්මතුකර දැක්වීම හා එමගින් ඒවා යෙහි විමර්ශණ කළමනාකරණය ශක්තිමත් කරවීමත්ය.

තෝරාගත් පිහිටීම් නම් මුත්තක්කර සහ කඩොල්කැලේ ඇති කඩොලාන ස්ථාම- යත්ය . මෙම පිහිටීම් වලින් අනුච්ඡේදයන් තුනක් තෝරාගෙන තිබේ. සතියකට දෙවරක් බැගින් කුණුරොඩු එකතු කිරීම සඳහා රොඩු රඳවා ගැනීමේ බාධක 46 ක් අටවා තබන ලදී. වාරකාල දෙකක දී කුණුරොඩු දිරාපත්වීම පිළිබඳ අධ්‍යයනයන් මෙහෙයවන ලදී.

මෙහි පළමු අත්හදා බැලීම 1990 ජූනි මස වියලි සමයේ දී කරන ලදී. වැසි සමයේ දී දිරාපත්වීමේ වේගය නිශ්චයනය කරනු වස් මෙවැනිම අත් හදා බැලීමක් 1990 නොවැම්බර් මස දී කරන ලදී. මෙම කර්තව්‍යය තවමත් කෙරෙමින් පවතී. ඒ එක් එක් වාරයක දී පිටාර ගලන ජලයෙහි පෝෂක අගයන් ( $No_{3-}$ , $No^2$ , $PO_4^{-3}$ ) ලබා ගන්නා ලදී.

<u>ක්ෂුද්‍ර ජීව විද්‍යාත්මක අධ්‍යයනයන් හා දිරාපත් වීම පිළිබඳ අධ්‍යයන.</u>

මුත්තක්කර ඇති කඩොලාන ස්ථානයන් මත හැලෙන ඉහළම කොළ ප්‍රමාණයක් මැයි සිට ජූලි මාසවල දී එනම් සාපේක්ෂක වශයෙන් වියළි සමයේ දී දක්නට ලැබිණ. අඩුම කොළ ප්‍රමාණයක් හැලෙන කාලය ඔක්තෝබර් සිට දෙසැම්බර් දක්වාය.
වියළි කාලයේ දී කොළ දිරාපත් වීමේ වේගය ඉතා මඳ බැව් පෙනිණ. වියළි කාලයේ දී දිරාපත් වූ දිලීර කොටස් හැකිත් තැන රැඳී ඇති අතර ගොඩ ගැසුණු ඒවා හඳුනා ගැනීම සඳහා සකස් කර ඇත.

7. <u>කොට්ටු දැල් ව්‍යාපෘතිය</u> - පී.ඒ.ජේ.සී. පෙරේරා.

ව්‍යාපෘතිය 1990 නොවැම්බර් මස දී ආරම්භ කරන ලදී. සතියකට වරක් ස්ථානවලට යන ලද අතර තෝරා ගත් කොටුදැල් ධීවර කාර්මික යන් අතර කලින් සකස් කරන ලද ප්‍රශ්නාවලී බෙදා හරින ලදී. මූලධනය හා අල්ලාගත් මසුන් ප්‍රමාණය නිශ්චයනය සඳහා ය ඒ.

8. <u>ජලාශ ධීවර කළමනාකරණය ව්‍යාපෘතිය</u> - යූ.එස්.අමරසිංහ.

කවුඩුල්ල, මින්නේරිය, මාදුරුඔය, පරාක්‍රම සමුද්‍රය යන පිඹුරත්තෑව ජලාශ වල Oreochromis Mossambicus සහ Oreochromis Niloticus යන මසුන් දෙවර්ගයෙහි ප්‍රති නිශ්පාදන ජීව විද්‍යාව අධ්‍යයනය කරන ලදී. මෙසේ කරන ලද්දේ මෙම සික්ලිඩ මයුන් දෙවර්ගය අතර ඔවුන්ගේ ප්‍රති නිශ්පාදන සම්භාව්‍යතාවය මත දෙමුහුම් කිරීමේ අන්තර් ප්‍රගති ස්ව රූපය පරීක්ෂා කරනු වස්ය.

<u>දත්ත විශ්ලේෂණය.</u>

අල්ලාගනු ලැබූ මසුන් සහ ප්‍රයත්න දත්ත ද, Oreochromis Mossambicus හා Oreochromis Niloticus යන සික්ලිඩ දෙවර්ගයෙහි දිගු සංඛ්‍යාතය හා සමාජ ආර්ථික තොරතුරු ද උපයෝගී කොට ගෙන කවුඩුල්ල හා මින්නේරිය ජලාශවල ධීවර කර්මාන්තය කළමනාකරණය සඳහා ආදර්ශ සංවර්ධනය කරන ලදී.

9. සාරෙක් ව්‍යාපෘතිය -(එස්.සී.ජයමාන්න, පී.විජේගුණවර්ධන, ඩී.පින්නගොඩ හා ඒ.බී.ඒ.කේ. ගුණරත්න. )

මෙම ව්‍යාපෘතිය යටතේ ව්‍යාපෘති පහක ක්‍රියා කාරිත්ව කටයුතු ආරම්භ කර ඇත. වරල් මසුන් කර්මාන්තය අධ්‍යයනය, ඉස්සන් ධීවර කර්මාන්තය සංවර්ධනය, ස්වාභාවික තොග ආශ්‍රිතව ඉස්සන් ධීවර කර්මාන්තය සංවර්ධනය, මඩ තලාවල පතුලේ සත්ත්වයන්, කඩොලාන හා ඉහළ

ලවණතාවයත් මත තුණිස්සත් වගාකිරිම අගැයීම යන ඒවා රට අයත්ය. ජුනි මාසයේ ව්‍යාපෘතිය ආරම්භ වුවාට පසු එක් එක් අධ්‍යයනය සඳහා මුන්දල් වැව අවට හා ඇතුළත තියැඩි මධ්‍යස්ථාන සහ මුන්දල් වැව අවට ඉස්සන් ගොවිපල වල් ද තෝරා ගනු ලැබීය. කලපුවේ වරල් මසුන් ධීවර කර්මාන්තය භෞත රසායනික පරාමිති, උදම් තලාවල පතුලේ සත්ත්වයින් ආදිය පිළිබඳ දත්ත ලබා ගන්නා ලදි. කඩොලාන වෘක්ෂ ලතාදියෙහි ඇති එවැනි සත්ත්ව වර්ග රැස්කරන ලද අතර ජල තත්ත්වය පිළිබඳ පරාමිති ද වාර්තා ගත කොට විශ්ලේෂණය කරන ලදි. ඔක්තෝම්බර් මාසයේ දී වැසි සමය උදාවත්ම මසුන් ඇල්ලීම සැලකිය යුතු අන්දමකින් ඉහළ ගොස් ඇති බව පෙනී යන ලදි. සාරෙක් උපදේශක ආචාර්ය ජකොබ්සන් ද සමග උදම් තලාවල අවට වාසය කරන කුරුල්ලන් ද දක්නා ලදි. පතුලේ සත්ත්ව වර්ග වැඩි වීමත් සමග කුරුල්ලන්ගේ සංඛ්‍යාව ද සමානව වැඩිවී තිබෙනු දක්නා ලදි. කඩොලාන වෘක්ෂලතා වල පතුලේ සත්ත්ව ප්‍රජාවට ගැස්ට්‍රොපොඩ්ස් ( Gastropods ) හෙවත් උල් ගොළු බෙල්ලන් අරක් ගෙන සිටි අතර නියැඩි සමයේ දී වෙනත් සතුන් වර්ග නොදක්නා ලදි.

10. <u>බෙල්ලන් වගා ව්‍යාපෘතිය</u> - එම්.එම්.කුරුප්පු විසින් එච්.එම්.ටී.බී.වන්නි-නායක සහ ජී. කිත්සිරි වෙනුවෙනි.

තිබෙන බෙල්ලන් වර්ග -- Oysters - කාටියන්
Clams - මට්ටියන්
Cockle - හැඹිලියන්
Mussels - බෙල්ලන්.

කාවාටියා - කොන්ක්‍රීට් කඳන්වල කාවාටියන් වැඩීම අධ්‍යයනය.

කලාඔය ප්‍රදේශයේ කාවාටි පැටවුන් රැස්කිරීමේ වැඩ සටහනක් ක්‍රියාත්මක කරන ලදි. කාවාටි පැටවුන් හැළෙන කාල සීමාව සහ පැටවුන් හැලීමේ සාධක නිශ්චයනය කිරීම සඳහා කලාඔය ප්‍රදේශයේ පරීක්ෂණ සිදු කෙරිණ. රසායනික, ජීව විද්‍යාත්මක හා භෞතික කරුණු ද අධීක්ෂණය කරන ලදි.

පුත්තලම් කලපුවේ බෙල්ලන් වගාව පිණිස පැල කරන ලදි.

දුඹුරු බෙල්ලන් ( Perna Perna ) සහ කොළපාට බෙල්ලන් ( Perna viridis ) පැල කිරීම පිණිස පුත්තලම් කලපුවේ පහුරු පහක් ඉදිකරන ලදි.

1990 වසර තුළ පහත සඳහන් වැඩ සටහනට අනුව කටයුතු කරනු ලැබීය.

1. පළතුරු කඩා වල කොළපාට බෙල්ලන් වැඩීමේ අධ්‍යයනය.
2. අපිරිසිදු හා පිරිසිදු කොළපාට බෙල්ලන්ගේ වැඩීම අධ්‍යයනය.
3. දුඹුරු පාට බෙල්ලන් පිළිබඳ තත්ත්ව සුචිකයක්.

අධ්‍යයන කාල සීමාව තුල අදාල භෞතික, රසායනික හා ජීව විද්‍යාත්මක කරුණු නිශ්චයනය කරන ලදි.

මට්ටියන් සහ හැඹිලියන්.

පුත්තලම් කලපුවේ මට්ටියන් හා හැඹිලියන් විසිරී ගොස් ඇති ආකාරය අධ්‍යයනය . තෝරාගත් ස්ථාන තුනක තියැදි කටයුතු කරන ලදි.

ප්‍රකාශන.

1. රුහුණු විශ්ව විද්‍යාලයේ ආචාර්ය උපාධියක් සඳහා ප්‍රවාදයක් ( පිටු 237) " ශ්‍රී ලංකාවේ මිනිසා විසින් තනන ලද වැව් දෙකක ධීවර කර්මාන්තය සහ කළමනාකරණ ක්‍රමෝපායයන් " ( යූ.එස්.අමරසිංහ 1990)

2. සර්ම කලාපීය සහ නොගැඹුරු ජලාශවල විවිධ ධීවර ක්‍රමවල සාපේක්ෂ කාර්යක්ෂමතා අගැයීමක් සඳහා ප්‍රත්‍යක්ෂ මූලක ප්‍රවේශයක්. මෙය ශ්‍රී ලාංකිය උදාහරණ අධ්‍යයනයකි. ආසියාවේ ජලාශ ධීවර කළමනාකරණය දියුණුව හා සංවර්ධනය යන මැයෙන් 1990 ඔක්තෝබර් මස 15 - 19 දක්වා චීනයේ හැන්චව් නුවර පැවැති වැඩ මුළුවක වාර්තාවකි. ( යූ.එස්.අමරසිංහ සහ එස්.එස්.දසිල්වා)

3. ආසියානු රටවල් තුනක වැව් පොකුණු ජලාශවල ධීවර කර්මාන්තය පිළිබඳ සංසන්දනාත්මක තක්සේරුවක් - අල්ලාගත් මසුන් සහ ප්‍රයත්න සුත්‍ර මත පැකසුනකි. - ධීවර පර්යේෂණ- එස්.එස්.ද සිල්වා , ජේ.මොරෝ, යූ.එස්.අමරසිංහ, ටී.චුකාගෝරින් සහ ආර්.ඩී. ගුරේරෝ - (දැනට මුද්‍රණයේ)

4. ශ්‍රී ලංකාවේ ජලාශ දෙකක කරමල දැල් මගින් මසුන් ඇල්ලීමේ දී දැලෙහි පැටලී ආ Oreochromis Mossambicus හොග තක්සේරුවක්(සැකසෙමින් පවතී) යූ.එස්.අමරසිංහ සහ එස්.එස්. ද සිල්වා )

5. ශ්‍රී ලංකාවේ පුත්තලම් කලපුවේ සහ ඕලන්ද වරායෙහි කඩොලාන පරිසර පද්ධතිවල දළ මූලික නිශ්පාදන භාවය. කින්තියාවේ මොම්බාසා නුවර " කඩොලාන හා ඒ අවට පරිසර පද්ධති " යන මැයෙන් පැවැති හමුවේ වාර්තාවකි. - එම්.ඩී.අමරසිංහ සහ එස්.බාලසුබ්‍රමනියම් -(දැනට මුද්‍රණයේ)

6. වැඩීමේ ආහාරමය පෝෂ්‍ය පදාර්ථ මට්ටමේ ප්‍රතිඵල සහ ලැබියෝරොහි හෙවත් (Itam ) නම් කුඩා මාළු වර්ගයේ පැවැත්ම - ජේ.චන්ද්‍රසෝම සහ පි.පී.පී.එස්.එන්.සිරිවර්ධන.

7. ලැබියෝ ඩුපුමියත් හෙවත් ( valenciences ) මසුන්ගේ පෝෂ්‍ය පදාර්ථ අවශ්‍යතාවයන් - ජේ.චන්ද්‍රසෝම, පී.පී.පී.එස්.එන්.සිරිවර්ධන.

8. මැක්රෝබේචියම් රොයත්බර්ජි ( deman ) ගේ බාලකයින්ගේ හයිඩ්‍රජන් සල්ෆයිඩ් විෂ පිළිබඳ මූලික අධ්‍යයනයක් - - එස්.සී.ජයමාන්න, තරේසා සඟරාව සඳහා ඉදිරිපත්කරන ලදි.

9. මීගමු කලපුවේ මුතු බෙල්ලන් වගා කිරීමේ සම්භාව්‍යතාව - -එස්.සී.ජයමාන්න සහ ජේ.එම්.පී.කේ.ජයසිංහ, තරේසා සඟරාවට ඉදිරිපත් කරන ලදි.

10. ශ්‍රී ලංකාවේ වෙරළබඩ ප්‍රදේශවල දැනට ඉඩම් භාවිතා කිරීමේ රටාව කෙරෙහි ඉස්සන් වගාව සංවර්ධනය කිරීමෙන් ඇතිවන පල විපාක. පරිසර විද්‍යාව සහ ඉඩම් සකස් කිරීමේ කළමනාකරණය යන මැයෙන් කොළඹ පැවැති උසස් පෙළේ හමුවන වාර්තාවකි. -ජේ.එම්.පී.කේ. ජයසිංහ සහ ජේ.ඒ.ද සිල්වා, 1990.

11. ශ්‍රී ලංකාවේ කුඩා පරිමාණයේ ඉස්සන් වගා ..මේ තාක්ෂණය හා ආර්ථිකය - ආසියානු ධීවර සඟරාවට ඉදිරිපත් කරන ලද කෘතියකි. - ජේ.ඇම්.පී.කේ.ජයසිංහ සහ ජේ.ඒ.ද සිල්වා.

12. පුත්තලම සහ ගම්පහ දිස්ත්‍රික්කයේ ඉස්සන් වගා කිරීමේ සම්භාව්‍ය ප්‍රදේශ තක්සේරුවක් - ගොඩතර ධීවර සඟරාවට ඉදිරිපත් කරන ලද්දකි. - ජේ.ඇම්.පී.කේ .ජයසිංහ සහ ජේ.ඒ.ද සිල්වා.

13. ශ්‍රී ලංකාවේ බටහිර වෙරළ ප්‍රදේශවල ඉස්සන් වගා සංවර්ධනයේ සමාජයීය පල විපාක - තාරා සඟරාවට ඉදිරිපත් කරන ලද්දකි. - ජේ.ඇම්.පී.කේ.ජයසිංහ.

14. සුරතල් මසුන් කර්මාන්තය සංවර්ධනය - බිස්නස් ලංකා සඟරාව ජර්නල් වෙළුම 9 අංක.1- එම්.එම්.කුරුප්පු.

15. ශ්‍රී ලංකාවේ කලිස්සන් වගාව දැන් තත්ත්වය සහ අනාගත කමෝපායයන් ( මුද්‍රණයේ)-පී.පී.පී.එස්.එන්.සිරිවර්ධන,ඒ.ද සිල්වා සහ කේ.යූ.ධයස්.

16. බොල්ගොඩ වැවේ වාරකාල සහ භෞත රසායනික පරාමිතිවල දෛනික වෙනස් වීම් ( මුද්‍රණයේ) - පී.ප.පී.එස්.එන්. සිරිවර්ධන සහ ආර්.පී.කේ. තිස්ස

17. කොටුවල හා පොකුණුවල කිරි මසුන් (                )
පොඩි පැටවුන්ගේ වැඩීම හා පැවැත්ම ( මුද්‍රණයේ) -
පී.පී.ඊ.එස්.එන්. සිරිවර්ධන සහ ඒ. ද අල්විස්.

18. ශ්‍රී ලංකාවේ කොටුවල කිරි මසුන් වගාව - ආර්ථික කරුණු කිහිපයක්- ( මුද්‍රණයේ) පී.පී.ජී.එස්.එන්.සිරිවර්ධන.

වාර්තා.

1. ආරච්චි කට්ටුව උපදිසාපති කොට්ඨාශයේ මුට්ටුව වැඩ බිමේ ඉස්සන් ගොවිපොල පවත්වා ගැනීම පිළිබඳ තක්සේරුවක්.

2. පී.පී.කේ.කුමාර මහතාගේ යෝජිත ඉස්සන් ගොවිපොල අවට ඇති ලිං පිළිබඳ පරීක්ෂණ වාර්තාව.

3. ජලජ පතුලේ ජීවීන් ( කකුළුවන්) සහ උන්ගේ විශේෂත්වය පිළිබඳ වාර්තාව.

4. ඉස්සන් වගාව සඳහා වයිරන් කට්ටුව වැඩබිම පිළිබඳ තක්සේරුවක්.

5. ඉස්සන් වගාව සඳහා වයිරන් කට්ටුව වැඩබිම පිළිබඳ තක්සේරුවක්.

6. ඉස්සන් වගාව සඳහා පුත්තලම් පත්තු රජයේ උප දිසාපති කොට්ඨාශයේ සී.ස. ලංකා මේරි කල්චර්( පෞද්ගලික) සමාගමේ වැඩ බිම පිළිබඳ තක්සේරුවක්.

7. වඩතමුනෙහි විල්පත්තුවේ සී- ෆුඩ්ස් හි වැඩබිම සහ පුත්තලම් පත්තු උප දිසාපති කොට්ඨාශයේ අම්බලම් හි ඉස්සන් වගාව පිළිබඳ තක්සේරුවක් - ඒ.ඒ. ලතීෆ් මහතා .

8. ඉස්සන් වගාව සඳහා පුත්තලම් පත්තු උප දිසාපති කොට්ඨාශයේ ඕෂන් ෆුඩ්ස් සප්ලයර්ස් වැඩ බිමේ තක්සේරුවක්.

9. ඉස්සන් වගාව සඳහා පුත්තලම් පත්තු උප දිසාපති කොට්ඨාශයේ මන්ගලවැලි වැඩ බිමේ තක්සේරුවක්.

10. ඉස්සන් වගාව සඳහා ඕලන්ද ඇල පුනරුත්ථාපනය කිරීමේ කමිටුවේ අවසාන වාර්තාව.

11. තාරා ලියවිලි 1,2,3, සඳහා අවශ්‍ය කරුණු සකස් කිරීම සහ ඒවා සිංහල භාෂාවට පරිවර්තනය කිරීම.

12. දකුණු වෙරළ තීරුවේ ඉස්සන් වගාව සංවර්ධනය සඳහා සුදුසු ස්ථානයක් හඳුනා ගැනීම.

13. යෝජිත මුතුපන්තිය ඉස්සන් වැඩ බිමේ සමීක්ෂණය සඳහා උපදෙස් සේවා.

14. බත්ගදෙනියේ යෝජිත ඉස්සන් වගා ස්ථානය අගැයීම.

15. හම්බන්තොට යෝජිත ඉස්සන් වගා ස්ථානය අගැයීම.

16. කලමැටිය යෝජිත ඉස්සන් වගා ස්ථානය අගැයීම.

17. ඉස්සන් වගාව අදියර II සඳහා ශ්‍රී ලංකාවේ වෙරළ තීරුවෙහි සුදුසු ස්ථාන හඳුනා ගැනීමේ සමීක්ෂණය.

18. මීගමු කලපුවේ කඩොලාන සංවර්ධනය පිළිබඳ වාර්තාව(මුතුරාජවෙල පරිසර පද්ධති පිළිබඳ ම.කො.,ආ.කො. ව්‍යාපෘතිය සඳහා තාක්ෂණික වාර්තාව.

19. මීගමුවේ මෝය කටේ ප්‍රධාන හර්පණ සම්බන්ධතාවන් පිළිබඳ වාර්තාව.

20. වෙරළ බඩ පරිසර පද්ධතිවල නිෂ්පාදනතාවය පිළිබඳ වාර්තාව.

21. " ශ්‍රී ලංකාවේ මුහුදු හා මිරිදිය මසුන් හා බෙල්ලන් වර්ග සම්පත් සමීක්ෂණය " පිළිබඳ ව්‍යාපෘති යෝජනාවක් සකස් කොට ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලදී.

22. 1991 වසරේ මුදල් ආධාර සඳහා ව්‍යාපෘති යෝජනාවක් වෙත ඉදිරිපත් කරන ලදී.

**ව්‍යාප්ති කටයුතු :**

1. තංගල්ල ,හලාවත බේරුවල හා කප්පරතොට අමාත්‍යාංශ ජංගම සේවා වලට සහභා ගී විය.
2. පුත්තලම් කලපුවේ බෙල්ලන් වගා වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදී. වයඹ පලාත් සභාව විසින් මුදල් යොදවනු ලැබීය. මේ සඳහා බෙල්ලන් 150,000 ක් වගා කරන ලදී. ජනසවිය දුප්පත්ම තුරන් කිරීම වැඩසටහන සඳහා මෙය ක්‍රියාත්මක විය.
3. මීගමුවේ ශාන්ත මාරියා විද්‍යාලයේ හා කඳානේ ද මැසිනොඩ් විද්‍යාලයේ ප්‍රදර්ශන සඳහා සහභාගී විය.

**දේශන.**

සුරතල් මසුන් බෝ කිරීම සහ නඩත්තු කිරීම.
පාඨමාලා පුහුණුවන්නන්ට දේශන පවත්වන ලදී. සුරතල් මසුන් කර්මාන්තය පිළිබඳ රැක්කවීම හා ආටේමියා භාවිතය ගැන(ශ්‍රේණි 2 යි)

**සුරතල් මසුන් කර්මාන්ත අංශය.**

1. සුරතල් මසුන් බෝකරන්නන්ගේ ප්‍රයෝජනය සඳහා එක් මස් පුහුණු පාඨමාලා දෙකක් නාරා ආයතනයේ දී පවත්වන ලදී.
2. පහත සඳහන් ප්‍රදර්ශන වලට සහභාගී විය:-

(අ) පල්ලෙකැලේ ගම් උදාව උත්සවය.
(ආ) අධ්‍යාපන අමාත්‍යාංශයේ මීගමුව ජංගම සේවය.
(ඇ) කඳානේ ද මැසනඩ් විද්‍යාලයේ විද්‍යා ප්‍රදර්ශනය.

3. සුරතල් මසුන් අලෙවිය නැවත ආරම්භ කරන ලදී. විවිධ සුරතල් මසුන් වර්ග ශ්‍රේණි ගත කොට අලෙවිය සඳහා මිල ගණන් නියම කරන ලදී.
4. මතුගම ජනසවි ලාභී ස්වයං රැකියා සඳහා තෝරාගත් කණ්ඩායමකට දේශණ පවත්වන ලදී. මසුන් බෝකරන්නන්ගේ සංගමයේ සාමාජික යන්ට දේශණ පවත්වන ලදී.
5. සුරතල් මසුන් බෝ කිරීමට බලාපොරොත්තුවන් පැමිණි වෙනත් අයවලුන් 40 කට පමණ ආධාර කරන ලදී.
6. ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශයේ මත්ස්‍යාගාරයක් පවත්වා ගෙන යාම.
7. අංශයේ අලෙවි හලක් ආරම්භ කිරීමට අවශ්‍ය කටයුතු කරන ලදී.
8. විවිධ වර්ගවල සුරතල් මසුන් බෝ කිරීමේ කටයුතු කළ අතර මධ්‍යම පොකුණට "කොයි කා/-ප්" බහා ලන ලදී.

## වාර්ෂික වාර්තාව -- 1990.

### ජාතික මුහුදු ක්ෂීරපායි මසුන් වැඩසටහන.

**සේවක පිරිස් :-**

1990 වසරේදී මෙම අංශය පර්යේෂණ නිලධාරීන් එක් අයෙකු ද පර්යේෂණ සහකාර වරුන් දෙදෙනෙකු ද වශයෙන් සාමාජිකයින් තුන් දෙනෙකුගෙන් සමන්විත විය. සම්බන්ධීකරණ නිලධාරිණිය 1989 නොවැම්බර් මස සිට ප්‍රසූත නිවාඩු මත සිටි අතර ඇයගේ නිවාඩු අවසන් වනවාත් සමගම ඇය නාරා ආයතනයෙන් ඉල්ලා අස් වූවාය.
මෙම වර්ෂය තුල ඇය වෙනුවට සම්බන්ධීකරණ නිලධාරියකු පත් නොකරණ ලද බැවින් අංශ භාර නිලධාරියෙකු ද නොවීය.

## කාර්යය වැඩ සටහන.

ශ්‍රී ලංකාව අවට ජලයෙහි සටාසන් වර්ගයේ මසුන් ගේ ව්‍යාප්ත්‍ය සූචික ගත කරන ලද අතර ඒ ඒ සිටාසීන් වර්ගවල ව්‍යාප්තිය සිතියම් වලින් පෙන්නුම් කෙරිණ. තවද ශ්‍රී ලංකාව අවට වසන සිටාසීන් මසුන් වර්ග යොමු කර ගැනීම සඳහා ග්‍රන්ථ විඥාණ සූචියක් ද සකස් කරන ලදී.

මෙම කරුණු දෙකම වර්ෂයේ ප්‍රථම කාර්තුවේ දී නිම කරන ලද අතර වර්ෂය තුළ දී ඒවා යාවත්කාලීන කරන ලදී.

කුඩා සිටාසීන් අල්ලා ගැනීමේ දත්ත ගබඩා කිරීම පිණිස පරිගණකාගාරයක් සැලසුම් කොට ඇති අතර 1985 සිට 1989 දක්වා රැස්කරන ලද සියලුම දත්ත ඒ තුල ගබඩා කරන ලදී. ඒවා තවදුර විශ්ලේෂණය කරනු ඇත. ඇල්ලූ මසුන් පිළිබඳ දත්ත විශ්ලේෂණය කිරීම මෙම වසරේ ආරම්භකොට ඇති අතර ව්‍යාප්තියේ සේවක පිරිස විසින් ඒකාබද්ධ විද්‍යාත්මක පත්‍රිකාවක් පිළියෙල කිරීමට එම ප්‍රතිඵල ඉවහල් වනු ඇත.

කුඩා සිටාසීන් ඇල්ලීම පිළිබඳ තවදුරටත් දත්ත රැස් කිරීමට ක්ෂේත්‍ර පර්යේෂණ මාර්තු මස දී ආරම්භ කොට ඇති අතර පසුව එම කටයුතු මාස්පතා වයඹ, බටහිර, සහ දකුණු දිග වෙරළබඩ තීරුවල තෝරාගත් මසුන් ගොඩබෑමේ ස්ථාන හයක දී දිගටම කරනු ඇත. වර්ෂය තුළ දී අල්ලා ගත් මසුන් අතර කුඩා සිටාසීන් වර්ග 09 ක් ගැන වාර්තා වී ඇත. තව ද නිදර්ශක 152 ක් හඳුනාගෙන මැන බලා ඒවායේ අදාල සියලු දත්ත වර්ෂය තුල දී වාර්තා ගත කොට ඇත. වාර්තා කර ඇති සිටාසීන් අතර, Stenella, Longirostris, Stenella Coeruleoalba, Stenella Attenuata, Tursiops truncatus, Grampus griseus, Peponocephala electra, Lagenodelphis hpsel. Steno bredanensis, Kogia Simus

යන වර්ග වෙති.

1990 වසර තුල රැස්කරන ලද මසුන් ඇල්ලීමේ දත්ත, කලින් රැස්කළ දත්ත ගබඩා කොට ඇති දත්තාගාරයටම ඇතුල් කරන ලදී.

ශ්‍රී ලංකාවේ වෙරළටගසාගෙන එන ලද තල් මසුන් සිව් දෙනෙකු පිළිබඳ තොරතුරු ද මේ වසරේ දී වාර්තා කරන ලදී. ඉන් පළමු ගසාගෙන ඒම සිදු වූයේ 1990 මාර්තු මස දී දෙහිවල බටහිර වෙරළෙහි දිය. එම තල්මසා පරීක්ෂාකර බලනු ලැබුවේ ව්‍යාප්තියේ සේවකයින් විසිනි. එම තල් මසා Physeter Nacrocephalus වර්ගයේ ගැහැණු සතෙක් වශයෙන් හඳුනාගන්නා ලදී.

එම නිදර්ශකය අංග සම්පූර්ණව තිබුණ බැවින් මරණයට හේතු සෙවීම පිණිස දෙකඩකට කපනු ලැබීය.

සම්පූර්ණ ඇටසැකිල්ල වෙන් කොට නාරා ආයතනයට ගෙන එන ලදී.

දෙවෙනි ගසාගෙන ඒම 1990 අප්‍රේල් මස දී හැඳල බටහිර වෙරළේ සිදුවිය. පරීක්ෂණවලින් පසු Megasptera Novaeangliae නමින් හඳුනාගෙන ඇත.

තුන්වෙනි තල්මසා ඔක්තෝබර් මාසයේ දී කන්දකුලිය වයඹ වෙරළේ දී හමුවූ එකෙකි. සත්ත්වයා පිළිබඳ තොරතුරු ලැබී පරීක්ෂණ සඳහා ලඟාවෙන අවස්ථාව වන විට මළකුණ හඳුනාගත නොහැකි සේ කුණු වී තිබිණ. කැබෙලිවලට ද වෙන්වී තිබිණ. කෙසේ වුව අනුමාන වශයෙන් මෙම සහා Balaenoptera වර්ගයට අයත්යැයි නිශ්චයනය කෙරිණ. සිව්වැනි තල්මසා යාපනයේ උතුරු අර්ධද්වීපයෙන් හමුවුණේ නොවැම්බර් මාසයේ දීය. උතුරු ප්‍රදේශයේ පැවැති නොසන්සුන් තත්ත්වය හා ආරක්ෂක හේතූන් මත ඒ සඳහා පරීක්ෂණ මෙහෙයවීමට නොහැකි විය.

සේවක පුහුණු.

කිසිවක් නැත.

දේශීය හෝ විදේශීය සම්මන්ත්‍රණ , විශේෂඥ හමුවීම් හා වැඩ මුළු වලට සහභාගී වීම.

1990 පළමු කාර්තුවේ දී නාරාහි පැවැති සත්තිවේදන වැඩ මුළු දෙකකට මෙම අංශයේ සේවකයින්ගේ කෘති ඉදිරිපත් කරන ලදී.

ප්‍රකාශණ, පත්‍රිකා ,වෙනත් වාර්තා හා සේවාවන්.

අ. අනුක් ඉලංගකෝන්,ඩබ්.පී.මහේන්ද්‍ර සහ එච්.ඒ.කේ.සුමනසිංහ විසින් ලියන ලද " On Rare Cetacean Species of Sri Lanka including the Record of Orcinus Orea Cdelphinidae Cetacea the Killer Whale නමින් යුත් ඒකාබද්ධ විද්‍යාත්මක පත්‍රිකාව බොම්බායේ ස්වාභාවික ඉතිහාස සමිතියේ සඟරාවකට ඉදිරිපත් කරන ලදුව ප්‍රසිද්ධ කිරීමට පිළිගන්නා ලදී.

ආ. අනුක් ඉලංගකෝන් විසින් ලියන ලද " ශ්‍රී ලංකාවේ ජලයේ බියගන්වන කුඩා තල් මසුන් හා ඩොල්ෆින් මසුන් " නම් පත්‍රිකාව ශ්‍රී ලංකාවේ වනසත්ත්ව හා ස්වභාව සුරැකීමේ සංගමයේ " ලෝරිස් " සඟරාව වෙත ඉදිරිපත් කරන ලදී.

ඇ. පාරිසරික අමාත්‍යාංශයේ ඉල්ලීමක් අනුව අනුක් ඉලංගකෝන් විසින් සකස් කරන ලද ශ්‍රී ලංකාවේ කුඩා සිටාසීන් මසුන් අල්ලා ගැනීමේ ගැටළු පිළිබඳ වාර්තාව එම අමාත්‍යාංශයට ඉදිරිපත් කරන ලදී.
මීට අමතරව මුහුදු ක්ෂීර පායි ව්‍යාපෘතිය පිළිබඳව මහජනයා දැනුවත් කිරීමේ වැඩ සටහන යටතේ පහත සඳහන් කාර්යයන් 1990 වසරේ දී නිම කරන ලදී.

I. ශ්‍රී ලංකාවේ මුහුදු ක්ෂීරපායි සතුන් විස්තර කෙරෙන "Encounters )
නම් වූ වීඩියෝ චිත්‍ර පටය නාරා ආයතනයේ ද සහාය ඇතිව ජනවාරි
මාසයේ දී නිපදවන ලදි. පසුව වීඩියෝ පටිය පුළුල් කොට පසුගිය
නොවැම්බර් මස දී නැවත විකාශ වැඩසටහනක් මගින් විකාශය කැරෙන ලදි.

II. මාර්තු මස දී ගොඩ ගැසූ ගැහැණු තල් මසා පිළිබඳ තොරතුරු සියලුම
ඉංග්‍රීසි හා සිංහල පුවත්පත් වලට හා ශ්‍රී ලංකා රූප වාහිනී සංස්ථාවට ද
ලබා දෙන ලදි.

III. පසුගිය අප්‍රේල් මාසයේ දී අනුක් ඉලංගකෝන් විසින් මෙම ගැහැණු තල්මසා
පිළිබඳව පුවත්පත් ලිපි දෙකක් සකස් කොට ඒවා අයිලන්ඩ් හා සන්ඩේටයිම්ස්
පුවත්පත් වල පල කරනු ලැබීය.

IV. තල් මසුන් පිළිබඳව අනුක් ඉලංගකෝන් සමග පැවැත්වූ සම්මුඛ සාකච්ඡාවක්
ඇසුරු කොටගත් ලිපියක් අප්‍රේල් මාසයේ දී ඩේලි නිවුස් පුවත් පතේ පලවීය.

V. ඩොල්ෆින් මසුන් පිළිබඳ අනුක් ඉලංගකෝන් සමග පැවැති සම්මුඛ සාකච්ඡාවක්
ඇසුරු කොටගත් ලිපියක් පසුගිය ජූනි මාසයේ දී විදුසර සඟරාවේ පල
කරනු ලැබීය.

VI. කාන්ති සුබ සිංහ විසින් කොළඹ ශාන්ත පීටර්ස් විද්‍යාලයේ දී සිංහල මාධ්‍යයෙන්
දේශනයක් හා සර්පණයක් ද පෙන්වන ලදි. මෙය එම විද්‍යාලයේ තරුණ
සත්වෝද්‍යාන සංගමයේ සාමාජිකයන් සඳහාය.

VII. නාරා ආයතනය විසින් දකුණු දිග වෙරළබඩ මුහුදු ක්ෂීර පායී මත්ස්‍යයින්
සම්බන්ධව කරන ලද සේවාව පිළිඹිබු කෙරෙන ප්‍රදර්ශක පුවරුවක් තංගල්ල
ධීවර අමාත්‍යාංශ ජංගම සේවා වැඩ සටහන සඳහා සාදන ලදි.

VIII. අපගේ වෙරළ අවට ඩොල්ෆින් මසුන් අනතුරේ යන සිරස්තලය යටතේ
අනුක් ඉලංගකෝන් විසින් සකසන ලද ලිපියක් අගෝස්තු මාසයේ දී ඩේලිනිවුස්
පුවත්පතට යවන ලදි.

IX. සැප්තැම්බර් මස දී මීගමුවේ පැවැති අධ්‍යාපන අමාත්‍යාංශය විසින් සංවිධානය
කරන ලද විශේෂ පාසල් සතිය වැඩ සටහනට බෙදා හැරීම සඳහා මුහුදු
ක්ෂීරපායී මසුන් පිළිබඳව ප්‍රදර්ශක පුවරු හා තොරතුරු පත්‍රිකා සකස් කර
දෙන ලදි.

X. "Aquarius " නමින් පසුගියදාක පැවැති ගුවන් විදුලි වැඩසටහනකට
ව්‍යාපෘතියේ සියලුම සේවක සේවිකාවන් සහභාගී කරගන්නා ලදි.

XI. ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව ප්‍රචාරය කරන ලද අධ්‍යාපන සේවා වැඩසටහන
යටතේ සිටාසීන් මසුන් පිළිබඳ විවිධ කරුණු අලලා සකස් කරන ලද "මිනිසාගේ
අසල් වැසියෝ" නම් සිංහල ගුවන් විදුලි වැඩ සටහන් හයකට අනුක්
ඉලංකෝන් සහභාගී වීය.

29....

උපකරණ

කිසිවක් නැත.

අඩුපාඩු/ අතපසු වීම්.

1. සේවක පිරිස්.

මෙම ව්‍යාපෘතියෙහි දැනට තුන් දෙනෙකු පමණක් සේවය කරන බැවිනුත් සම්බන්ධීකරණ නිලධාරියෙකු නොමැති බැවිනුත් ව්‍යාපෘති වැඩ කටයුතු වලට බාධා පැමිණේ.

2. ප්‍රවාහන පහසුකම්.

අවශ්‍ය ප්‍රවාහණ පහසුකම් කලට වේලාවට නොලැබුණ හෙයින් පර්යේශණ කටයුතු ක්‍රමවත්ව පවත්වා ගැනීමට අතපසුවිය.

3. ආර්.වී. සමුද්‍රමාරු සහ බලයා යාත්‍රා දෙකම වර්ෂය පුරාම ක්‍රියාකාරී තත්ත්වයකින් නොතිබිණ. මේ නිසා මුහුදු ක්ෂීරපායී සතුන් පිළිබඳ වෙරළෙන් ඔබ්බෙහි පර්යේෂණ කටයුතු 1990 වර්ෂයේ ක්‍රියාත්මක නොවීය. තවද වේගයෙන් යාත්‍රා කරවිය හැකි වඩාත් ත්‍රියා ශීලී කුඩා යාත්‍රාවක් හෝ ලබා දෙනොත් මු_ _ ක්ෂීරපායී මසුන් පිළිබඳ අධ්‍යයනයන් මුහුදේදී කළ හැකිවේ.

ඒ.ඩී. ඉලංගකෝන්
ප.නි/ ජාතික මුහුදු ක්ෂීරපායී
වැඩ සටහන.
නාරා.

## පාරිසරික අධ්‍යයන ඒකකය.

## වාර්ෂික වාර්තාව - 1990.

1. දේශීය නියෝජිතායතනවලද සහයෝගීතාවය සමග නිම කිරීමට භාර ගන්නා ලද ව්‍යාපෘති.

### 1.1 ම.කො.ආ.කො. පාරිසරික අධීක්ෂණ වැඩසටහන

#### කටුනායක අපනයන සැකසුම් කලාපය.

කටුනායක අපනයන සැකසුම් කලාපය වෙත පරීක්ෂණ චාරිකා හතලිස් හයක් යන ලද අතර නියැඳි 172 ක් එක්කොට භෞත-රසායනික පරාමිති 15 ක් සඳහා පරීක්ෂණ පවත්වනු ලැබීය.
ගොඩනර ජලස්ථානවලට ගලා යන අපවිත්‍ර ද්‍රව්‍ය සඳහා ම.කො.ආ.කො. විසින් අනුමත නියමයන්ට අනුකූල නොවන අන්දමේ නියැඳි පරීක්ෂණයන්ට භාජනය කළ ඒවා අතර විය. ගත යුතු පියවර කවරේදැයි අඩංගු වාර්තා ම.කො.ආ.කො. වෙත ඉදිරිපත් කරන ලදී.

### 1.2 බියගම අපනයන සැකසුම් කලාපය.

බියගම අපනයන සැකසුම් කලාපයට නිරීක්ෂණ චාරිකා 43 ක් යන ලද අතර නියැඳි 139 ක් පිළිබඳව විශ්ලේෂණයන් කරන ලදී. අවශ්‍ය නිර්දේශ ද ඇතුලත් වාර්තා ම.කො.ආ.කො. වෙත ඉදිරිපත් කරන ලදී.

### 1.3 අපනයන සැකසුම් කලාප වලට පිටත සේවා.

#### 1.3.1 සී.ස.ටැන් ලංකා.

හැඳල පිහිටි හම් පදම් කිරීමේ කර්මාන්ත ශාලා වැඩබිම පරීක්ෂා කිරීම සඳහා චාරිකා 37 ක් වර්ෂය තුළ දී සිදුකර ඇත. කර්මාන්ත ශාලාවෙන් පිට කරනු ලබන අපද්‍රව්‍යවලින් පරිසර හානි වීම වැලැක්වීම පිණිස අවශ්‍ය නියැඳි ලබා ගෙන විශ්ලේෂණය කරන ලදී.

#### 1.3.2 ස්වදේශීය කර්මාන්ත.

කර්මාන්ත ශාලාව හා එහි මෙහෙයුම් කටයුතු පරීක්ෂණ වලින් පසු අවශ්‍ය නියැඳි ලබා ගන්නා ලදී. අපද්‍රව්‍ය ප්‍රති කර්ම හා නිර්දේශ ඇතුලත් වාර්තා ම.කො.ආ.කො. වෙත ඉදිරිපත් කරන ලදී.

31 ....

## 1.4 ගොඩතර ජලස්ථාන අධීක්ෂණය - කැළණි ගඟ.

ම.කො.ආ.කො. අවට අප ද්‍රව්‍ය ගඟට ඇතුළුවන තෝරාගත් ස්ථාන කිහිපයකින් තියැඳි රැස්කරන ලදී. ඒවා විශ්ලේෂණාත්මකව අධ්‍යයනය කොට ප්‍රතිඵල ම.කො.ආ.කො. වෙත ඉදිරිපත් කරන ලදී. ප්‍රතිඵල වලින් පෙනී යන ආකාරයට මේ දක්වා කැළණි ගං ජලය මතුපිට අපද්‍රව්‍ය හානි සිදුවීමක් ඇති නොවේ.

## 2. නුවරඑළිය වැව පාරිසරික අධ්‍යයනය - නරේයා ව්‍යාපෘතියකි.

මෙහි අධ්‍යයන කටයුතු වර්ෂය පුරාම නොකඩවා කෙරුණ අතර විශ්ලේෂණය සඳහා තියැඳි ලබා ගන්නා ලදී. රසායනික පරාමිති සඳහා තියැඳි 179 ක් විශ්ලේෂණය කරන ලදී. එම ප්‍රමාණයක්ම තියැඳි රැස්කොට Coliterms & Faecal E.Coli අගයන් ලබා ගැනීමට විශ්ලේෂණය කරන ලදී. එම ස්ථානයේ දීම නිශ්පාදනතාවය පිළිබඳ අධ්‍යයනයන් කරන ලදී. ප්‍රතිඵල අනුව වැවේ පෝෂ්‍යදායක අගයන් වලින් බහුල බව පෙණින. දැනට කෙරෙන කෘෂිකාර්මික කටයුතු හේතුවෙන් වර්ෂාව සමයේ දී වැව රොන්මඩ වලින් පිරෙන ස්වභාවයක් උසුලයි.

## 3. බෙලිහුල් ඔය දිය මාර්ගය සහ අවට පරිසර අධ්‍යයනය.

විශ්ලේෂණයන් සඳහා අවශ්‍ය තියැඳි ලබා ගැනීමට චාරිකා හයක් කරන ලදී. රසායනික පරාමිතිවලට අමතරව බැක්ටීරියෝලොජිකල් පරාමිති දෙකක් ද එනම් Coliferm & Faecal E.Coli පරාමිති ද අධ්‍යයනය කරන ලදී. ජල මාර්ග ස්ථානයේ දීම මූලික නිශ්පාදනතාවය ද මැන බලන ලදී.

## 4. බේරේ වැවේ මසුන් මැරී යාම.

බේරේ වැවේ මසුන් විශාල වශයෙන් මැරී යමින් තිබෙන බව ජනවාරි මස මුලදී වාර්තා විය. මෙයට හේතු දැන ගැනීමට අධ්‍යයනයක් මෙහෙයවන ලදී. ඉන් පසු නොකඩවාම වැවේ ජලය වෙනස් වීම් පිළිබඳ අධීක්ෂණයකින් පසුවන ලදි. බේරේ වැවට ඇතුළු වන්නාවූ පොස්පේට් ප්‍රමාණය අඩු කිරීම සඳහා යෝග්‍ය තාක්ෂණික වැඩ පිළිවෙලක් සැකසීම පිණිස ව්‍යාපෘති යෝජනාවක් පාරිසරික අධ්‍යයන ඒකකය විසින් සකස් කොට ඇත. අපද්‍රව්‍යවල අඩංගු පොස්පරස් අගයන් අඩු කිරීමට පාරිසරික වශයෙන් සමත් රසායනික විශේෂයක් ඊට මුහු කිරීම පිළිබඳව අධ්‍යයනය කෙරේ.

32 ....

බේරේ වැවේ තැගෙතහිර කොටසේ මසුන් මියායාම පිළිබඳව 1990 ජූනි මාසයේ ලැබුණු වාර්තාව අනුව ඊට හේතු සොයා බැලීමට ජලජ සම්පත් අංශයේ සහයෝගය ඇතිව පරීක්ෂණයක් කරන ලදී. දියර ඔක්සිජන් හීන වීමට අමතරව හැරීමේ කටයුතු හා තද වර්ෂාව නිසාත් ජලාධාර ප්‍රදේශවලින් ගලා බසින ජලය වැඩි වීමත් මෙම ප්‍රශ්නය උග්‍ර වීමට හේතු වී ඇති බව පෙනේ.

5. විශේෂ අධ්‍යයන.

5.1 තෙල් අපවිත්‍රතාව - අකුරාළ

අම්බලන්ගොඩ සිට හික්කඩුව දක්වා මුහුදු වෙරළ තීරුවේ 1990 පෙබරවාරි මස 15 දින සිට කිසියම් තෙල් අපවිත්‍රතාවයක් ඇතිවී ඇතිබව දකුණු පළාත් සභාව මගින් දැනුම් දෙන ලදුව ඒ පිළිබඳව පරීක්ෂණයක් කරන ලදී.

අකුරළ වෙරළේ ඉතා ඉහළ මට්ටමක තෙල් ආවරණයක් තිබෙන බව දක්නා ලදී. මෙම තෙල් සාධනය අම්බලන්ගොඩ සිට උතුරටත් පලුවත්ත සිට දකුණටත් මුළුමනින්ම පහව ගොස් ඇත. අදාල වෙරළේ ජලයෙහි මෙම තෙල් සාධනය දක්නා නොලද අතර විශ්ලේෂණ ප්‍රතිඵල වලින් පෙනී ගියේ මෙ මගින් මසුන්ට එතරම් හානියක් නොවන බවයි.

තෙල් අපවිත්‍රතාවය ඉන්පසු දක්නට නොලැබිණි. අදාල වාර්තාව ශ්‍රී ලංකා වරාය අධිකාරියට තිසි කටයුතු සඳහා යවන ලදී.

5.2 තෙල් අපවිත්‍රතාවය - කොල්ලුපිටිය අවට වෙරළ.

නාරා ආයතනයේ සභාපතිගෙන් කෙරුණු ඉල්ලීමක් අනුව කොළඹ වරාය සිට බම්බලපිටිය දක්වා වෙරළ තීරුවෙහි තෙල් අපවිත්‍රතාවයක් තිබේ දැයි සෙවීමට පරීක්ෂණයක් කරන ලදී. අදාල වෙරළ පරීක්ෂා කොට ජල තියැඳි ලබා ගෙන රසායනාගාර පරීක්ෂණවලට ලක් කරන ලදී. එහෙත් අපවිත්‍රතා ලක්ෂණ කිසිවක් නොමැතිබව ප්‍රතිඵල වලින් පෙනී යන ලදී.

5.3 ජලය අපවිත්‍රවීම - බේරුවල ස්කාගාරය සහ මෙත්ඩ් ඉස්කාගාරය.

ධීවර හා ජලජ සම්පත් ඇමතිතුමාගේ ඉල්ලීමක් අනුව මෙම ස්කාගාර දෙකෙන් පිටවන ජල අපද්‍රව්‍ය පිළිබඳ සොයා බැලීමට එම ස්ථාන වලට ගිය අතර මාර්තු මුල දී කළුතර පැවැති අමාත්‍යාංශ ජංගම සේවා ස්ථානයේ දි අදාල වාර්තාව භාරදෙන ලදී. අවශ්‍ය වුවහොත් ප්‍රතිකර්ම යෙදීම සඳහා මේ පිළිබඳව අධ්‍යයනය කිරීමට නිත්‍ය අධීක්ෂණයක් හෙරෙමින් පවතී.

6. සම්මන්ත්‍රණ හා වැඩ මුළු.

6.1 පාරිසරික ප්‍රතිකර්ම ක්‍රියාත්මක කිරීම - CEA /USAID සම්මන්ත්‍රණය.

තක්සේරු පටිපාටි.

1990 ජනවාරි මසදී නියමිත ව්‍යාපෘතිවල පාරිසරික ප්‍රතිකර්ම තක්සේරු පටිපාටි සැකසීම උදෙසා අවශ්‍ය දැනුම ලබා දුන් අතර ඒවා සකස් කිරීමට සහභාගී විය.

6.2 ආනයන පාලනය සහ විෂ රසායන ද්‍රව්‍ය ගබඩා කිරීම.

1990 මාර්තුමස පැවැති ඉහත සඳහන් කමුවට එන්.එච්.දසනායක මහතා නිරීක්ෂකයකු වශයෙන් සහභාගී විය.

6.3 පරිසර විද්‍යාව හා ඉඩම් සැකසීමේ කළමනාකරණය.

1990 මාර්තු මස දී පැවැති ඉහත සඳහන් සම්මන්ත්‍රණයට එන්.එච්. දසනායක මහතා නිරීක්ෂකයකු වශයෙන් සහභාගී විය.

6.4 ජාතික ජල ශාස්ත්‍රීය කාර්යාලයේ සම්මන්ත්‍රණය - කළුතර

ඉහත සඳහන් සම්මන්ත්‍රණයේ දී පාරිසරික අධ්‍යයන ව්‍යාපෘතිය පිළිබඳ ප්‍රකාශණයක් ආචාර්ය පද්මිණී ද අල්විස් විසින් ඉදිරිපත් කරනු ලැබුවාය.

6.5 පාරිසරික ප්‍රතිකර්ම තක්සේරු රෙගුලාසි සහ පරිපාටි.

ආචාර්ය පද්මිණී ද අල්විස් මධ්‍යම පරිසර අධිකාරිය මගින් සංවිධානය කරනු ලැබූ වැඩ මුළුවකට සහභාගී වූවාය. මෙසේ සහභාගී වූයේ පාරිසරික ප්‍රතිකර්ම තක්සේරු කිරීම පිළිබඳව වූ රෙගුලාසි කෙටුම්පත අධ්‍යයනය කොට වැඩි දියුණු කිරීම සඳහාය.

6.6 රසායනික උපද්‍රව පාලනය කිරීම UNEP/IRPIC

මගින් සංවිධානය කරන ලද පසුගිය සැප්තැම්බර් මස දී රුසියාවේ පැවැති සම්මන්ත්‍රණයකට එන්.එච්.දසනායක මහතා සහභාගී විය.

6.7 මුහුදු විකිරණශීලතාව අධ්‍යයන.

1990 ඔක්තෝබර් මස ඉතාලියේ පැවැති ව්‍යවහාර මුහුදු විකිරණශීලීතාව අධ්‍යයන සඳහා වූ ක්‍රමෝපායයන් සහ ක්‍රම විද්‍යාවන් පිළිබඳ පුහුණු පාඨමාලාවකට ආචාර්ය පද්මිණී ද අල්විස් සහභාගී වූවාය.

7. පාරිසරික විෂය ප්‍රමාණ කිරීමේ කමිටුව.

කොට්ටිකුඩේ සම් පදම් කිරීමේ කම්හලක් ආරම්භ කිරීමේ ව්‍යාපෘතිය.

මෙම ව්‍යාපෘතිය ම.කො.ආ.කො. ත් මධ්‍යම පරිසර අධිකාරියේ වෘත්තීය ස්වස්ථතා දෙපාර්තමේන්තුවත් තාරා ආයතනයත් ඒකාබද්ධව යෝජිත වැඩ බිම පරීක්ෂා කිරීම සඳහා චාරිකා කරන ලදී. ව්‍යාපෘතිය අනුමත කිරීමට පෙරාතුව ගතයුතු පාරිසරික පාලනමය පියවර පිළිබඳ අදහස් ම.කො.ආ.කො. වෙත ඉදිරිපත් කරන ලදී.

8. වෙනත් අංශ වලට සපයන ලද සේවාවන් විශ්ලේෂණ කටයුතු

මීගමු කලපුවේ ජල නියැඳි කිරීම.

සමුද්‍ර විද්‍යා අංශයෙන් ලැබුණ මීගමු කලපුවේ ජල නියැඳි එකසිය තවයක් විශ්ලේෂණය කරන ලදී. සියලුම නියැඳිවල සිලිකා, නයිට්‍රේට්, නයිට්‍රයිට්, සහ පොස්පේට් සාන්ද්‍රණයන් නිර්ණය කිරීම සඳහා මෙම විශ්ලේෂණයන් කරන ලදී. ප්‍රතිඵල ආචාර්ය ශාන්ති වික්‍රමරත්න වෙත ඉදිරිපත් කරන ලදී.

9. ව්‍යාප්ති සේවාවන්.

9.1 ජල නියැඳි විශ්ලේෂණ කටයුතු.

සී.ස. අන්ද්‍රියස් සමාගමෙන් ලැබුණ අයිස් සහ ජල නියැඳිවල ක්ෂුද්‍රජීව විද්‍යාත්මක විශ්ලේෂණ කරන ලදී.

9.2 අපද්‍රව්‍ය නියැඳි.

මීගමුවේ එස්කිමෝ ගාමන්ට්ස් සමාගමේ සායම් ගාර වල ප්‍රතිකාර යන්ත්‍ර සූත්‍ර වලින් ලබා ගත් අපද්‍රව්‍ය නියැඳිවල රසායනික විශ්ලේෂණයන් කරන ලදී. ඒ ප්‍රතිකාර ක්‍රියාවලියෙහි වැඩි දියුණු කිරීම සඳහාය.

9.3 හලාවත කලපුවේ මසුන් රසායනික ද්‍රව්‍ය වලට ගොදුරු වීම.

හලාවත පළාත්පාලන සහකාර කොමසාරිස් ගේ ඉල්ලීමක් අනුව හලාවත කලපුවේ මසුන් රසායනික ද්‍රව්‍ය වලට ගොදුරු වීම පිළිබඳව පරීක්ෂණයක් කරන ලදී.
වැදගත් රසායනික පරාමිති සඳහා ජල නියැඳි විශ්ලේෂණය කරන ලදී. මෙහි ප්‍රතිඵල අනුව කලපුවේ ජලයට මිලි ග්‍රෑම් 1 කට 6.5 සිට මිලි ග්‍රෑම් 1 කට 9.8 දක්වා ප්‍රමාණයක තෙල් කලවම් වී ඇති බව හෙළි විය. විශ්ලේෂණය කරන ලද මසුන් වර්ගවල සාමාන්‍ය රස හැරුණුවිට වෙනත් රසයක් දැණ ගැනීමට නොලැබුණ බව මේ සඳහා පත්කරන ලද අයි.පී.එච්.අයි ආයතනයේ සේවකයින්ගෙන් සැදුම් ලත් රස පිරික්සීමේ මණ්ඩලය විසින් කරන ලද රස පිරික්සීමේ දී හෙළිවිය.

10. අමාත්‍යාංශ ජංගම සේවා.

හලාවත පැවැති අමාත්‍යාංශ ජංගම සේවා වැඩ සඳහා ආචාර්ය පද්මිණී ද අල්විස් සහභාගී වූවාය.

11. වෙනත් සංවිධාන සඳහා සලසන ලද උපදෙස් සේවා - මධ්‍යම පරිසර අධිකාරිය.

11.1 ජල සම්පත් සඳහා වූ අංශ කාරක සභාව - මධ්‍යම පරිසර අධිකාරිය.

රැස්වීම් වලදී ආචාර්ය පද්මිණී ද අල්විස් නාරා ආයතනය නියෝජනය කළාය. ජාතික සංරක්ෂණ ක්‍රමෝපා ආයතනයේ ජල සම්පත් කළමනාකරණ ක්‍රමෝපාය සඳහා ක්‍රියා සැලසුම් සම්පාදනය කිරීම ට ද ඇය දායක වූවාය.

11.2 තෙත් ඉඩම් සංවර්ධන කමිටුව - මධ්‍යම පරිසර අධිකාරිය.

ආචාර්ය පද්මිණී ද අල්විස් නාරා ආයතනය නියෝජනය කරමින් රැස්වීම්වලට සහභාගී වූවාය. දිවයිනේ වැදගත් තෙත් ඉඩම් සංරක්ෂණය කිරීමේ කරුණු සඳහා ඇය අදහස් දක්වමින් දායක වූවාය.

11.3 බේරේ වැව පුනරුත්ථාපනය කිරීමේ තාක්ෂණික කමිටුව.

බේරේ වැවේ තවදුරටත් අපවිත්‍ර වීම වළක්වා ලීමට හා දියුණු කිරීමට අවශ්‍ය පියවර ගැනීමේ ලා උපදෙස් දෙමින් ආචාර්ය පද්මිණී ද අල්විස් නාරා ආයතනය නියෝජනය වන පරිදි රැස්වීම් වැඩ වලට දායක වූවාය.

12. විශ්ලේෂණ තාක්ෂණවල අන්තර්- රසායනාගාර ප්‍රමිත කරණය.

වැදගත් මූලිකාංග 06 ක් සඳහා සංශ්ලේෂක ජල නියැදි විශ්ලේෂණය කරන ලදී. ප්‍රතිඵල වාර්තා මධ්‍යම පරිසර අධිකාරියට ඉදිරිපත් කොට ඇත. මෙම වැඩ පිළිවෙළේ රසායනාගාර ක්‍රියා දාමයන් හි සෑම අංශයක්ම සාකච්ඡා කිරීමට පවත්වන ලද නිරීක්ෂණ රැස්වීම් වලට සහභාගී විය.

13. විදේශීය ඒජන්සි ආයතනවල සහයෝගය ද ඇතිව නිම කිරීමට භාරගත් ව්‍යාපෘති.

13.1 පුත්තලම් කලපුවේ පාරිසරික අධ්‍යයනයන්.

මෙම අධ්‍යයන කටයුතුවලට ස්වීඩන රජයේ මුදල් ලැබෙන අතර එය 1990 ජූලි මස දී ආරම්භ විය. ක්ෂේත්‍ර අධ්‍යයන සහ නියැදි රැස්කිරීමට චාරිකා පහක් කරන ලදී. අපවිත්‍ර වීමේ හා පෝෂක මට්ටම් නිර්ණයනය කිරීමට නියැදි 136 ක් රැස්කොට විශ්ලේෂණය කරන ලදී.

13.2 යුඑස්ඒඩ් ව්‍යාපෘතිය.

මුහුදු අපවිත්‍රතා අධ්‍යයනය කිරීම සහ මුල දත්ත රැස්කිරීමේ කාර්යයන් සඳහා ව්‍යාපෘති යෝජනාවක් සකස් කරන ලදී. අදාල ව්‍යාපෘති වාර්තා පරිසර අමාත්‍යාංශය මගින් යුඑස්ඒඩ් ආයතනය වෙත ඉදිරිපත් කරන ලදී. මුදල් ආධාර ලබා ගැනීම සඳහාය.

36 .....

14. ජාතික වාර්තා සම්පාදනය පිණිස දායක වීම.

14.1 පාරිසරික සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මේලනයට ජාතික වාර්තාව සකස් කිරීම.

ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශයේ වාර්තාවට ඇතුළත් කිරීම පිණිස දැරිය හැකි සංවර්ධනය සම්බන්ධව පරිසර අධ්‍යයන ඒකකයේ කටයුතු පිළිබඳ වාර්තාවක් සකස් කරන ලදී.

14.2 ස්වාභාවික නිනාශය හා පරිසරය ආරක්ෂා කිරීම හා සාරක්ෂණය පිළිබඳ සරෙක් අධ්‍යයනය.

කාර්මික අපවිත්‍රතා හේතුවෙන් හා ස්වාභාවික විනාශයන්ගෙන් ශ්‍රී ලංකාවේ මසුන් මිය යාම සඳහන් කෙරෙන වාර්තාවක් සම්පාදනය කරන ලදී. ජාතික වාර්තාව සකස් කිරීම සඳහා එම වාර්තාව මධ්‍යම පරිසර අධිකාරිය වෙත යවන ලදී.

15. නව කර්මාන්ත ව්‍යාපාර ආරම්භ කිරීමට අනුමැතිය.

යෝජිත ව්‍යාපෘති අධ්‍යයනය කිරීමෙන් හා වැඩ බිම් පරීක්ෂා කිරීමෙන් පසු දැරිය හැකි කර්මාන්ත සංවර්ධන ව්‍යාපෘති වලට අනුදීමක් වශයෙන් මහත සඳහන් සංවර්ධනයන් සඳහා බලපත් ලබා දෙන ලදී.

15.1 ජා ඇල කෘෂිකාර්මික ප්‍රති ඇසුරුම් හා සම්පාදන කර්මාන්තය.
( කොන්දේසි හා තත්වයන් ප්‍රමාණ කිරීමේ කමිටු රැස්වීමේ දී පැහැදිලිකර ඇත.)

15.2 කටුනායක - කඩොල්කැලේ ජල ක්‍රීඩා සංකීර්ණය.

15.3 වත්තල මාබෝලේ පොලියෙස්ටර් නූල් එතීමේ හා සායම් කිරීමේ යන්ත්‍රාගාරය.

15.4 හලාවත ගැඹුරු දියේ මසුන් ඇල්ලීමේ බෝට්ටු නිෂ්පාදනය සඳහා බෝට්ටු අංගනය.

16. වැඩි දියුණු කිරීම් හා සංවර්ධනය කිරීම්.

16.1 රසායනාගාර පහසුකම්.

සාරෙක් ව්‍යාපෘතියේ( ව්‍යාපෘතිය 3) යටතේ දේශීය වශයෙන් ලබාගත නොහැකි ක්ෂුද්‍ර ජීව විද්‍යාත්මක පෙරන ඒකකයක් ද ඇතුළුව අත්‍ය වශ්‍ය වීදුරු භාණ්ඩ මිලයට ගන්නා ලදී. තවද සාරෙක් ව්‍යාපෘතිය යටතේ ජල බක්කියක් ද අතින් ගෙන යා හැකි ග්‍රීස් කරණයක් ද රික්ත පොම්පයක් ද වර්ණාවලී දීප්ති මානකය සහ ඊට අවශ්‍ය උපකරණ මෙවලම් කට්ටල ද මිලයට ගන්නා ලදී.

37 ....

16.2 විශ්ලේෂණ හැකියාවන්.

1990 වර්ෂයේ දී ඉහත කී රසායනාගාර සංවර්ධන කටයුතු හේතුවෙන් ඉතා බර ලෝහ ද්‍රව්‍ය එනම් තඹ, රියම් සහ හොඩ්මියම් ආදියෙහි සාන්ද්‍රණයන් නිර්ණයනය කර ගැනීමට සමත් විශ්ලේෂණ හැකියාවන් දියුණු කිරීමට පරිසර අධ්‍යයන ඒකකයට හැකි විය.
තවද මුහුදු ජල නියැදි වල පෝෂ්‍යදායකයින් සහ බෝරෝන් යන ද්‍රව්‍යවල සාන්ද්‍රණයන් නිර්ණයනය කිරීමට සමත් තාක්ෂණ තාවයන් ද සංවර්ධනය කර තිබේ.

17. සේවක මණ්ඩලය.

1990 වසරේ සේවක මණ්ඩලය පර්යේෂණ නිලධාරීන් දෙදෙනෙකු ද සහකාර පර්යේෂණ නිලධාරීන් සිව් දෙනෙකු සහ කම්කරුවකු ගෙන් ද සමන්විත විය.

18. අඩුපාඩුකම්/දුෂ්කරතා.

පහත සඳහන් අඩුපාඩුකම් මේ දක්වා සපුරා නොමැති බැවින් පරිසර අධ්‍යයන ඒකකයේ ක්‍රියා කටයුතු නිසියාකාරව කළ නොහැකිව ඇත.

18.1 උපකරණ හිඟය.

18.1.1 පලිබෝධනාශක ශේෂයන් විශ්ලේෂණයට අවශ්‍ය පී.අයි.සී. උපකරණය.

18.1.2 බර ලෝහ විශ්ලේෂණයට අවශ්‍ය ඒ.ඒ.එස්.

18.1.3 ජලයෙහි ක්ෂුද්‍ර ජීව විද්‍යාත්මක තත්ත්වය වහාම නිර්ණය කිරීම සඳහා ක්ෂේත්‍ර ක්ෂුද්‍ර ජීව විද්‍යාත්මක කට්ටලය.

18.1.4 පරිගණක පහසුකම්.

18.1.5 කේන්ද්‍රාපසාරකය.

18.1.6 සියොතයිසරය

18.2 සේවක මණ්ඩල හිඟය.

1988 වර්ෂයේ දී ඉල්ලා අස්වූ පර්යේෂණ නිලධාරීන් දෙදෙනෙකුගේ පුරප්පාඩු තවමත් පිරවීමට කටයුතු කර නැත.

අ/කළේ.
ආචාර්ය පද්මිණී ද අල්විස්.

38....

## පෙර අස්වනු තාක්ෂණික ආයතනය.

### ප්‍රගති වාර්තාව.

සේවක මණ්ඩලය.

ආචාර්ය එස්.සුබසිංහ
ටී.සී.පී.පොන්සේකා මයා
මාලිනි වීකිවෘසගම් මෙතෙවිය
මාලා පෙරේරා මෙතෙවිය.

ආචාර්ය එස්.වයි.තාමරත්න
එම්.එන්.මොහිදීන් මහතා
සී.වී.ලියනගේ මෙතෙවිය.
ඩී.අමරසිංහ මෙතෙවිය.

1990 වර්ෂය තුල ආයතනය විසින් නිම කිරීමට භාරගත් පර්යේෂණ කටයුතුවල ප්‍රගතිය පිළිබඳ විස්තරයක් මෙහි පහත දැක්වේ.

ව්‍යාපෘතිය: 1 ශ්‍රී ලංකාවේ ඉස්සන්ගෙන් ඉවත ලන ද්‍රව්‍ය ප්‍රයෝජනයට ගැනීම සඳහා සම්භාව්‍යතා අධ්‍යයනය.

1990 ජූලි මාසයේ දී ව්‍යාපෘතියේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී. වර්ෂය තුල දී ඉස්සන්ගෙන් ඉවත ලන ද්‍රව්‍ය නියැදි 30 කට වැඩි ගණනක් විශ්ලේෂණය කරන ලදී. ඉස්සන්, කකුළුවන්, පොකිරිස්සන් අපනයනය/මෙරට අලෙවිකළ ප්‍රමාණය පිළිබඳ දත්ත රැස්කොට අපනයනය කර්මාන්තයෙන් ඉවත ලන කොටස් නිශ්පාදනය පරිච්ඡේද කරන ලදී. දැනට ඉස්සන්ගෙන් ඉවත ලන ද්‍රව්‍ය ප්‍රයෝජනයට ගන්නා රටාව පරීක්ෂාකරන ලද අතර වැඩි ප්‍රයෝජනයක් ලබා ගැනීමේ සම්භාව්‍යතාවය තක්සේරු කරන ලදී. මෙහි ප්‍රතිඵල ප්‍රසිද්ධ කරන ලද අතර වාර්තාව බෙන්ගාල බොක්ක වැඩසටහනට ඉදිරිපත් කරන ලදී. යෝජිත Nara/ODNRI/BOBP ව්‍යාපෘතිය යටතේ මෙම අංශයේ තවත් වැඩ කටයුතු කිරීමට භාරගනු ඇත. අඩු වියදම් කුකුළු සත්ත්ව ආහාරයක් සකස්කර ගැනීමේ ලා ඉස්සන්ගෙන් ඉවත ලන ද්‍රව්‍ය ප්‍රයෝජනයට ගැනීමේ හැකියාව සොයා බැලීමට පරීක්ෂණ ගණනාවක්ම මෙහෙයවනු ලැබීය.

ආනයනය කරන ලද මත්ස්‍යාහාර ද්‍රව්‍ය 9 ක් පමණ විශ්ලේෂණය කරන ලද අතර සාත්ද්‍රණයක් හඳුනා ගන්නා ලදී. දේශීයව ලබා ගත හැකි අමු ද්‍රව්‍ය යොදාගෙන අඩු වියදම් කුකුළු සත්ත්ව ආහාරයක් සංවර්ධනය කිරීමට ක්‍රියා කරනු ඇත.

ව්‍යාපෘතියේ වැඩ එස්.සුබසිංහ, වයි.තාමරත්න සහ එම්.පෙරේරා යන අයවිසින් නිම කරන ලදී.

39 ....

ව්‍යාපෘතිය II

රික්ත ඇසුරුම්කළ මසුන් සහ ධීවර නිශ්පාදන පිළිබඳ පරීක්ෂන වැඩ සහ උපදෙස් සේවා.

දැල්ලන්, පොතු දැල්ලන්, ඉස්සන් සහ අනෙකුත් ධීවර නිශ්පාදන ද පෞද්ගලික අංශය සඳහා පළතුරු සහ එළවළු වර්ග ද රික්ත ඇසුරුම් කිරීම පිළිබඳ උපදෙස් සේවා මෙම ආයතනය විසින් සලසන ලදී. සීමාසහිත රෝ බීන් ව්‍යාපෘතික සමාගමේ අපනයන අවශ්‍යතාවයන් සඳහා අත්හදා බැලීමේ ඇසුරුම් කිහිපයක් ද සකසන ලදී. සී.ස. කීල්ස් සමාගම සඳහා උපදෙස් සේවා ද සලසන ලදී. ඒ රික්ත ඇසුරුම් කළ මසුන් ආනම් පිළිබඳව හා ඔවුන්ගේ නොයෙකුත් වෙනත් නිශ්පාදන පිළිබඳවය. පාසල් ළමුන් සඳහා අඩු වියදම් දිවා ආහාරයක් සංවර්ධනය කිරීමෙහි ලා ජනයවි නිශ්පාදනයක් යොදා එනම් මුං ඇට, සෝයා බෝංචි, බත්, මඤ්ඤොක්කා සහ බතල යනාදී රික්ත ඇසුරුම් කළ කෘෂිකාර්මික නිශ්පාදනයන් පිළිබඳව ද පරීක්ෂණ පවත්වන ලදී. රික්ත ඇසුරුම් කළ කිරිබත් හා පැණි ඇට වර්ග මාස දෙකක පමණ රාක්කයේ තබා ගැනීමේ හැකියාවක් පෙන්නුම් කෙරිණ.

ව්‍යාපෘතියේ වැඩ කටයුතු එන්.වීනිවාසගම් සහ එම්.එච්.මොහිදීන් විසින් මෙහෙයවන ලදී.

ව්‍යාපෘතිය. III.

ශ්‍රී ලංකා ජලයෙහි කටු මත්ස්‍ය බෙල්ලන් වර්ග වල තත්ත්ව අධ්‍යයනය.

කල්පිටිය, ගලාවත සහ මීගමු ප්‍රදේශවල නියැදි සමීක්ෂණයන් 1989 වර්ෂය තුළ අවසන් කරන ලදී. දකුණු වෙරළබඩ ප්‍රදේශයන් හි බෙල්ලන් වර්ග නියැදි කටයුතු 1990 වසරේ දී කරනු ලැබීය. නියැදි විශ්ලේෂණය කොට ව්‍යාධිජනකයන් සහ වෙනත් ඓන්ද්‍රිකයන් සටහන් කරන ලදී. ප්‍රදේශ පහක එනම් බේරුවල, මීගමුව, කල්පිටිය, මිරිස්ස සහ කප්පරතොට විසිරී සිටි සියලු බෙල්ලන් වර්ග ක්ෂුද්‍ර ජීව විද්‍යාත්මකව පරීක්ෂා කරන ලද අතර කටු මසුන්ගේ තත්ත්වයන් තක්සේරු කොට වාර්තාව ඉදිරිපත්කරන ලදී.

ව්‍යාපෘති කටයුතු භාරගනු ලැබුවේ එන්.වීනිවාසගම් හා එම්.එච්.මොහිදීන් විසිනි.

ව්‍යාපෘතිය. IV

මසුන් ආනම් නියැදි ගබඩා ගත කිරීමේ අත්හදා බැලීම්.

ඒවායේ තත්ත්ව වෙනස්වීම් ක්ෂුද්‍ර ජීව විද්‍යාත්මකව හා රසායනිකව අධීක්ෂණය කරන ලදී. මෙම සමීක්ෂණවල ප්‍රතිඵල ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමයේ වාර්ෂික සැසි වාරයේ දී ඉදිරිපත් කරන ලදී. එම ප්‍රතිඵල වාර්තාව " ශ්‍රී ලංකාවේ පියු මසුන් ආනම් රසායනිකව හා ක්ෂුද්‍ර ජීව විද්‍යාත්මකව අධ්‍යයනය කිරීම" යන හිසින් සකස්කළ එකකි.

මෙම ව්‍යාපෘති කටයුතු භාර ගනු ලැබුවේ එම්.එච්.මොහිදීන් විසිනි.

ව්‍යාපෘතිය: V

ඉස්සන්ගෙන් ඉවත ලන ද්‍රව්‍ය වලින් "කයිටීන්" නිස්සාරණය කර ගැනීම.

ඉස්සන්ගෙන් ඉවත ලන ද්‍රව්‍ය වලින් කයිටීන් නිස්සාරණය කර ගැනීම පිළිබඳව පරීක්ෂණ අවසන් කොට වාර්තා ගත කරන ලදී. පොකිරිස්සන් වර්ග 3 කින් හා ඉස්සන් වර්ග 3 ක කටු සුන් බුන් වලින් කයිටීන් ද නිස්සාරණය කර ගන්නා ලදී.

ව්‍යාපෘතියේ වැඩ කටයුතු භාරගනු ලැබුවේ වයි. නාමරත්න විසිනි.

ව්‍යාපෘතිය: V

කූනිස්සන්ගේ ව්‍යාධි ජනක ශාඛාණු ඩිඑන්ඒ ප්ලාස්මිඩ හරස් කැපුම්.

කූනිස්සන් නියැදි 120 කට ආසන්න ගණනක් ව්‍යාධිජනක ශාඛාණු සඳහා පරීක්ෂණවලට භාජනය කරන ලද අතර වෙන්වූ කොටස් ප්ලාස්මිඩ හරස් කැපුම් වලට පෙරාතුව ක්ෂුද්‍ර ජීව විද්‍යාත්මකව ලක්ෂණය කරන ලදී. මෙම පර්යේෂණ අධ්‍යයනය භාරගනු ලැබුවේ පැළි ආචාර්ය උපාධි ක්ෂේත්‍ර වැඩ සටහනක් සඳහාය.

පර්යේෂණ කටයුතු භාර ගනු ලැබුවේ ටී.එස්.පී. පොන්සේකා විසිනි.

ව්‍යාපෘතිය : VI.

සමාලෝචනයට භාජනය වන කාල සීමාව තුල මෙම ආයතනය විසින් කර්මාන්තය සඳහා කාර්යක්ෂම සේවාවක් සලසන ලදී. ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය සඳහා මුහුදු ආහාර නියැදි 80 කට කිට්ටු ගණනක් විශ්ලේෂණය කරන ලදී. පෞද්ගලික අංශය සඳහා මසුන් සහ මත්ස්‍ය නිෂ්පාදන නියැදි 30 ක් පමණ විශ්ලේෂනය කරන ලදී. මේ අතර ශීත කළ ඉස්සන් වර්ග, පොකිරිස්සන් වලිග, කකුළුවන්, දුම්ගැසූ කෙලවල්ලා, සහ මෝරා, පොතු දැල්ලන් සහ මත්ස්‍යාහාර ආදියද විය. මෙම නියැදි ව්‍යාධිජනකයන්, රසදිය සහ වෙනත් රසායනික පරාමිති සඳහා විශ්ලේෂණය කරන ලදී.
ලංකා ධීවර සංස්ථාවට ද නියැදි විශ්ලේෂණය කරන ලදී. ලංකා ධීවර සංස්ථාවට සහ පෞද්ගලික සමාගම් ගණනාවකටම උපදෙස් සේවා සලසන ලදී.

ව්‍යාපෘතිය VII.

ව්‍යාප්ති කටයුතු:

1990 වර්ෂය තුල පහත සඳහන් ව්‍යාප්ති කටයුතු නිම කරන ලදී.

1. මසුන් හඳුනා ගැනීම හා උම්බලකඩ නිශ්පාදනය පිළිබඳව වූ අත් පත්‍රිකා 5000 කට අධික ගණනක් පිළියල කොට බෙදා හරින ලදී. මේවා බෙදා හැරියේ අමාත්‍යාංශ ජංගම සේවා ස්ථානවල් දී ය.
2. ඉස්සන්/පොකිරිස්සන් සැකසුම් කර්මාන්ත ශාලාවල පරීක්ෂණ මණ්ඩල කටයුතු සඳහා ආයතනය සක්‍රියව සහභාගී වන ලදී.

41 ....

3. 1990 වසර තුල කර්මාන්තශාලා 16 ක මෙවැනි පරීක්ෂණ මෙහෙයවන ලදී. ආයතනයේ නිලධාරීහු කෘෂිකාර්මික ආහාර නිෂ්පාදන ප්‍රාදේශීය කමිටුව( SLSI ) ටින්කළ මසුන්ගේ ප්‍රමිති සඳහා ගැනමේ කමිටුව ( SLSI ) උම්බලකඩ ප්‍රමිති කමිටුව( SLSI ) මුහුදු මසුන් සැකසුම් කර්මාන්තශාලාවල පරීක්ෂණවලදී සංකටක හා වැදගත් දෝෂ හඳුනාගැනීම ( SLSI ) සහ මුහුදු ආහාර උපදේශක කමිටුව (SLSI ) ආදී විවිධ කමිටුවලට ස්ක්‍රියව සහභාගී වූහ.

4. සෞඛ්‍ය අමාත්‍යාංශයේ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් 120 කට පමණ පෙර අස්වනු තාක්ෂණයට සම්බන්ධ විෂයයන් පිළිබඳව මෙම ආයතනයේ නිලධාරීහු දේශණ පැවැත් වූහ.

5. ධීවර පරීක්ෂකවරුන් සඳහා මසුන් පරිහරණය හා කල්තබා ගැනීම පිළිබඳ පොත් පිංචක් මෙම අංශයේ නිලධාරීන් විසින් සකස් කරනු ලැබීය. මෙම පොත ධීවර අමාත්‍යාංශයේ පුහුණු ව්‍යාප්ති අංශය විසින් මුද්‍රණය කරනු ඇත.

## ප්‍රකාශණ ,නිබන්ධන සහ වාර්තා:

1. " ඉහල ලවණතා පැසීමක දී කුඩා කරමල දැල් මසුන් ගේ ජෛව රසායනික සහ ක්ෂුද්‍ර ජීව විද්‍යාත්මක වෙනස්වීම් "

   " පෙර අස්වනු තාක්ෂණය,දකුණු නැගෙනහිර ආසියාවේ මසුන්මල තත්ත්වය හා සංරක්ෂණය" අන්තර් ජාතික විද්‍යා පදනම,රයිලි,පීජේඑ,පුණ්,ආර්.ඩබ්.එච්. සහ බරසිල් එල්.ජ. අන්තර් ජාතික ඌත් සංගමය, ස්ටොක්හෝම්, ස්වීඩනය (1990) පිටුව 54 - 62

   එස්.සුබසිංහ ,එම්.එස්.මොහිදීන් සහ එස්.විදානපතිරණ විසිනි.

2. "සැකසුම් කාලය තුල ඉස්සන්ගේ ක්ෂුද්‍ර ජීව විද්‍යාත්මක වෙනස් වීම්" මසුන් තාක්ෂණය සහ අලෙවිය පිළිබඳව අන්තර් පැසිපික් ධීවර කොමිසමේ වැඩ කණ්ඩායමේ හත් වැනි සැසි වාරයේ සටහන් වාර්තාවකි. ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ ධීවර වාර්තාව අංක 101 (1990) අතිරේකය පිටුව 57.

   වී.ජයවීර සහ එස්.සුබසිංහ විසිනි.

3. " ඉස්සන් තෙත් ගබඩාතුල තිබෙන විට ඇතිවන ක්ෂුද්‍ර ජීව විද්‍යාත්මක වෙනස් වීම් " මසුන් තාක්ෂණය හා අලෙවිය පිළිබඳ අන්තර් පැසිපික් ධීවර කොමිෂමේ හත්වැනි සැසිවාරයේ සටහන් වාර්තාවකි. ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ ධීවර වාර්තාව අංක 101( 1990) අතිරේකය පිටුව 268.

   වී.ජයවීර සහ එස්.සුබසිංහ විසිනි.

42....

3. " රික්ත ඇසුරුම්කළ රශ්මි ජීවාණුහරණය කළ කාණු ගැසු කුඩා කරමල දැළි මසුන් සාමාන්‍ය ශීතෝෂ්ණ ප්‍රමාණයේ දී " මසුන් තාක්ෂණය හා අලෙවිය පිළිබඳ අන්තර් පැසිපික් කොමිෂමේ වැඩ කණ්ඩායමේ හත්වැනි සැසිවාරයේ සටහන් වාර්තාවකි. ආහාර හා කෘෂි කාර්මික සංවිධානයේ ධීවර වාර්තාව අංක 401( 1990) – එස් සුබසිංහ සහ පී. විද්‍යාපතිරණ විසිනි.

4. " රික්ත ඇසුරුම්කළ කාණු ගැසු සාඩින් මසුන්ගේ රාක්ක කාලසීමාව හා ශාබාණු ගොමු පිළිබඳ ව පෙටෙසියම් සෝබිට් ප්‍රති විපාක හා ප්‍රතිවිකරණය හා ලුණු දැමීම " ( නාරා සඟරාවේ 31 වෙනි වෙළුමේ ප්‍රසිද්ධ කිරීම සඳහා භාර ගන්නා ලදී ) – එච්.එන්.වීතිවාසගම් , එස්.සුබසිංහ සහ පී. විද්‍යාපතිරණ විසිනි.

5. " වෙරළට ඔබ්බෙන් ඇල්ලූ මසුන් කල්තබා ගැනීම හා අලෙවිය " 1990 පෙබරවාරි මස පැවැති ශ්‍රී ලංකාවේ වෙරළට ඔබ්බෙන් ධීවර කර්මාන්තය යන මැයෙන් බෙන්ගාල බොක්ක වැඩ සටහන යටතේ වූ සම්මන්ත්‍රණයක සටහන් වාර්තා වකි. – පිටු 88 – 100 – එස්. සුබසිංහ විසිනි.

6. " ශ්‍රී ලංකාවේ මුහුදු පැලෑටි කර්මාන්තය " බෙන්ගාල බොක්ක වැඩ සටහන මගින් ළඟදීම ප්‍රසිද්ධ කිරීම සඳහා ඉදිරිපත් කළ පත්‍රිකාවකි.

– එස්.සුබසිංහ සහ ඒ.ජයසූරිය විසිනි.

7. " දකුණු ආසියානු ප්‍රදේශයේ මුහුදු පාරිසරික තත්ත්වය " යූඑන්ඊපී ප්‍රාදේශීය මුහුදු වාර්තා හා අධ්‍යයන අංක.123 (1990)

– ආර්.සෙන්ගුප්ත සහ එස් . සුබසිංහ විසිනි.

8. " ශ්‍රී ලංකා වේ ඉස්සන් ගේ ඉවත ලන ද්‍රව්‍ය ප්‍රයෝජනයට ගැනීමේ සම්භාව්‍යතාවය " වාර්තාව ප්‍රසිද්ධ කිරීම සඳහා බෙන්ගාල බොක්ක වැඩසටහනට ඉදිරිපත් කරන ලදී. – ඇස්.සුබ සිංහ, වයි. තාමරත්න, සහ එම්.පෙරේරා විසිනි.

9. " ශ්‍රී ලංකාවේ පැසවූ මසුන් ආනම් පිළිබඳ රසායනික හා ක්ෂුද්‍ර ජීව විද්‍යාත්මක අධ්‍යයන " ශ්‍රී ලංකා විද්‍යාභි වර්ධන සංගමය 1990 – එම්.එච්.මොහිදීන් එස්.සුබසිංහ සහ පී.එස්.විද්‍යාපතිරණ විසිනි.

10. "ශ්‍රී ලංකාවේ බෙල්ලන් වර්ගයේ කටු මසුන්ගේ තත්ත්වය" – එන්.වීතිවාසගම්, සහ එම්.එච්.මොහිදීන් විසිනි. වාර්තාව නාරා ආයතනයට ඉදිරිපත් කරන ලදී.

11. නාරා ආයතනය විසින් " මසුන් පරිහරණය හා කල් තබාගැනීම " යන මැයෙන් පොත් පිංචක් සකස්කොට ප්‍රසිද්ධ කිරීම සඳහා ධීවර අමාත්‍යාංශයට ඉදිරිපත් කරන ලදී. – එම්.එච්.මොහිදීන් සහ එම්.පෙරේරා විසිනි.

12. " මසුන්ගේ විෂ සහිත කොටස් " යන්නෙන් වාර්තාවක් සකස් කොට නාරා ආයතනයට ඉදිරිපත් කරන ලදී. ශ්‍රී ලංකාවේ ජලජ සම්පත් කළමනාකරණයේ පළමු දසවසරක ප්‍රගතිය නිමිත්තෙන් පළ කිරීම පිණිසයි ඒ. – එස්.වයි. තාමරත්න විසිනි.

43......

13. " ශ්‍රී ලංකාවේ අලෙවි කරනු ලබන මසු න් වර්ග හයක මේ ද අම්ල හරස් තැ පුම් " - සී.වී.ලියනගේ , ජූලි. 1990.
කැලණිය විශ්ව විද්‍යාලයේ ශාස්ත්‍රපති උපාධිය සඳහා ලියූ ප්‍රවාදයකි.

14. " කණිස්සන්ගේ රසදියවල ජෛව එකතුවීම් සංසන්දනය " - එස්.එල්.ගිහිගේ නොවැම්බර් 1990. ශ්‍රී ජයවර්ධන පුර විශ්ව විද්‍යාලයේ ශාස්ත්‍රපති උපාධිය සඳහා සැකසුණු ප්‍රවාදයකි.

## පුහුණු වැඩ සටහන්, සම්මන්ත්‍රණ සහ වැඩ මුළුවලට සහභාගී වීම.

1990 නොවැම්බර් 05 - 17 දින දක්වා ඉන්දියාවේ කොචින් නුවර පැවැති මසුන් පරීක්ෂා කිරීම හා තත්ත්ව රක්ෂණය මැයෙන් පුහුණු වැඩ සටහනකට ආචාර්ය. එස්.වයි. නාණයක්කාර සහභාගී විය.

1990 අගෝස්තු 27 - 31 දින දක්වා ලන්ඩන් නුවර පැවැති තෙල්අපවිත්‍ර වන්දි සමුළුව හා විධායක කමිටු රැස්වීමට ආචාර්ය එස්.සුබසිංහ සහභාගී විය.

1990 ජූලි මස සති 03 ක් පුරා චීනයේ මුහුදු පැලෑටි වගාව හා සැකසුම පිළිබඳව පැවැති ප්‍රාදේශීය පුහුණු පාඨමාලාවට මාලා පෙරේරා සහභාගී වූවාය.

## ප්‍රවෘත්ති අංශය - 1990 වාර්ෂික ප්‍රගති වාර්තාව.

## ජන මාධ්‍ය සම්බන්ධතා වැඩ මුළුව.

ප්‍රවෘත්තිපත්‍ර හා ජන මාධ්‍ය නියෝජිතයින් රාශියක් සහභාගී වූ ජන මාධ්‍ය වැඩමුළුවකින් මෙම වර්ෂයේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී. මෙම සමුළුවට සහභාගී වූ ගරු ඇමතිතුමා මහජනතාවගේ ප්‍රයෝජනය සඳහා ස්වකීය පර්යේෂණ වලින් ලබා ගන්නා විද්‍යාත්මක දැනුම දේශීය භාෂාවලින්ම ලියා එවුනට දැනුම ලබාදෙන ලෙස නාරා පර්යේෂණ නිලධාරීන්ගෙන් ඉල්ලා සිටියේය. මෙම රැස්වීමේ දී නාරා ආයතනයේ ක්‍රියා කටයුතු ඉතා පුළුල් ලෙස ජන මාධ්‍ය වේදීන්ගේ සිත් ඇද ගන්නා සුළු වූ අතර නාරා ආයතනයේ ඒ ඒ අංශ වලින් සිදුවන ඉමහත් මෙහෙවර වාර්තාකරුවන් රැසකගේ විමර්ශණ වලට ද හේතුවිය. ව්‍යාප්ති ඒකකය මගින් සංවිධානය කරන ලද විස්තරාත්මක සම්මුඛ සාකච්ඡා මාලාවක් මගින් නාරා ආයතනයේ විද්‍යාඥයින් ගණනාවක් පිළිබඳව විදුසර විද්‍යා සඟරාව විසින් ආවරණය කර තිබිණ.

අධ්‍යාපනික වීඩියෝ චිත්‍රපට නිෂ්පාදනය.

වර්ෂයේ පළමු කාර්තුව තුලදී ව්‍යාප්ති ඒකකයේ සහ ජාතික මුහුදු ක්ෂීරපායි වැඩසටහනේ සේවක පිරිස ද එක්ව සිංහල හා ඉංග්‍රීසි භාෂා වලින් අධ්‍යාපනික හා ව්‍යාප්ති කටයුතු පිළිබඳ වීඩියෝ වැඩ සටහන් ගණනාවක් නිෂ්පාදනය කරන ලදී.

ප්‍රථමයෙන් "සංස්කරණ මැදිරියක්" සකස් කිරීමේ කටයුතු ආරම්භ කරන ලදී. මේ සඳහා අලුතෙන්ම ලැබුණු ශ්‍රව්‍ය මිශ්‍රකය, විශේෂ සාධක පෙනරේටරය, සහ මොනිටර් දෙක ද " යූ මැටික්" පටිගත කරන යන්ත්‍රය සහ හයි බෑන්ඩ් කැමරාව, වීඑච්ඇස් කැමරාව සහ කුලියට ලබාගෙන ඇති ශ්‍රව්‍ය කැසට් රෙකෝඩරය සහ පරණ වීඑච්එස් ඩෙක් යන්ත්‍රය ද සමග අඩා" වෙස්ටිශේෂනයක් ලෙස සකස් කර ගන්නා ලදී. අනතුරුව අධ්‍යාපනික කටයුතු සඳහා වීඑච්එස් වැඩ සටහනක් සම්පාදනය කරන ලදී.

ඒකකයේ සේවක පිරිස විසින් වීඑච්එස් කැමරාව සඳහා සුළං කාන්දු නොවන ආවරණයක් වන යේ අවශ්‍ය මැදිරියේ විදුලි රැහැන් ද ලී වැඩ කටයුතු ද මනාව අවසන් කරන ලදී. වීඩියෝ පටිගත කිරීම සඳහා රූපික අවශ්‍යතාවයන් සැපයීම සඳහා සුවිත්‍රික සහ සිත්තම් නිෂ්පාදනය ද ආරම්භ කරන ලදී. කථනය දෙබස් ලිවීම, නිෂ්පාදනය, පටිගත කරන යන්ත්‍ර ක්‍රියාකරණය, විදුලි ආලෝකය සහ කැමරාව හැසිරවීම පිළිබඳ වෘත්තිමය පුහුණුවක් ව්‍යාප්ති නිලධාරියාගේ ද ආධාරය ද ඇතිව සංස්කරණ පිරිසට ලබා දෙන ලදී.

ශ්‍රව්‍ය හා දෘශ්‍ය සංස්කරණය, විශේෂ කාර්යයන්, ශ්‍රව්‍ය සුවිත්‍රිත හා ශ්‍රව්‍ය නම් පෙළ සැකසීම ආදී පිළිබඳව ඒ කක සාමාජිකයින් විසින් පරීක්ෂණ මෙහෙයවන ලදී.

මෙම ව්‍යායාමයෙහි ප්‍රතිඵලය නම් පහත සඳහන් අධ්‍යාපනික වීඑච්එස් වීඩියෝ වැඩ සටහන් නිෂ්පාදනය කිරීමය.

1. එන්කවුන්ටර්ස් - මෙය ලංකාවේ තල්මසුන් හා ඩොල්ෆින් මසුන් මුලින්ම මුණගැසීම හා ජාතික මුහුදු ක්ෂීරපායි මසුන් වැඩසටහන පිළිබඳව වූ වාර්තාවකි.

2. සයුරේ අපේ නෑයෝ - එන්කවුන්ටර්ස් වීඩියෝ වාර්තා චිත්‍රපටයේ සිංහල පිටපත

3. සැඟවුණු සම්පත් - බෙල්ලන් වගා කරන්නේ කෙසේ ද ?

4. වඳවන පොකිරිස්සන්- ප්‍රමාණයට වඩා පොකිරිස්සන් අල්ලා ගැනීම පිළිබඳ වාර්තා චිත්‍ර පටයකි.

5. ව්‍යාප්ති අංශය - ව්‍යාප්ති අංශයේ කාර්යභාරය විස්තරකෙරන්නෙකි.

6. සයුරේ ගොවිබිම- කල්පිටියේ මුහුදු ගොවිපල හා මුහුදු පැලෑටි හා බෙල්ලන් වගාව පිළිබඳ නවීකරණයන්.

45 ....

අන්තර්ජාතික ප්‍රේක්ෂකයින් හා ආධාර ඒජන්සි ආයතන සඳහා තිරගත කිරීමට. මින් අවසන් චිත්‍රපට තුනේ ඉංග්‍රීසි පරිවර්තන වැඩ කටයුතු නිම කොට ඇතත් නාරා ආයතන සතු වීඩියෝ උපකරණ අමාත්‍යාංශයට ගෙන ගොස් ඇති බැවින් එම චිත්‍රපටවල නියමිත හඬ කැවීම කටයුතු මෙතෙක් අවසන් වී නොමැත.

වීඩියෝ ආවරණයන්:

මෙම කාර්තුවේ දී පහත සඳහන් වීඩියෝ ආවරණයන් කරන ලදී.

ජනවාරි 2 - බේරේ වැවේ මසුන් සුපෝෂිකරණය.

9 - මාද්වංගි වගාව්‍යාපෘතිය හා මුහුදු ජීව විද්‍යා අංශයේ රසායනාගාරයේ කටයුතු.

12- නාරා සේවක මණ්ඩලය හමුවේ රාජ්‍ය ඇමතිතුමා පැවැත්වූ දේශණය.

17- පුරතල් මසුන් බෝ කිරීමේ පංතිවල ප්‍රගතිය.

25- ජනමාධ්‍ය සම්බන්ධීකරණ වැඩ මුළුව සඳහා ගරු ඇමතිතුමා නාරා ආයතනයට පැමිණීම.

26- මුහුදු සම්පත් මධ්‍යස්ථානයේ අදහස්

පෙබරවාරි04 - නිදහස් දින ගරු ඇමතිතුමා බෝලවලානට පැමිණීම.

10- තංගල්ලේ පොකිරිස්සන් සංරක්ෂණය කිරීම පිළිබඳ සම්මන්ත්‍රණය.

11- ගරු ඇමතිතුමා හැඳුරට පැමිණීම.

12- පීටීඉසෙඩ්/ එන්එච්ඩී කළුතර සම්මන්ත්‍රණය.

16- නාරිගම සහ සීනිගම තෙල් අපවිත්‍රවීම.

17- අමාත්‍යාංශයේ ජංගම සේවය - ගලාවත. ගරු ඇමතිතුමා සහභාගී වීම.

18- අමාත්‍යාංශ ජංගම සේවා කටයුතු

20- මෝදර වැල්ලේ ගිනි තැබීමෙන් වැල්ලේ පාරිසරික විනාශය.

28 - පොකිරිස්සන් කෞතුකාගාර ප්‍රදර්ශන භාණ්ඩ ලෙස සාදා ගැනීම.

මාර්තු 01- ගරු ඇමතිතුමා රාගමට පැමිණීම

03- ගරු ඇමතිතුමා බේරුවල අමාත්‍යාංශ ජංගම සේවාවේ දී

04- අමාත්‍යාංශ ජංගම සේවා කටයුතු

09- ධීවර ව්‍යාප්ති නිලධාරීන් සඳහා සමුද්‍ර විද්‍යා සම්මන්ත්‍රණය.

13- ගරු ඇමතිතුමා කල්පිටියේ පැවැති සම්මන්ත්‍රණයට සහභාගීවීම.

14- කන්දකුලියේ කොළල්පර වෙරළ සහ ලවණ මඩ ගොහොරු පරිසරය.

20- මුහුදු පුරා විද්‍යා කණ්ඩායම ගාලු මුවදොර ඇති විනාශවී ගිය නැව සමීක්ෂණය කිරීම.

22- මුහුදු පුරා විද්‍යාව පිළිබඳ මාර්ක් රෙඩ් නැප්ස් ඉදිරිපත් කිරීම.

22- තාරා වාඩියේ දී මුහුදු ආහාර සංග්‍රහයක්.

26- දෙහිවල දී තල්මසෙකු ගොඩ ගසාගෙන ඒම සහ ජාතික මුහුදු ක්ෂීර පායි වැඩ සටහනේ මුදවා ගැනීමේ කටයුතු.

මින් අනතුරුව වීඩියෝ කැමරාවන් පටිගත කරන යන්ත්‍රයන්, ප්‍රථමයෙන් ගුවන් මඟ දාවත් දෙවනුව ගරු ඇමතුමා විසිනුත් ඉල්ලුම් කරන ලදුව ගෙන ගොස් තිබෙන බැවින් කිසිම වීඩියෝ ආවරණ කටයුත්තක් තාරා ආයතනයට කළ නොහැකි විය.

ජාතික ප්‍රවෘත්ති.

මෙම කාර්තුවේ දීට තාරා වීඩියෝ ඒකකයේ සේවක පිරිස විසින් එහි වීඩියෝ උපකරණ භාවිතා කරමින් පහත සඳහන් වීඩියෝ වැඩ සටහන් සම්පාදනය කරන ලදී. ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ ප්‍රවෘත්ති විකාශන මගින් ඒවා විකාශණය කරනු ලැබීය.

ජනවාරි 27 - තාරා ආයතනයේ ජන මාධ්‍ය සම්බන්ධීකරණ වැඩ මුළුව ආරම්භ කිරීමේ දී විද්‍යාත්මක සොයාගැනීම් දේශීය භාෂා වලින් ප්‍රචලිත කරන ලෙස ඉල්ලා සිටීමේ අවස්ථාව.

පෙබරවාරි 13 - ගරු ඇමතිතුමා පීටීඑසෙඩ්/එන්එච්ඕ සම්මන්ත්‍රණය කළුතරදී ආරම්භ කරන අවස්ථාව.

මාර්තු 23- ගරු ඇමතිතුමා කල්පිටියට පැමිණීම සහ කල්පිටියේ තාරා මධ්‍යස්ථානයේ වැඩ කටයුතු.

26- ජාතික මුහුදු ක්ෂීර පායි වැඩ සටහන විසින් දෙහිවල වැල්ලෙන් ගැහැණු තල්මසෙකුගේ ඇට සැකිල්ල සොයාගැනීම.

47 ....

## වීඩියෝ පැරණි ලේඛණාගාර .

වසරේ පළමු හා දෙවැනි කාර්තුවේ දී 1987 සිට මේ දක්වා පටිගත කරන ලද 250 ක් පමණ වූ සියළුම වීඩියෝ පටිවල නම් සටහන් කිරීම, සූචි ගත කිරීම, ඉන්වෙන්ට්‍රි ග ත කිරීම සහ පරි ගණක ගත කිරීම ආදී සියලුම කටයුතු අවසන් කරන ලදී.

නාරා ලේඛනාගාරය සඳහා " ද ඉන්ඩියන් ඕෂන් අ ෂෙයාර්ඩ් හෙරිටේජ් " ඇන්ඩ් වන්ඩර්ස් ඔෆ් ද ඕෂන් " නම් වැඩ සටහන් දෙකක් ද ඩොල්පින් ඇල්ලීම සහ ආර්ව් සමුද්‍ර මාරු යාත්‍රාවේ චාරිකාවක විස්තර ද යන විකාශ පට දෙකක් ද නිෂ්පාදනය කරන ලදී. වෙනත් වැඩ සටහන් දෙකක වීඩියෝ පටි ද විදේශාධාර නියෝජිතායතන වලින් ලැ බී ඇත.

## චිත්‍ර පට දර්ශන:

ව්‍යාප්ති ඒකකයේ නිශ්පාදනයන් දෙකක් වන "වේල් විල් තොට් " සහ 'එන්කවුන්ටර්ස්" නත වීඩියෝ චිත්‍ර පට ඓක කළුතර දී මහජනයා සඳහා පෙන්වන ලද අතර ජන සන්නිවේ දන වැඩ මුළු වේ දී හා හලාවත අමාත්‍යාංශ ජංගම සේවා ස්ථානයේ දී තිර ගත කරන ලදී. "සයුරේ ගොවිබිම" චිත්‍රපටය කල්පිටියේ දී තිර ගත කරන ලදී. මෙම වීඩියෝ චිත්‍රපට නාරා ආයතනයට පැමිණි අමුත්තන් සහ පාසල් ළමුන් සඳහා ද තිර ගත කරන ලදී.

## වීඩියෝ මැදිරිය.

මෙම කාල සීමාව තුල දී නාරා ආයතනයට නව වීඩියෝ පටිගත කිරීමේ හා සංස්කරණ කිරීමේ පහසුකම් ඇතිකර ගැනීමේ අදහසින් පාලක මණ්ඩලයේ ලේකම් සඳහා කලින් වෙන් කො ට තිබුණු කාමරයක් ව්‍යාප්ති ඒකකයට වෙන් කර තිබුණු ඉඩකඩත් එකට සම්බන්ධකර අ ංග සම්පූර්ණ වීඩියෝ මැ දිරියක් සාදා ගැ නීමේ කටයුතු නිම කරන ලදී. මීට අදාලව යෝජිත වායු සමීකරණ පද්ධතියේ හා කාර්යාල ව්‍යුහයේ අවශ්‍ය වෙනස් කම් කිරීම සඳහා අධ්‍යක්ෂ, සේවා හා මෙහෙයුම් සමග සාකච්ඡාද පවත්වන ලදී. මේ සඳහා මුදල් ද වෙන් කොට ඇත.

## ශිල්පීය කටයුතු හා සුවිත්‍රිත

අවශ්‍යයෙන්ම තිබිය යුතු උපකරණ ලබා ගැ නීමෙන් හා ශිල්පීය කටයුතු කාර්ය සාධන ගොඩ නගා ගැනීමට සැහෙන වෙහෙසක් මෙම කාලය තුළ දරණ ලදී. චිත්‍ර පට සඳහා ශිල්පීය උපකරණ හා සුවිත්‍රිතයන් සැපයීමට අමතරව පහ. සඳහන් ප්‍රධාන වැඩ කොටස් නිම කිරීමට භාර ගන්නා ලදී.

48 ....

1. ඉන්දියානු සාගර මුහුදු කටයුතු සහයෝගීතාවයේ කාර්යාලය මගින් අන්තර් ජාතික වශයෙන් පළ කිරීම සඳහා කෙළවල්ලා පෝස්ටරයක් සැලසුම් කිරීම. " ටූනා ඔන් ද ඉන්ඩියන් ඕෂන් " නම් කෙළවල්ලා මසුන් වර්ග හඳුනාගැනීම සඳහා වූ මෙම පෝස්ටරයේ වායුබුරුසු කිරීම්, ඇලවීම් සහ අවසන් නිමාව සහ එහි සම්බන්ධීකරණ කටයුතු ප්‍රසිද්ධ කිරීමේ වැඩ හා මිළගණන් කැඳවීම් වැඩ ද ඊට ඇතුලත් විය.

2. මසුන්ගේ චිත්‍ර විශේෂ කට්ටලයක් සඳහා පීලාවා මසුන් පින්තාරු කිරීම

3. කෙළවල්ලා ටැග් කිරීම, පොකිරිස්සන්, කොරල් සහ ඩොල්පින් මසුන් සම්බන්ධ මුහුදු සංරක්ෂණ පණිවුඩ ප්‍රචාරය පිණිස ටී ෂර්ට් සැලසුම් කිරීම.

4. පොකිරිස්සන් කළමනාකරණ ප්‍රයත්නයක් වශයෙන් පාසල්වල හා වෙරළ බඩ ගම්වලට බෙදා හැරීමට පොකිරිස්සන් සංරක්ෂණය කිරීම පිළිබඳ පෝස්ටරයක්/නැම් අත්පොතක් සැලසුම් කිරීම.

5. ස්වාභාවික උරුමයන් පෙළක් වශයෙන් කොරල් පර පෝස්ටරයක් සකස් කිරීම සඳහා වෙරළ බඩ පරිසර පද්ධති සමීක්ෂණයට ආධාරයක් වශයෙන් සැලැස්මක් පිළියල කිරීම.

කොරල් සහ කෙලවල්ලන් සඳහා වූ පෝස්ටර් කටයුතු සංවර්ධනය කිරීමේ කටයුතු මේ අයුරින් කෙරීගෙන ගිය අතර මසුන් පින්තාරු කිරීම හා ටී ෂර්ට් නිෂ්පාදනය කිරීමට නොහැකි විය. මෙම කටයුතු සඳහා මුදල් නොමැති හෙයිනි.

වෙනත් වැඩ කටයුතු අතර ,

ත්‍යාග වශයෙන් පිරි නැමීම සඳහා චිත්‍ර කාර්මික පෝර්ට් පෝලියාවක් සංස්කරණය කිරීම.

මසුන් ඇල්ලීමේ ක්‍රම පිළිබඳව සැකසුණ පත්‍රිකාවක් ඉදිරිපත් කිරීම සඳහා පාරදෘශ්‍ය කට්ටලයක් සහ පාරිසරික පත්‍රිකාවක් සඳහා තෙත් ඉඩම් හා කොරල්වල ඡායා රූප ද සමුද්‍ර විද්‍යාත්මක අංශයට සපයන ලදී.

මුහුදු සම්පත් මධ්‍යස්ථානයේ ආදර්ශ මසුන් ප්‍රදර්ශකයක් සඳහා විචක්‍ෂ ජලයේ මසුන් පිළිබඳ හඳුනාගැනීමේ උපදේශකයක්.

කෙලවල්ලා මසුන් පිළිබඳ සිතියම් තුනක්

මුහුදු පැලෑටි වගාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ මෙනෙවියගේ වාර්තාව සඳහා මුහුදු පැලෑටි ගැන නිදසුන්.

පාරිසරික සේවා ඒකකය සඳහා අපවිත්‍රවීම පිළිබඳ සුචිත්‍රිතයන්

ආචාර්ය ඇස්.වික්‍රමරත්න විසින් රචිත පාරිසරික ප්‍රකාශනය සඳහා නිදසුන්.

උම්බලකඩ සාදා ගැනීමේ තාක්ෂණය පිළිබඳ කුඩා පොත් පිංචක් සඳහා නිදසුන්.

මුහුදු පැලෑටි පිළිබඳ ජ්‍යෙෂ්ඨ මෙහෙවිය විසින් බැංකොක් නුවර දී ඉදිරිපත් කරන ලද පත්‍රිකාව සඳහා නිදසුන් සහිත පාර දෘෂ්‍ය කට්ටලයක්

පීටීඉයෙඩ්/එන්එච්ඕ සම්මන්ත්‍රණයේ දී ඉදිරිපත් කළ පත්‍රිකාව සඳහා සමුද්‍ර විද්‍යාවේ පරිණාමය විදහා දක්වෙන නිදසුන් සහිත පාර දෘෂ්‍ය කට්ටලයක් (කාටූන්)

ව්‍යාප්ති ඒකකයේ ඉදිරිපත් කිරීමක් සඳහා නිදසුන් සහිත පාර දෘෂ්‍ය කට්ටලයක් (කාටූන්)

" ධීවර තාක්ෂණය - ව්‍යාප්ත කිරීමේ විෂය ප්‍රමාණය" පිළිබඳව සේවා හා මෙහෙයුම් අංශයේ ඉදිරිපත් කිරීමක් සඳහා ක්‍රමාලිප්ත පාට පාර දෘෂ්‍යයක්.

පාරිසරික සේවා ඒකකයට බිත්තිමය සැලැස්මක්.

සමුද්‍ර විද්‍යා අංශයට ලෝගෝවක්

ධීවර අභ්‍යාස ආයතනයට ලෝගෝවක්

වීඩියෝ නිෂ්පාදන හයකට අවශ්‍ය සියලුම චිත්‍ර කර්ම වැනි මාතෘකා නාම සහ සම්මාන නාම.

## ජීවමාන ප්‍රමාණයේ ප්‍රදර්ශක ආදර්ශ.

මුහුදු සත්ත්වයින් පිළිබඳ ලැදිකමක් ඇතිකරවීම පිණිස අධ්‍යාපනික ආයුධයක් ලෙස සැලසුම් කරන ලද මේවා නාරා ආයතනයේ ආදර්ශක සඳහා තැනූ ඒවාය. මින් සමහර ඒවා නාරා ආයතනයේ ක්‍රියා කටයුතු විදහා දැක්වීම් වස් 1990 ජාතික දින පෙරහරේ දී ප්‍රදර්ශක භාණ්ඩ ලෙස පාවිච්චි කිරීම සඳහාය.

**ෆයිබර් ග්ලාස් ආදර්ශක** - මුහුදු සම්පත් මධ්‍යස්ථානයේ මුහුද යට වෙයෙන්නෝ

| | |
|---|---|
| මුදු ඌරා ප්‍රතිමා කට්ටල | 02 |
| ඩොල්පින් ප්‍රතිමා කට්ටල | 02 |

සේල්ෆිෂ්, බ්ලැක් මාර්ලින්, ස්වෝඩ් ෆිෂ්, බ්ලූ මාර්ලින්, ස්ට්‍රිප්ඩ් මාර්ලින්, යෙලෝ ෆින් ටූනා, මෝරා, කබර පරවි, ස්කිප් ජැක් ටූනා (07 යි), තෝරා (02 යි) ග්‍රූපර්, ලේට්ස් (03 යි)

50 ......

**ප්ලාස්ටර් ඔෆ් පැරිස් සහ ටිම් පෝර්ට් පටිටාශ ආදර්ශ.**

කප්පරහොට මුහුදු තීරුව බිම් සැලැස්ම පරිමාණ ආදර්ශය

කඩොල්කැලේ බිම් සැලැස්ම පරිමාණ ආදර්ශය

ශ්‍රවණාගාරය සඳහා නාරා ලෝගෝව

පිළිගැනීමේ ප්‍රදේශය සඳහා නාරා ලෝගෝව.

මීට අමතරව නාරා ආයතනය අවට ප්‍රදර්ශක සඳහා ඡායාරූප සහපෝස්ටර් මාලාවක් ද නාරා සේවක පිරිස විසින් රැස් කරන ලදී.

**මාරිස් ව්‍යාපෘතිය.**

දෙවන කාර්තුවේ දී මාරිස් ව්‍යාපෘතිය සම්බන්ධයෙන් නාරා ආයතනයේ ප්‍රවෘත්ති අංශය පරීක්ෂාකළ අයිඩීආර්සී වැඩසටහන් නිලධාරී ඩෙනිස් ල'ක්ලෙයාර් මහතා සමග පැවැත්වූ සාකච්ඡාවකින් පසුව ව්‍යාප්ති නිලධාරී වැඩ බලන අධ්‍යක්ෂ ප්‍රවෘත්ති සහ මාරිස් ව්‍යාපෘතියේ සම්බන්ධීකරණ නිලධාරී වශයෙන් වැඩ භාර ගන්නා ලදී.

භාරගත් ප්‍රධාන කාර්යය වූයේ ඉකුත් වසර 03 තුළ මාරිස් ව්‍යාපෘතිය මගින් ඉටුකරන ලද වැඩ කටයුතු පිළිබඳ පර්යේෂණයක් කිරීමය. දීර්ඝ කාලයක් අතපසුවී ඇති ප්‍රගති වාර්තාව සකස් කිරීම සඳහාය ඒ. ව්‍යාපෘතියේ සියළුම ලිපිගොනු නැවත සමාලෝචනයට භාජනය කොට වාර්තාව සකස් කෙරිණ. මීට මුදල් අංශය විසින් සකස් කරන ලද මුදල් වාර්තා ව ද ඇතුලත් කොට මාරිස් ව්‍යාපෘතියට මුදල් ආධාර දෙන අයිසීඑම්ඩී සහ අයිඩීආර්සී නියෝජිතායතන වලට පිටත් කර හරින ලදී. මේසය මත තැබිය හැකි සංස්කරණ උපකරණ කට්ටල ලබාදුන් සංවිධායකවරයා වෙත, ව්‍යාපෘති සේවක මණ්ඩලයේ හැකියාවය් විදහා දක්වෙන අභිලාශයෙන් "වෙන්චුරා" පාඨ සැලැස්ම හා පින්තූර භාවිතා කොට පිටු 30 කින් සමන්විත ප්‍රගති වාර්තාවක් කැමරා ඒක්ෂණ හැඩපත් කඩදාසි වල සකස් කරන ලදී.

**පසුබෑම .**

තුන්වෙනි කාර්තුව තුළ දී පරිපාලනයමය වශයෙන් හා ක්‍රියාකාරී වශයෙන් යම් යම් පසුබෑම් වලට මුහුණ පෑමට ව්‍යාප්ති ඒකකයට සිදුවිය. ව්‍යාප්ති ඒකකයේ තිබුණු වායු සමීකරණ යන්ත්‍රය අලුත් වැඩියා කිරීම පිණිස ගෙන ගොස් මාස ගණනක් ගතවී තිබීමෙන් ඉතිරිව තිබූ ශ්‍රව්‍ය දෘෂ්‍ය උපකරණ එනම් , ලේඛනාගාර පටි, තිශ්චල කැමරාව සහ අදාල උපකරණ ද ඉහල මාලයේ පුස්තකාලය ස්ථානයට ගෙන යාමට සිදු විය. දූවිලි හා ආද්‍රතා ආදියෙන් ආරක්ෂා වීම පිණිස මෙසේ කරන ලදී.

තව ද වායු සමීකරණ යන්ත්‍රයක් නොමැති බැවින් ව්‍යාප්ති ඒකකයේ කැමරා ගත කිරීම් හා සිත්තම් කටයුතු කිරීම සඳහා ලබා දී ඇති ආවරණිත ස්ථානය ද ප්‍රයෝජනයට ගත නොහැකිවූ අතර එම අංශයේ ද වැඩ කටයුතු ඇණ හිටියේය. මුදල් අංශය විසින් සපයන ලද මාරිස් ආයතනය පිළිබඳ මුදල් වාර්තාව අසතුටු දායක එකක් වූ බැවින් එය භාර ගැනීම ප්‍රතික්ෂේප කරන ලද අතර නැවත වරක් එම වාර්තාව සංශෝධනය සහිතව සකස්කර දෙන තෙක් මුදල් සැපයීමත් ව්‍යාපෘතියේ ඉදිරි කටයුතුවලට අනුග්‍රහය දැක්වීමත් මුදල් සැපයෙන නියෝජිතායතන විසින් ප්‍රතික්ෂේප කරන ලදී. තවමත් මෙම වාර්තාව මුදල් අංශය විසින් සංශෝධනය කොට ඉදිරිපත් කර නොමැති හෙයින් මාරිස් මුදල් යෙදවීම් මගින් කරනු ලබන කිසිම කටයුත්තක් කිරීමට භාර ගත නොහැකිව ඇත.

## ලියකියවිලි පළ කිරීම.

ප්‍රකාශණ නිලධාරී අස්වී ගිය පසු එම අංශයේ ප්‍රකාශණ ලියවිලි වැඩ සඳහා ව්‍යාප්ති ඒකකයේ සේවක පිරිස් යොදවන ලදී. තාරා ආයතනයට දස වසරක් පිරීම නිමිති කොට පැවැත්වීමට නියමිත උත්සව වැඩ පිළිවෙල ආරම්භ වීමට පෙරාතුව ප්‍රකාශණ හතරක් පිළිබඳ පළ කිරීම් කාර්යයන් නිම කිරීමට පියවර ගන්නා ලදී.

## ලියවිලි 1 - තාරා අත්පොත.

තාරා ආයතනයේ සියලුම අංශ විසින් කරනු ලැබූ කටයුතු හා ව්‍යාපෘති පිළිබඳ විස්තර සඳහා බලා සම්පාදනය කොට ඒ සඳහා යෝග්‍ය ඡායාරූප ද තෝරාගෙන අවසානය. විස්තර කෙරෙන වැඩ කටයුතු ආවරණය කෙරෙන පරිදි හවග් ඡායාරූප ගෙන තබන ලදී.

වෙත්වුරා පරිගණක ඇසුරුමේ ආධාරයෙන් පොතේ පිට කවරය ද සහිතව අදාල පින්තූර යොදා ආදර්ශ පිටපතක් සකස් කරන ලදී. අවසාන නිර්මාණය ඡායාස්ථ පිටපත් කොට තිසි පරිදි බැඳ පිටු 45 ක පොතක් සේ සකසා තාරා ආයතනයට පැමිණි විශේෂ අමුත්තන් 20 දෙනෙකුට පමණ බෙදා දෙන ලදී.

පොත් පිංච මුද්‍රණය කිරීම සඳහා සුපකුල් මුද්‍රණ කරුවන්ගෙන් මිළ ගණන් කැඳවූ අතර පොත පරීක්ෂා කිරීමට මුද්‍රණ කරුවන්ගේ නියෝජිතයින්ද ඉඩ සලසන ලදී. මෙයින් පිටපත් 1000 ක් මුද්‍රණය කිරීම සඳහා රු.216,900/- ක ටෙන්ඩරයක් සී/ස ඇට්කින්ස් ස්පෙන්ස් සමාගම වෙත ප්‍රදානය කරන ලද අතර එම මුදම යුඑන්ඩීපී/තාරා ව්‍යාපෘති අංක. 87/001/ඒ/01/99 දරණ වැය ශීර්ෂය යටතේ ගෙවනු ලැබේ. මුද්‍රණ කටයුතු ආරම්භ කිරීමට නියමිතව ඇත. මෙහි සිංහල පරිවර්තනයක් ද ඒ සමගම සකස් කොට ඇති අතර එහි සංස්කරණය නිම කිරීමට ඇත.

**ලියවිලි 2 - නාරා ආයතනයේ පර්යේෂණ වැඩ සටහනේ වැඩ කටයුතු.**

ඒ ඒ අංශ හා ඒකක වලින් ව්‍යාපෘති අංශ විස්තර ලබා ගන්නා ලදී. මේ අතර අංශයේ අපේක්ෂා, සේවකපිරිස්, වගකීම් හා ප්‍රතිඵල ඊට ඇතුළත්ය. මේවා සම්පිණ්ඩණය කොට පිටු 200 ක අත් පිටපතක් සේ වැඩ බලන ප්‍රවෘත්ති අධ්‍යක්ෂ විසින් සංස්කරණය කරන ලදී. මුද්‍රණය කිරීම සඳහා ප්‍රකට මුද්‍රණකරුවන්ගෙන් මිළ ගණන් කැඳවන ලදුව පොත පරීක්ෂා කිරීමෙන් අනතුරුව සමාගම් හතරක් විසින් ස්වකීය මිළ ගණන් ඉදිරිපත් කරන ලදහ.
එම අය අතුරින් පිටපත් 1000 ක් මුද්‍රණය කිරීම සඳහා රු.210,000/- වටිනා ටෙන්ඩරයක් සී/ස එච් සහ අයි පෞද්ගලික සමාගමට ප්‍රදානය කරන ලදී. අකුරු යෙදීම සිත්තම් වැඩ හා වර්ණ දෙකකින් යුතු පිටකවරය ද මීට ඇතුළත්ය. ප්‍රවෘත්ති අංශය පොත මු ද්‍රණය කිරීමේ වැඩ ඉක්මන් කරවීමෙහි ලා පේචත් සහ අයි මුද්‍රණ සමාගම සමග දැන් අදහස් හුවමාරු කරමින් සිටී.

**ලියවිලි 3 - (1981-1990) ශ්‍රී ලංකාවේ ධීවර සම්පත් කළමනාකරණයෙහිලා පළමු දශකයේ ප්‍රගතිය.**

වැඩ බලන ප්‍රවෘත්ති අධ්‍යක්ෂ විසින් නාරා ආයතනයේ ක්‍රියාකාරී කටයුතු සම්බන්ධව සියළුම පර්යේෂණ නිලධාරීන් විසින් ඉදිරිපත් කරන (. , පත්‍රිකා හා සියළුම කෘති ගොනු කොට පොතක් වශයෙන් සංස්කරණය කොට ඇත. පොතට ඇතුළත් කිරීමට සුදුසු ඡායාරූප ලේඛණාගාරයෙන් හා වෙනත් මාර්ගවලින් ලබාගෙන උචිත පරිදි පොත සකස් කොට ඇත. සංස්කරණය කරන ලද මෙම අත්පිටපත පිටු 200 කින් සමන් විතය. අප්පොතේ කොටසක් අංශයේ ව්‍යාප්ති ඒකකයේ සේවක පිරිස් විසින් මුද්‍රණ කරුවන්ට පෙන්වීම සඳහා ආදර්ශ පිටපතේ අලවන්නට යෙදිණ.
පොත මුද්‍රණය කිරීම සඳහා ප්‍රසිද්ධ මුද්‍රණ කරුවන් 17 දෙනෙකුගෙන් මිළ ගණන් කැඳවන ලදී. එහෙත් ප්‍රතිචාර දැක්වූයේ සුළු ප්‍රමාණයකි. එබැවින් උප ලේඛණය හා නිශ්චිත ප්‍රමාණයන් වෙනස් කිරීමෙන් අනතුරුව අලුතෙන් මිළ ගණන් කැඳවීමට තීරණය කරන ලදී. මෙය පිළියල කිරීමට ටෙන්ඩර් මණ්ඩලය රැස්වීමට නියමිතය. මේ අතර මෙහි සිංහල පරිවර්තනයන් දැනට ලබා ගෙන ඇති අතර පොතෙහි සිංහල පිටපත සකස් වෙමින් පවතී.

**ලියවිලි 4. - නාරා ආයතනයේ ප්‍රවෘත්ති.**

නාරා ආයතනයේත් ධීවර අමාත්‍යාංශයේ ත් ක්‍රියා කාරී කටයුතු පිළිබඳව 1981 සිට 1990 දක්වා සිංහල, ඉංග්‍රීසි හා දෙමළ පුවත්පත්වල පළවූ සියළුම පුවත්පත් ලිපි ඡායාස්ථ පිටපත් කොට නුදුරු අනාගතයේ දී පොතක් වශයෙන් මුද්‍රණය කිරීම පිණිස තබා ඇත.

වෙනත් ප්‍රකාශණ :

**ප්‍රස්තිකාව .**

ප්‍රචාන්ති අංශය ඕෆ්සෙට් මුද්‍රණය යන්ත්‍රය භාවිතා කොට ජංගම අමාත්‍යාංශ සේවාවන් සඳහා ප්‍රස්ත්‍රිකා 06 ක් මුද්‍රණය කොට බෙදා හරින ලදී.

**තාරා සුබ පැතුම් පත්.**

මෙම අංශය මගින් ආර්.වී.සමුද්‍රමාරු යාත්‍රාව පිළිබිඹු කෙරෙන පරිදි වණී සුබ පැතුම් පත් හතක් සැළසුම් කොට දෙසැම්බර් තිවාඩු සමය තුළ විකිණීම සඳහා නිෂ්පාදනය කරන ලදී.

**පුවත්පත් පළකිරීම්.**

මෙම වසරේ දී භාර ගන්නා ලද පුවත්පත් ප්‍රචාන්ති කටයුතු අතර ප්‍රධාන තැනක් ගත්තේ දෙහිවල වැල්ලට ගැහැණු තල් මසකු ගසාගෙන ඒම පිළිබඳ ප්‍රචාන්තියයි. මේ පිළිබඳ තාරා ආයතනය සොයාගත් කරුණු සියලුම ප්‍රධාන පුවත්පත්වල පළකොට තිබිණ. මීට අමතරව තවත් විස්තරාත්මක පුවත්පත් සම්මුඛ සාකච්ජාවක් පැවැත්විණ. ලේක් හවුස් පුවත්පත් ආයතනයේ පුවත්පත් කලාවේදියකුවන ෂර්ලි ප්‍රනාන්දු මහතා තාරා ජාතික මුහුදු ක්ෂීරපායී සතුන් වැඩසටහනේ සාමාජිකයින්ද සමග කරන ලද පුවත්පත් සාකච්ජාව ඩේලි නියුස් පුවත් පතෙහි පලවිය.

ව්‍යාප්ති ඒකකයේ නිලධාරීන් විසින් අයොමැක් ආයතනය පිළිබඳ පුවත්පත් නිවේදනයක් ප්‍රධාන ජන මාධ්‍ය ආයතනය වෙත නිකුත් කරන ලද අතර එහි සේවක මණ්ඩලය විසින් තමන්ගේම නිර්මාණ ද මුහුදු කටයුතු පිළිබඳ මහජනයා දැනුවත් කිරීම අරමුණු කොට ගෙන සඟරාවලට හා පුවත්පත් වලට නිකුත් කරන ලදී.

මෙම කෘතීන් නම් " ඕඩිපී ඉන්දියන් ඕෂන් ඔඩිසි "
- මයිකල් බෙරෙන්ජර " 10 තිවිස් "
" ධීවර කර්මාන්තය නංවා ලීමේ ලා තාරා ආයතනයේ කාර්ය භාරය " - නන්දා පෙරේරා " ධීවර සවිය "

ද වේ.

**ගුවන් විදුලි වැඩසටහන:**

වසරේ හතර වැනි කාර්තුව තුල තාරා ආයතනයේ වැඩ කටයුතු හා මුහුදු කටයුතු විස්තර කෙරෙන ආකාරයට සකස් වූ " ඇක්වේරියස් " නම් කොටස් 12 කින් යුතු ගුවන් විදුලි වැඩ සටහන ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ ඉංග්‍රීසි සේවය ඔස්සේ සතිපතා ප්‍රචාරය විය.

මෙම ගුවන් විදුලි වැඩ සටහන මගින් ආවරණය වූ විශේෂයන් අතර මුහුදු ගවේෂණයේ නව මිනුම්, ශ්‍රී ලංකාවේ තල් මසුන් හා ඩොල්ෆින් මසුන්, මුතු බෙල්ලන් ධීවර කර්මාන්තය, මෝරා අන්දා, මිනීමරු තල්මසුන්, ගැඹුරු දියේ අපූරු සතුන්, තල්මසුන් ගේ ඉතිහාසය සහ මහා සාගරය හා එහි වෙසෙන සත්වයින් පිළිබඳ විශේෂඥතාවක් දරණ කලා කරුවන් පිළිබඳ වන ගොන ද හෙළි විය.

රූප වාහිනී වෘත්තාන්ත චිත්‍රය.

ශ්‍රී ලංකාවේ තල් මසුන් හා ඩොල්ෆින් මසුන්ගේ පැවැත්ම පිළිබඳ වාර්තා කිරීම ඇතුළුව ජාතික මුහුදු ක්ෂීර පායී සතුන් පිළිබඳ වැඩ සටහන මගින් කරන ලද පැය බාගයක වෘත්තාන්ත චිත්‍ර පටයක් සංස්කරණය කොට ජාතික රූපවාහිනී සංස්ථාව ඔස්සේ විකාශණය කරන ලදී.
නාරා ආයතනය ආරම්භයේ සිටම වාර්තා ගත කොට තිබුණු වීඩියෝ ආවරණයන් හා නිපැයූ චිත්‍ර පටි මෙම වැඩ සටහන සඳහා ප්‍රයෝජනයට ගන්නා ලද අතර මෙම වෘත්තාන්ත චිත්‍රපටය ජාත්‍යන්තර වශයෙන් පිළි ගන්නා ආකාරයේ උසස් තත්ත්වයෙන් වීඩියෝ ආදර්ශ පටියක් භාවිතාකොට රූපවාහිනී සංස්ථාවේ විකිශනාගාරයක දී පටිගත කරන ලදී.
නාරා ආයතනයේ දී මූලාකෘතියක් ලෙස සැලකිය යුතු ප්‍රමාණයකට ප්‍රචල් හා ශුද්ධ කරන ලද වීඑච්එස් අධ්‍යාපනික නිශ්පාදනයක් වශයෙන් සැකසූ මෙම චිත්‍රපටියට "එන්කවුන්ටර්ස් " යන නම ද භාවිතා කරන ලදී. මෙම වැඩ සටහන කෙතරම් උසස් තත්ත්වයක තිබුණේ වී ද යත් රූපවාහානී සංස්ථාව විසින් ඔවුන්ගේ වියදමින්ම එයට සිංහල හඬ කවා නැවත විකාශන කිරීමට ද භාර ගන්නා ලදී.

එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩ සටහන උපකරණ ඇණැවුම.

සමාලෝචනයට භාජනය වන කාර්තුව තුල එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ උපකරණ ඇණැවුම සැකසීමෙහි ලා සැහෙන වෙහෙසකින් ක්‍රියා කරන ලදී. එනම් ඇණැවුමේ කාණ්ඩ 5 යටතේ දැක්වෙන ශ්‍රව්‍ය හා දෘෂ්‍ය උපකරණ වලට සම්බන්ධ තොරතුරු උපකරණ සඳහන් කොටසයි.
මේ සම්බන්ධව රූපවාහිනී සංස්ථාවේ ඉංජිනේරු අධ්‍යක්ෂ වරයා ද සමග එක්වී ඇණැවුමේ ඇති උපකරණ හඳුනා ගැනීම හා ඒවාට අදාල මිලගණන් තක්සේරු කිරීම පිළිබඳව වූ වැඩ කටයුතු ද විය. වැඩ බලන ප්‍රවෘත්ති අධ්‍යක්ෂ විසින් තාක්ෂණික කමිටු වාර්තාව කෙටුම්පත් කරන ලද අතර අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩල රැස්වීම් වලට ද සහභාගී වී අමාත්‍ය මණ්ඩලයට සැපයීම සඳහාවූ වාර්තාව සකස් කිරීමට ද සහාය වීය.

එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන වාර්තාව.

මහකොළඹ ආර්ථික කොමිෂම විසින් සංවිධානය කරන ලද මුතුරාජවෙල පිළිබඳ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ වාර්තාවක් ප්‍රසිද්ධ කිරීම සඳහා නාරා පර්යේෂණ නිලධාරීන් වන ඇනස්ටි ජය සූරිය, සේපාලිකා ජයමාන්න, සුනිල් ජයකොඩි යන අය විසින් ලියන ලද ලිපි ව්‍යාප්ති නිලධාරී විසින් මෙම කාර්තුව තුළ දී සංස්කරණය කරන ලදී.

පුස්තකාලය

පොත් සහ ප්‍රකාශන වල සූචිකරණය හා කැටලොග් කිරීමේ වැඩ කටයුතු සාමාන්‍ය පරිදි කෙරිණ.

මහජන සම්බන්ධතා.

මහජනයාගෙන් ලැබෙන තොරතුරු හා දෛනික වශයෙන් ඉල්ලුම් කරන ආධාර සේවාවන් ද ප්‍රවෘත්ති කටයුතු ද සම්බන්ධීකරණය කිරීමේ වගකීම ප්‍රවෘත්ති අංශය වෙත පැවරී තිබිණ.

සමුද්‍ර විද්‍යා අංශය - 1990 වාර්ෂික වාර්තාව.

1.0 සේවක මණ්ඩලය.

සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ මෙම අංශයේ සේවක මණ්ඩලය පහත සඳහන් පරිදි විය.

| | | |
|---|---|---|
| අධ්‍යක්ෂ | - | 01 |
| පර්යේෂණ නිලධාරීන් | - | 07 (සාරක්2, වැටුප්රහිත 1, අධ්‍යයන නිවාඩුමත 1) |
| සහකාර පර්යේෂණනිලධාරී | - | 03 (අතියම් 1, වැටුප් රහිත 1 ) |
| රසායනාගාර සේවක | - | 01 |
| නියැදි කරු | - | 01 |
| යතුරු ලියන්නා | - | 01 (අගෝස්තුවේදී සේවය හැර ගොස්ය) |
| කාර්යාල කාර්ය සහායක | - | 01 |

2.0 පර්යේෂණ වැඩ.

මෙම වර්ෂය තුළදී පහත සඳහන් පර්යේෂණ කටයුතු නිම කිරීමට භාර ගන්නා ලදී.

2.1 මීගමු කලපුව පිළිබඳ විස්තරාත්මක බහු ශික්ෂණ අධ්‍යයන කටයුතු මාර්තු මාසයේ දී අවසන් කරන ලදී. මෙම කාලය තුළදී ක්ෂේත්‍ර චාරිකා 24 ක් නිම කරන ලදී. දඬුගම් ඔයේ ආය මුඛයේ හා මීගමු කලපුවේ පිටත මුඛයේ පරාමිති වල දෛනික වෙනස් වීම් ආ ගණනය කිරීම සඳහා විශේෂ චාරිකා දෙකක් නිම කරන ලදී. මෙම අධ්‍යයනයේ දී ඒ ඒ ස්ථාන වලදී පහත සඳහන් පරාමිති සඳහා මිනුම් කරන ලදී.:- උෂ්ණත්වය, ආලෝක නිවේධනය, පාර දෘෂ්‍ය තත්ත්වය, ප්‍රවාහයන්, බොර ගතිය, ලවණතාවය, හයිඩ්‍රජන් අයන් සාන්ද්‍රණය, අවලම්බිත ද්‍රව්‍යයන්, පෝෂකයන්, තිතල වාසීහු, ප්ලැන්ක්ටන් සහ මත්ස්‍ය බෑ සීමේ ප්‍රමාණයන්

රැස්කරන ලද සියලුම නියැඳි විශ්ලේෂණය කොට ඒ වායේ ප්‍රතිඵල ආගණක ගත කොට ඇත. දත්ත සැකසීම බොහෝ දුරට අවසන් කොට ඇති අතර විවිධ පරාමිති වල ඇති අන්තර් සම්බන්ධතාවයන් පෙන්නුම් කරන ආකාරයේ සිතියම් රූප සටහන්, රේඛා සටහන් බොහෝ ගණනක් සකස් කොට ඇත. මෙම අධ්‍යයන වාර්තාව අත් පොතක් හා සිතියම් පොතක් ලෙස ප්‍රසිද්ධ කිරීමට මුදල් අවශ්‍යතාවයන් සෙවීමේ ලා දැන් කටයුතු කරනු ලැබේ.

2.2 ශ්‍රී ලංකාවේ ප්‍රධාන ගංගාවලින් ගලා එන අවසාදිතයන් හා නිදානයන් පිළිබඳ සමීක්ෂණයක් කළු ගඟේ ඇල බේසමේ ද කරන්නට යෙදිණ. කළු ගඟේ ජල මාර්ග ස්ථානවල පස් දින ක්ෂේත්‍ර චාරිකා දෙකක් මෙහෙයවන ලදී. මෙම සමීක්ෂණයේ දී විවිධ අවසාදිත නියැඳි 230 ක් රැස් කරන ලදී.

2.3 වැලිගම වරායේ භූ විද්‍යාත්මක හා භූ රූප විද්‍යාත්මක සමීක්ෂණයක් මාර්තු මස දී ආරම්භ කරන ලදී. ගල් සහ අවසාදිත නියැඳි රැස් කිරීමට මෙම ප්‍රදේශය ආවරණය කරන ලද්දේ පා ගමනින් එම ස්ථාන හරහා යාමෙනි. ප්‍රමුඛ පෙලේ ගල්පර තට්ටු මැනබලා ඒ වායේ අවපාතය හා තිරශ්චීනතාව දැක්වීම සඳහා 1 :5000 ප්‍රමාණයට සකස් කළ එම ප්‍රදේශයේ චිත්‍රයෙහි සටහන් කරන ලදී. වැලිගම වරායෙහි භූ විද්‍යාව හා භූ රූප විද්‍යාව දැක්වෙන 1 : 5000 ප්‍රමාණයේ සිතියමක් නිර්මාණය කරන ලදී. තව ද වැලිගම වරායෙහි සෛද්ධාන්තික පරිනාමය දැක්වෙන ක්‍රමානුරූප රේඛා සටහන් මාලාවක් ද සකස් කරන ලදී.

2.4 කොග්ගල වැවේ සමුද්‍ර විද්‍යාත්මක සමීක්ෂණයක් ද කිරීමට භාර ගන්නා ලදී. මෙම ප්‍රදේශයේ නුදුරු අනාගතයේ දී ආරම්භ කිරීමට බලාපොරොත්තුවන නිදහස් වෙළඳ කලාපය නිමිති කොට ගෙන මූලික දත්ත රැස් කිරීමේ අභිලාෂයෙන් මෙම අධ්‍යයනය පටන් ගන්නා ලදී.

- 58 .....

වැවේ පතුලේ මඩ් සහ/ජල නියැදි ලබා ගැනීමට රැයම් අතුරුජුවක් භාවිතා කොට සමීක්ෂණ කටයුතු කරන ලදී. මෙහි ජල ප්‍රවාහය පිළිබඳ මැනුම් කටයුතු කිරීමට නොහැකි විය. මෝය කට වසා තිබුණ බැවිනි.

2.5 සාරෙක් ව්‍යාපෘතිය යටතේ පුත්තලම් කලපුව පිළිබඳ විස්තරාත්මක බහු ශික්ෂණ අධ්‍යයනයක් මැයි මාසයේ දී දියත් කෙරිණ. පුරා දින 48 ක් ක්‍රියා කටයුතු සඳහා මෙම අධ්‍යයන කාලය තුළ ක්ෂෙත්‍ර චාරිකා 12 ක් මෙහෙයවන ලදී. ඒ සෑම ක්ෂෙත්‍ර චාරිකාවකදීම වැඩ බිම් 12 වත් 16 වත් අතර ප්‍රමාණයක නියැදි කටයුතු කරන ලදී. සෑම වැඩ බිමක දීම ජලයේ ගැඹුරිනුත් මතුපිටිනුත් ජල නියැදි ලබා ගන්නා ලදී. සෑම ස්ථානයකම පහත සඳහන් අගයන් සඳහා මිනුම් කරන ලදී.: ලවණතාවය, උෂ්ණත්වය, බොර ගතිය හා අවලම්බිත ද්‍රව්‍යයන් "පෙන්ඩියුලම් ජලප්‍රවාහ ක්‍රමය" භාවිතාකොට ගෙන පුත්තලම් මෝය කටේ ප්‍රවාහ මිණුම් කටයුතු කරන ලදී. පඝුගුාල හා ඕලන්ද වරායයන් හි ද ස්ථාන කිහිපයක නියැදි කටයුතු කරන ලදී. කලපුවේ පිරිවැටියෙහි විසුරුවා ඇති වඩදිය රිටි පහකින් වඩදිය කියැවීම් ලබා ගන්නා ලදී. සමීක්ෂණයේ ප්‍රතිඵල විශ්ලේෂණය කොට නිසි පරිදි වගු සටහන් සහ රේඛා සටහන් තබා ඇත. අදාල දත්ත පරිගණක ගත කොට තිබේ.

2.6 සමුද්‍ර විද්‍යා අංශය බෙන්තොට සිට ඉඳුරුව ක්වා ඇති ප්‍රදේශයෙහි සීසීඩී/පීටීඉයෙඩ් ව්‍යාපෘතියෙහි නියැලී සිටින ලදී. ජාතික ජලමාන කාර්යාලය මෙහි ප්‍රධාන කර්තව්‍යයක් නිම කරයි. සමාලෝචනයට භාජනය වන වකවානුව තුළ වෙරළ බඩ හා වෙරළට ඔබ්බෙන් යන මුහුදු මට්ටම් වලින් නියැදි රැස්කරන ලදී.එකතුව නියැදි 156 ක් වශයෙන් නියැදි කට්ටල දෙකක් රැස් කරන ලදී. ඇට ප්‍රමාණයේ පරාමිති සඳහා නියැදි 78 ක් විශ්ලේෂණය කරන ලද අතර වෛන්ද්‍රික ද්‍රව්‍ය හා කාබනික ද්‍රව්‍ය සංයුතිය නිශ්චයනය කරන ලදී. ලැබූ ප්‍රතිඵල් වාර්තාවක ස්වරූපයෙන් සීසීඩී වෙත ඉදිරිපත් කරන ලදී.

2.7 වැලිගම වරායෙහි සමුද්‍ර විද්‍යාත්මක සමීක්ෂණයක් කිරීම සඳහා භාර ගන්නා ලදී. මෙම සමීක්ෂණයෙහි අරමුණ කප්පරතොට ප්‍රදේශයෙහි දිය කඩනයක් හෝ/සහ නැංගුරම් පොළක් ඉදිකිරීමේ හැකියාව සොයා බැලීම සඳහා ප්‍රාරම්භක වාර්තාවක් සකස් කිරීමට අවශ්‍ය මූලික දත්ත රැස්කිරීම සඳහාය.කප්පරතොට ප්‍රදේශයෙහි වැලිගම වරායෙහි සමීක්ෂණයන් සිදු කොට එහි ගැඹුර හා ප්‍රවාහය මැන බලා පතුලේ නියැදි ද රැස් කරන ලදී. තාරා මධ්‍යස්ථානය අසල ඇති කුඩා දිය මංකඩ ද සමීක්ෂණයට ලක් කොට අවසාදිත තට්ටුවේ ඝනකම සොයා බැලීමට අවගාර සිදුරු ද දමන ලදී.

2.8 මුතුරාජවෙල ගොහොරුවේ පරිසර විද්‍යාත්මක සමීක්ෂණයක් සැප්තැම්බර් මාසයේ දී ආරම්භ කෙරිණ. සමාලෝචනයට භාජනය වන කාල සීමාව තුළ ක්ෂේත්‍ර චාරිකා 3 ක් නිම කරන ලදී. මෙම චාරිකා වලදී පිහිටීම් 12 ක දී පැය 13 කටත් අධික කාලයක් මිඩංගු කොට වඩදිය මිණුම් කරන ලදී. පිහිටීම් 8 ක දී පැය දෙකකට වරක් ප්‍රවාහ මිණුම් කරන ලදී. සියලුම පිහිටීම් වලදී සෑම පැය දෙකකට වරක් ලවණතාවය හා අවලම්බිත ද්‍රව්‍යයන් මැනීම කරන ලදී. තව ද මෙයට අමතරව ගොහොරුවේ විවිධ ස්ථාන වල ලවණතාවය පිළිබඳ මිනුම් කටයුතු කරන ලදී. මෙහි ප්‍රතිඵල සහිත වාර්තාව සකස් වෙමින් පවතින අතර එය ම.කො.ආ.කො. වෙත ඉදිරිපත් කිරීමට නියමිතය. වාර්තාවට පහත සඳහන් කරුණු අඩංගු වේ.

සාමාන්‍ය ජලය ශේෂය

ලවණතාව පැතිරීම.

2.9 සීසීඩී/එච්එච්ඕ ව්‍යාපෘතිය සඳහා සමුද්‍ර විද්‍යාත්මක අංශය විසින් කන්දකුලිය වෙරළබඩ ප්‍රදේශය නියැදි සඳහා සමීක්ෂණයක් කිරීමට භාර ගන්නා ලදී. මේ සඳහා 0.0m , 0.5M මුහුදු මට්ටම් ප්‍රමාණයේ නියැදි 50 ක් රැස් කරන ලදී. ඇට ප්‍රමාණයේ විශ්ලේෂණ ප්‍රතිඵල අඩංගු වාර්තා වක් සහ නියැදිඑල විස්තර සම්පූර්ණ කොට සීසීඩී වෙත ඉදිරිපත් කිරීම සඳහා සකස් වෙමින් පවතී.

2.10 සමුද්‍ර විද්‍යාත්මක අංශයත් ජාතික ජලමාන කාර්යාලයේත් සහභාගිත්වයෙන් පුරාණවැල්ල දිය කඩනයේ දැනට ඇති පාරිසරික ප්‍රති විපාක පිළිබඳ අධ්‍යයනයක් සඳහා ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශයේ කොන්ත්‍රාත්තුවක් භාර ගන්නා ලදී. ජලය වෙනස් වන අවස්ථාවන්හි අවලම්බිත ද්‍රව්‍යයන්ගේ වෙනස් වීම නිශ්චයනය කිරීම වස් වරාය ඇතුලත හා දිය කඩනයට යාබද ස්ථානවල මධ්‍ය ජල තීරුවල නියැදි 4 x 6 ප්‍රමාණයේ ලෝහ රාමුවක් මගින් ලබා ගන්නා ලදී. නියැදි කිරීම් 1/12 සිට 16/12 වශයෙන් පතුලේ සිට වෛකල්පික මට්ටම් පිළිවලට කරන ලදී. වෙරළට ඔබ්බෙන් ද අවස්ථා දෙකක දී අවලම්බිත ද්‍රව්‍ය නියැදි රැස් කරන ලදී. වෙරළේ බටහිර දෙසින් පැතිකඩ මාර්ගයෙන් පටන්ගෙන පැති කඩ ඔස්සේ වෙරළ නියැදි රැස් කරනු ලැබීය. මුහුදු මට්ටමින් 1.0 රේඛාව, ශූන්‍යරේඛාව හා වෘක්ෂලතා රේඛාව යන ස්ථාන වලින් රැස්කරන ලද සම්පූර්ණ නියැදි 78 කි.

දියකඩනය අසලින් පතුලේ නියැදි 36 ක් රැස්කරන ලද අතර ඉන් 12 ක් වරාය තුලින් හා ඉතිරිය පිටතින් ලබා ගන්නා ලදී. දිය කඩනයේ පතුළ ගල් පර වලින් යුක්ත වූ බැවින් නියැදි රැස්කිරීම නොකරන ලදී.

ජල ප්‍රවාහය මැනීම සඳහා වරාය ඇතුලේ ජෙලටින් අවලම්බ රඳවා තබන ලදී. උදම් චක්‍රයක භාගයක් ආවරණය වනයේ මිනුම් කරන ලදී. සති දෙකක දී හය වරක් බැගින් මෙම මෙහෙයුම කරන ලදී.

60 ....

මතුපිට ප්‍රවාහය පහසුකර ගැනීම සඳහා වරායෙන් පිට ස්ථාන තුනක දී වෙරළ රේඛාවේ සිට මීටර් 100- 200 ටත් අතර දුර ප්‍රමාණයක් සිටින සේ බෝයා ඩ්‍රෝග්ස් පා කරන ලදී. විවිධ ගැඹුරු මට්ටමින් ප්‍රවාහයන් මැනීම සඳහා මෙම බෝයා ඩ්‍රෝග්ස් මීටර් එකක, මීටර් දෙකක් හා මීටර් තුනක් වශයෙන් දියයට සිට පා කර හරින ලදී. මෙම බෝයා මැනීම දින හයක් තුල නොකඩවාම කෙරිණ.

අවසාදිත ප්‍රවාහනය කිරීමේ ලා දිය රැලිවල බලපෑම නිශ්චයනය කිරීම් වස් රැළි පිළිබඳව දක්ෂය නිරීක්ෂණයන් නිතිපතාම කරන ලදී. ප්‍රදේශයෙන් ලබා ගත් දත්ත හා මෙම නිරීක්ෂණයන් සසඳා බලන ලදී.

ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශයට ඉදිරිපත් කිරීම සඳහා රැස්කරන ලද ආගාධමිතිය ද ඇතුලුව සියලුම දත්ත විශ්ලේෂණයන් පිළිබඳ ප්‍රතිඵල අඩංගු වාර්තා වක් සකසන ලදී.

3.0 වෙනත් ක්‍ෂෙත්‍ර චාරිකා.

3.1 මෙම අංශය ගාල්ල දිසාවේ මුතු බෙල්ලන් වගා කිරීමේ වැඩ බිම් වල බහු ශික්ෂණ අධ්‍යයන කටයුතු වලට සහභාගී විය.

3.2 යෝජිත මුහුද ගොඩ කිරීමේ වැඩ පිළිවෙලට සම්බන්ධ මුහුදු බත් වී ඇති ඉඩම් නැවත ලබා ගැනීමේ හැකියාව නිශ්චයනය කිරීම් වස් දිවයිනේ දකුණු ප්‍රදේශ හා නිරිත දිග ප්‍රදේශවලට ක්‍ෂෙත්‍ර චාරිකා දෙකක් කරන ලදී.

3.3 වේල්ස් හා ජාතික කෞතුකාගාරයේ පුරා විද්‍යාඥයින් කණ්ඩායමක් ද ජාතික ජලමාන කාර්යාලය ද සමග ඒකාබද්ධව ප්‍රතිධ්වනිමානන සමීක්ෂණයක් කරන ලදී. ඓතිහාසික වැදගත්කමක් ඇතැයි කියනු ලබන කැඩුණු නැවක සුන්බුන් තිබෙන ගල්පරයක් අසල "ඩන්කන් සේලර් රොක්" නම් ස්ථානයට මඳක් ඔබ්බෙන් සිට මෙම සමීක්ෂණය කරන ලදී. මෙම සමීක්ෂණයෙන් නැවක සුන්බුන් යැයි සැලකිය හැකි ගිලී ගිය කාලතුවක්කු සුන්බුන් සමහරක් හමු වී ඇත.

3.4 සාරෙක් ව්‍යාපෘතියේ ප්‍රයෝජනය සඳහා පුත්තලම් කලපුවේ අවලම්බ ජල ප්‍රවාහ මනු අත්හදා බැලීම් පිණිස භෞත සාගර විද්‍යාඥයකුවන ආචාර්ය ලාස් රිඩ්බර්ග් සමග ක්‍ෂෙත්‍ර චාරිකාවක් කරන ලදී. පුත්තලම් කලපුවේ සෝදිසි සමීක්ෂණයක් ද කිරීමට භාර ගත්තාලදී.

3.5 අවලම්බ ජල ප්‍රවාහ මනු යොදා මීගමු කලපු මෝය කටේ ජලප්‍රවාහ රටාව අධ්‍යයන කිරීමට එක් දින ක්‍ෂෙත්‍ර චාරිකාවක් කරන ලදී.

3.6 මෙම අංශයේ නිලධාරීහු පාරිසරික උප ඇමති ආචාර්ය විමල් වික්‍රම සිංහ මැතිතුමාත් ම.කො.ආ.කො. සහ මධ්‍යම පරිසර අධිකාරියේ නිලධාරීන් ද සමග ක්‍ෂෙත්‍ර චාරිකාවක් සඳහා මුතුරාජ - වෙලට යන ලදී.

3.7 යෝජිත හික්කඩුවේ මුහුදු අභය භූමියක් පරීක්ෂා කිරීම සඳහා රෝඩ් දූපත් විශ්ව විද්‍යාලයේ යූඑස්ඒඅයිඩී නියෝජිත කණ්ඩායමක් ද සමගක්ෂේත්‍ර චාරිකාවක් මෙහෙයවන ලදී.

4.0 අන්තර් ජාතික මුහුදු චාරිකා.

4.1 මධ්‍යම ඉන්දියානු සාගරයේ මෝසම් දේශගුණික අධ්‍යයනයක් සඳහා "සෝනි" නම් ජර්මානු පර්යේෂණ යාත්‍රාවේ අන්තර් ජාතික මුහුදු චාරිකාවට කේ.එස්.ගුරුගේ සහ ටී.ධර්මරත්න යන මහත්වරු සහභාගී වෙති.සමුද්‍ර විද්‍යා අංශයේ ඉල්ලීමක් පරිදි මෙම යාත්‍රාව විසින් කොළඹ,පානදුර,හා දෙවුන්දර යන නියමිත අනුබද්ධ තුනක ජල ප්‍රවාහ මිනුම් කටයුතු කරනු ලබනවා ඇත. ශ්‍රී ලංකාවේ අනන්‍ය ආර්ථික කලාපය තුළ ආගාධමිතික,මතුපිට උෂ්ණත්වය, ජල ප්‍රවාහ යන දත්ත ඇතුලත් වන පරිදි සියලු අන්දමේ වාර්තා ලබා ගැනීම සඳහා එකඟත්වයකට එළැඹ තිබේ.

5.0 වෙනත් ක්‍රියා කටයුතු.

5.1 සම්මන්ත්‍රණ /වැඩමුළු

5.1.1 සමුද්‍ර විද්‍යා අංශය විසින් රැස්කරගෙන තිබෙන තොරතුරු බෙදාහැරීම සඳහා තොරතුරු ලාභීන්ගේ සම්මන්ත්‍රණයක් සංවිධානය කොට ඇත. මෙම සම්මන්ත්‍රණයට සහභාගී වූ වන්ගේ ගණන 48 කි. මීට සහභාගී වූ අය අතර ධීවර සමුපකාර සමිති වලින් මේ පිළිබඳව උනන්දුවක් දක්වන අය, වයඹ පළාතේ ධීවර බෝට්ටු අයිතිකරුවන් හා දිස්ත්‍රික් ධීවර ව්‍යාප්ති නිලධාරීන් විසින් එවනු ලැබූවන් ද වූහ. ශ්‍රී ලංකාව වටා එක් හතරැස් අංශකයක් තුළ ඇතිවන මාසික ප්‍රවාහ රටාව සහ එක් කාර්තුවක් තුළ ශ්‍රී ලංකාව වටා ඇති උපරිම ඔක්සිජන තට්ටුව පිළිබඳ විස්තර පත්‍රිකා මෙයට සහභාගී වූවන්ට බෙදා දෙන ලදී. අංශය විසින් සංගෘහිත ධීවර සටහන් පත් සහ තාප රේඛාව දක්වා ඇති ගැඹුර,මිශ්‍ර තට්ටුවේ ගැඹුර , ඒ –ක්ලෝරෝපිල් බෙදා හැරීම සහ ශ්‍රී ලංකාව වටා මතුපිට උෂ්ණත්වය බෙදා හැරීම මෙම සම්මන්ත්‍රණයේ දී ප්‍රදර්ශණය කොට පෙන්වන ලදී. පැමිණ සිටි සැම දෙනාම පාහේ විශ්වාස කළ දෙයක් නම් මෙම සටහන් පත් ධීවර කාර්මිකයින්ට බොහෝ ප්‍රයෝජනවත් විය හැකිය යන්නය. මෙම සටහන් පත් ඉතා ඉක්මනින් ලබා දෙන ලෙස ධීවර කාර්මිකයින් හා දිස්ත්‍රික්ක ධීවර ව්‍යාප්ති නිලධාරීන් විසින් ඉල්ලා සිටින ලදී.

5.1.2 1990 පෙබරවාරි මස 12 – 16 දින දක්වා "පරමාර්ථදිශානත ව්‍යාපෘති සැලසුම්" යන මැයෙන් කවතර පැවැති සම්මන්ත්‍රණයකට මෙම අංශය සහභාගී විය.

5.1.3 1990 ජනවාරි මස පේරාදෙනියේ පැවැති ශ්‍රී ලංකා භෞ විද්‍යාත්මක සමිතියේ වාර්ෂික සැසිවාරයට මෙම අංශයේ නිලධාරීහු සහභාගී වූහ. සැසිවාරයේ තේමාව වූයේ " ජාතික සංවර්ධනයෙහි ලා භෞ විද්‍යාඥයින්ගේ කාර්ය භාරය " යන්නය.

5.1.4 ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශයේ බේරුවල හා මීගමුවේ පැවැති ජංගම සේවා කටයුතු වලට ද මෙම අංශයේ නිලධාරීහු සහභාගී වූහ.

5.1.5 කල්පිටියේ වයඹ ප්‍රදේශයේ ධීවර කාර්මිකයින් සඳහා නාරා ආයතනය විසින් සංවිධානය කරන ලද සම්මන්ත්‍රණයට මෙම අංශයේ නිලධාරීහු සහභාගී වූහ. මෙම අංශය විසින් හැමිල්ටන් ඇල, මුන්දල් වැව යන වැඩ බිම්වල කරන ලද වැඩ කටයුතු සටහන් පත් මගින් ප්‍රදර්ශණය කරන ලදී.

5.1.6 රාජ්‍ය ආයතනවල ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරීන් සඳහා ජාතික ජලමාන කාර්යාලය විසින් සංවිධානය කරන ලද සම්මන්ත්‍රණයකය මෙම අංශයේ නිලධාරීහු සහභාගී වූහ. සම්මන්ත්‍රණයට සහභාගී වූ බොහෝ දෙනෙකු කියා සිටියේ 1991 වසරේ ඒ ඒ ආයතනවල ක්‍රියා කටයුතු අධීක්ෂණය කිරීම සඳහා ජාතික ජලමාන කාර්යාලය සහ සමුද්‍ර විද්‍යා අංශය යන අංශවල සේවය ඔවුන්ට අවශ්‍ය වනු ඇති වගයි..

5.1.7 කොළඹ ලංකා ඔබ්රෝයි හෝටලයේ පැවැති ජාතික ජලමාන කාර්යාලයේ "මෙහෙයුම් සැලැස්ම" නම් ව්‍යාපෘතිය පිළිබඳ සම්මන්ත්‍රණයකට මෙම අංශයේ නාලධාරීහු සහභාගී වූහ.

5.1.8 (ජීටීඉසෙඩ්) තාක්ෂණික සහයෝගිතාවය සඳහා වූ ජර්මානු නියෝජිතායතනය ව්‍යාපෘතියේ දෙවෙනි අදියර සඳහා " උපකරණ සංකල්පය" සහ" ජල මාන විද්‍යාව සඳහා මධ්‍යම ප්‍රමාණයේ යාත්‍රාවක් " යන මාතෘකා යටතේ වූ සම්මන්ත්‍රණයකට මෙම අංශයේ නිලධාරීහු සහභාගී වූහ.

5.1.9 සැප්තැම්බර් මස 5 වැනි දා සිට 14 දින දක්වා කොළඹ ආකාශ වස්තු විද්‍යා දෙපාර්තමේන්තුවේ දී ලෝක ආකාශ වස්තු විද්‍යා සංවිධානය මගින් " නිවර්තන සුළාටු සහ කුණාටු ඇති වීම කලින් දැනුම් දීම " යන හිසින් පැවැති වැඩ මුළුවකට ගුරුගේ මහතා සහභාගී විය.

5.1.10 සැප්තැම්බර් 3 - 7 දක්වා ටැන්සානියාවේ අරූෂා නුවර පැවැති දෙවෙනි අයොමැක් සම්මන්ත්‍රණයට ආචාර්ය වික්‍රමරත්න, ශ්‍රී ලංකා නියෝජිතයකු වශයෙන් සහභාගී විය.

5.1.11 යුරෝපානු අභ්‍යවකාශ නියෝජිතායතනයේ ආචාර්ය ඇලන් විසින් "සමුද්‍ර විද්‍යාවෙහි ලා දුරස්ථ සංවේදී ක්‍රමය යොදා ගැනීම" යන මැයෙන් කරන ලද දේශනය ද ඇතුළත් වූ සම්මන්ත්‍රණයකට අංශයේ නිලධාරීහු සහභාගී වූහ.

## 6. රසායනාගාර/ කාර්යාල වැඩ කටයුතු.

6.1 මීගමු කලපුවේ තියැදි 800 කට වැඩි ගණනක් පෝෂක කොටස්, අවලම්බිත ද්‍රව්‍ය සහ මඩ්ඩි බැසීමේ ප්‍රමාණයන් සඳහා විශ්ලේෂණය කැත ලදී. පහත සඳහන් Fe, Cu, Zn, Ni, Co, Mn, Hg, සහ Pb යන ලෝහ සඳහා මඩ්ඩි තියැදි 120 ක් පමණ විශ්ලේෂණය කරන ලදී.

6.1.2 එස්එම් 24 සහ එස් එම් 25 මුහුදු චාරිකා මගින් රැස්කර ගත් තියැදි 85 ක් කොටස් හයකට තෝරා වෙන් කරන ලදී.

6.1.3 එස්එම් 20,23 සහ 28 මුහුදු චාරිකා මගින් රැස් කරන ලද තියැදි 86 ක් ඓන්ද්‍රික සහ කාබනේට් ද්‍රව්‍ය සඳහා විශ්ලේෂණය කරන ලදී.

6.1.4. අංක 20 මුහුදු චාරිකාවේ දී එකෝ සවුන්ඩරය මගින් වාර්තා කරන ලද පටියේ අඩංගු විස්තර වාර්තා පොතකට මාරු කරන ලදී.

6.1.5 මඩ්ඩි තියැදිවල ඇට ප්‍රමාණයේ මඩ්ඩි තියැදි 86 ක් සුදු කඩදාසි වල සලකුණු කරන ලදී.

6.1.6 එස්එම් 19 මුහුදු චාරිකාවේ සවුන්ඩිං සටහන් සුදු කඩදාසියේ සටහන් කරන ලදී.

6.1.7 මුහුදු බිමේ රූපීය සිතියම් එස්එම් 27 චාරිකාව මගින් නිම කරන ලදී.

6.1.8 එස්එම් 9,10 සහ 27 දරණ මුහුදු චාරිකාවල සිතියම් සම්පාදනය කිරීම අවසානයි. මන්නාරම සිට තංගල්ල දක්වා රාක්ක කැඩුම් සටහන් කරන ලදී.

6.1.10 හලාවත උතුරේ ප්‍රදේශ ආවරණය වන පරිදි ධීවර සටහන් පත් 60% පමණ අවසන් කරන ලදී.

6.1.11 කොග්ගල වැව සහ පුත්තලම් කලපුව සමීක්ෂණ වලින් ලබා ගත් තියැදි පෝෂක සහ අවලම්බිත ද්‍රව්‍යයන් සඳහා විශ්ලේෂණය කරන ලදී.

6.1.12 මීගමු කලපුවෙන් ලබා ගත් තියැදි 42 ක් කොටස් 6 කට වෙන් කරන ලදී. වැලි, මඩ්ඩි සහ මැටි යන කොටස් වලට බෙදා ඒවා ඓන්ද්‍රික සහ කාබනික ද්‍රව්‍ය සඳහා විශ්ලේෂණය කරන ලදී.

6.1.13 එස්එම් 24 සහ 25 මුහුදු චාරිකා මගින් රැස් කරන ලද තියැදි 85 ක් ඓන්ද්‍රික හා කාබනික ද්‍රව්‍ය සඳහා විශ්ලේෂණය කරන ලදී.

6.1.14 එස්එම් 24 මුහුදු චාරිකාව මගින් ඇට ප්‍රමාණයේ මඩ්ඩි තියැදි 40 ක් විශ්ලේෂණය කොට සම්භාව්‍යතා පත්‍රවල සටහන් කරන ලදී. සංඛ්‍යා ලේඛනාත්මක පරාමිති ගණනය කරන ලදී.

6.1.15 එස්එම් 28 මුහුදු චාරිකාවේ තියැදි 19 ක බනිජ ද්‍රව්‍ය වෙන් කිරීම අවසන් කරන ලදී.

6.1.16 ගලා වතට උතුරින් පිහිටි ප්‍රදේශයෙහි ආවරණය වන ධීවර සටහන් අවසන් කර ඇතත් සැලසුම් කරුවකු නො මැති හෙයින් අවසන් කෙටුම් පත සකස් කිරීම ප්‍රමාද විය.

6.1.17 මුද්‍රණය කර ධීවර කාර්මිකයින් අතරේ බෙදා දීම සඳහා තාප රේඛාව දක්වා ගැඹුර, ත්‍රෛමාසික අවම හා උපරිම ඔක්සිජන් තට්ටුව හතරැස් අංශක 1 ක් ප්‍රදේශවල මාසික ප්‍රවාහ රටාවන් ප්‍රකාශවන භෞතික පරාමිති අඩංගු වර්ග කෝෂ සකස් කරන ලදී.

6.1.18 වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව සඳහා රැස්කරන ලද තියැදි 78 ක කා බනික හා රෙන්ද්‍රික විශ්ලේෂණය කරන ලදුව සම්භාවයතා පත්‍රවල ලකුණු කොට සංඛ්‍යා ලේඛනත්මක පරාමිති ද ගණනය කරන ලදී.

## 7.0 දේශණ/ව්‍යාප්ති හා වෙනත් වැඩ කටයුතු.

7.1 ශ්‍රී ලංකාවේ භූ විද්‍යාත්මක සමාගමේ වාර්ෂික සැසි වාරයේ දී "ජාතික සංවර්ධනයෙහි ලා මුහුදු භූ විද්‍යාඥයෙකුගේ කාර්ය භාරය " යන මැයෙන් ආචාර්ය ඩබ්ලිව්.එස්.වික්‍රමරත්න විසින් පවත්වන ලදී.

7.1.1 ආචාර්ය ඩබ්ලිව්.එස්.වික්‍රමරත්න විසින් ශ්‍රී ලංකා ස්වභාවවාදී සංගමයේ ආරාධිත දේශකයෙකු ලෙස සහභාගී වෙමින් කොළඹ ජාතික කෞතුකාගාරයේ දී" මුතුරාජවෙල ගොහොරුවේ යෝජිත සංවර්ධනය – මීගමුව කලපුවට එමගින් විය හැකි ප්‍රති විපාක " යන මැයෙන් දේශනයක් ඉදිරිපත් කරන ලදී.

7.1.2 නාරා ආයතනයට පැමිණි පහත සඳහන් අමුත්තන් හට ආචාර්ය ඩබ්ලිව්.එස්. වික්‍රම රත්න අතින් සමුද්‍ර විද්‍යාව හා ජල ශාස්ත්‍රීය විද්‍යාව පිළිබඳව ලියැවුණු කෘති ප්‍රදානය කරන ලදී.

(අ) ලංකා පරිසර අධිකාරියේ සභාපති සහ නෙදර්ලන්ත නානාපති

(ආ) එක්සත් ජනපද ආධාර කණ්ඩායම.

(ඇ) ජර්මන් රජයේ ආර්ථික සහයෝගිතා අමාත්‍යාංශයේ නිලධාරිනියක්වන හොප්ට් මෙනෙවිය.

(ඈ) ගුණසිංහම් ඇතුළු පේෂ්ධ රාජ්‍ය නිලධාරීන්

(ඉ) තාක්ෂණික සහයෝගිතාවය සඳහා වූ ජර්මානු නියෝජිතායතනය.

7.1.3 ආචාර්ය වික්‍රමරත්න සහ ආචාර්ය රණතුංග මහතා ම.කො.ආ.කො.මේ ඉඩම් ගොඩ කිරීම පිළිබඳ රැස්වීමකට සහභාගී වී අදාල විෂයය ගැන නාරා ආයතනය දරණ අදහස් අඩංගු වාර්තාවක් ද ප්‍රදානය කරන ලදී.

7.1.4 මෙම විෂයය පිළිබඳව පැවැති අනුකාරක සභා රැස්වීම් පහක මුලසුන හොබවමින් ද මුහුද ගොඩ කිරීම පිළිබඳව පැවැති රැස්වීම් පහකට ද ආචාර්ය වික්‍රමරත්න සහභාගී විය.

7.1.5 ආචාර්ය වික්‍රමරත්න පරිසර විද්‍යාව හා කළමනාකරණය පිළිබඳව පැවැති සම්මන්ත්‍රණයක දී හා දුරස්ථ සන්නිවේදී කරණ පිළිබඳ සැසිවාරයක ද මුලාසනය හෙබවීය.

7.1.6 ඒරච් සහ අයිඒර්ඒ ආයතනවල නිලධාරීන් සමග පැවැති රැස්වීම්වලට ආචාර්ය වික්‍රමරත්න සහ ආචාර්ය රණතුංග සහභාගී වූහ.

7.1.7 මුතුරාජවෙල ගෙහොරු බිම් ස්ථානයට ගිය අවස්ථාවේ දී පරිසර විද්‍යා රාජ්‍ය අමාත්‍ය ගරු ආචාර්ය විමල් වික්‍රමසිංහ සහ ඊට සහභාගීවූ අනෙකුත් නිලධාරීන්ට ද එහි සංවර්ධන කටයුතු හේතු කොටගෙන මීගමු කලපුවට බල පෑ හැකි කරුණු පිළිබඳව ආචාර්ය වික්‍රමරත්න අදහස් ඉදිරිපත් කරන ලදී.

7.1.8 ආචාර්ය වික්‍රමරත්න අහිත් සැකසුණු සමුද්‍ර විද්‍යාව පිළිබඳ කණියක් එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ නේවාසික නියෝජිතරොබට් ඉංග්ලැන්ඩ් මහතාට පිළිගන්වන ලදී.

7.1.9 ආචාර්ය රණතුංග සහ නිවාස් මහතාත් මුතුරාජවෙල සම්බන්ධයෙන් ම.කො.ආ.කො.මේ පැවැති රැස්වීමකට සහභාගී වූහ.

7.1.10 මුතුරාජවෙල ව්‍යාපෘතියේ සම්බන්ධීකරණ නිලධාරී ලෙස ආචාර්ය වික්‍රමරත්න පත්කොට ගෙන ඇති අතර මෙම ව්‍යාපෘතිය සඳහා නාරා ආයතනයේ සහභාගී වීම පිළිබඳ ව්‍යාපෘති යෝජනාවක් ඔහු විසින් ඉදිරිපත් කර ඇත.

7.1.11 ඕලන්ද විශේෂඥයන්ගේ ද සහභාගිත්වයෙන් ම.කො.ආ.කො.මේ දී මුතුරාජවෙල ව්‍යාපෘතිය පිළිබඳව පැවැති රැස්වීම් 3 කට ආචාර්ය වික්‍රමරත්න සහභාගී විය.

7.1.12 මධ්‍යම පරිසර අධිකාරිය විසින් සංවිධානය කරන ලද හෙත් ඉඩම් පිළිබඳ රැස්වීමකට ආචාර්ය රණතුංග සහභාගී විය.

7.1.13 ව්‍යාපෘතියේ ප්‍රගතිය සමාලෝචනය කිරීම සඳහා ම.කො.ආ.කො.මේ පැවැති මුතුරාජවෙල ව්‍යාපෘතියේ තාක්ෂණික මෙහෙයුම් කමිටුවේ රැස්වීම් 12 කට ආචාර්ය වික්‍රමරත්න සහභාගී විය.

66 ....

## 8.0 ප්‍රකාශන.

8.1 ජාතික සංවර්ධනයෙහි ලා මුහුදු හා විද්‍යාඥයාගේ කාර්ය භාරය යන මැයෙන් ආචාර්ය ඩබ්.එස්.වික්‍රමරත්න විසින් ලියා ශ්‍රී ලංකා හා විද්‍යා සමිතියේ වාර්ෂික සමිතියේ වාර්ෂික සැසි වාරයට ඉදිරිපත් කරන ලද්දකි.

8.1.1 දෙසැම්බර් මාසයේ පැවැත්වීමට නියමිත ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමයේ වාර්ෂික සැසි වාරයට උධෘත දිහයක් ඉදිරිපත් කරන ලදී.

8.1.2 ආචාර්ය ඩබ්.එස්.වික්‍රමරත්න විසින් රචිත "ශ්‍රී ලංකාවේ පාරිසරික පැති කඩවල ස්වාභාවික සම්පත්" මෙය නරේසා/ යූඑස්ඒඅයිඩී ප්‍රකාශනයකි.

8.1.3 මීගමුව කලපුව- ලවණ කිල වර්ගයේ මෝයකි - ජේ.ඇම්.තිවාස්, පී.රණතුංග සහ ඩබ්.එස්.වික්‍රමරත්න.

8.1.4 මීගමු කලපුවේ මඬ්ඩි බැස්ම - ජේ.ඇම්.තිවාස් සහ ඩබ්.එස්. වික්‍රමරත්න.

8.1.5 මීගමු කලපුවේ බර ඛනිජ ගහණ තත්වය - ජේ.ඇ මි.තිවාස්, කේ.එස්.ගුරුගේ, ඩබ්.එස්.වික්‍රමරත්න

8.1.6 මුන්දල් වැවේ ජල විද්‍යාව සහ යපස් - කේ.එස්.ගුරුගේ, ඩබ්.එස්. වික්‍රමරත්න

8.1.7 කල්පිටිය මීගමුව ඔබ්බෙන් පිහිටි මහාද්වීපික රාක්කයේ මතුපිට අවසාදිතවල මඬ්ඩි වියමන - ටී.ධර්මරත්න

8.1.8 කල්පිටිය - කොළඹ ඔබ්බෙන් පිහිටි මහාද්වීපික රාක්කයේ ආරම්භය හා කාබොනේට් විසිරීම - ටී.ධර්මරත්න.

8.1.9 වැලිගම වරායේ රූප විද්‍යාත්මක පරිනාමය හා ආරම්භය - ඊ.එම්.එස්.විජේරත්න, ආර්.සමරකෝන්

8.1.10 මීගමු කලපු පිටවානේ උදම් ප්‍රවාහ නිරීක්ෂණ - කේ.එම්.එස්. විජේරත්න ,ඩබ්.එස්.වික්‍රමරත්න

8.1.11 මීගමු කලපුවේ පෝෂක විසිරීම - ජේ.එම්.තිවාස්, ආර්.සමරකෝන් ඩබ්ලිව්.එස්.වික්‍රමරත්න, පද්මිනී ද අල්විස්.

## ජාතික ජල ශාස්ත්‍රීය කාර්යාලයේ වාර්ෂික වාර්තාව. 1990.

1.0 ශ්‍රී ලංකා නාවික හමුදාවත්, මිනින්දෝරු දෙපාර්තමේන්තුවත් සමග නාරා ආයතනයේ ජාතික ජල ශාස්ත්‍රීය කාර්යාලය 1984 මාර්තු 13 දින ආරම්භ කරන ලදී. මිනින්දෝරු ජනරාල් හෝ ඔහු විසින් නම් කරන්නෙකු ද, නාවික හමුදාපති හෝ ඔහු විසින් නම් කරන්නෙකු ද හා නාරා ආයතනයේ සභාපති යන තුන් දෙනෙකුගෙන් සමන්විත පාලක මණ්ඩලයක් විසින් ජාතික ජල ශාස්ත්‍රීය කාර්යාලය පාලනය කරනු ලබයි.
ජාතික ජලශාස්ත්‍රීය කාර්යාලයේ ප්‍රධාන පරමාර්ථ නම් ශ්‍රී ලංකා අනන්‍ය ආර්ථික කලාපයතුළ ගොඩතර හා ඇතුලත ජලස්ථාන, නුදුරු වෙරළේ සහ වෙරළෙන් ඔබ්බෙහි ජාතික සමුද්‍ර ප්‍රදේශයේ සිට පිටත සීමාව දක්වා විස්තරාත්මක සමුද්‍ර විද්‍යාත්මක සමීක්ෂණ කටයුතු කිරීමත් එම සමීක්ෂණ ප්‍රතිඵල ඇතුලත් ජලතරණ සටහන් පත් හා වෙනත් ලියවිලි සකස් කිරීමත්ය.
ජාතික ජලශාස්ත්‍රීය කාර්යාලයේ ප්‍රධාන කර්තව්‍යයන් නම් පහත සඳහන් දෑ සකස් කිරීමය:

(අ) ශ්‍රී ලංකාවේ අනන්‍ය ආර්ථික කලාපයේ අවසාන මායිම දක්වා වූ බහුමික ජලස්ථානවල ජල තරණ සටහන් පත් සැකසීම.

(ආ) ජාතික ජල ධාරිතයේ උදම් වක්‍ර.

(ඇ) ජාතික ජල ධාරිතයේ සම උදම් වක්‍ර

(ඈ) මුහුදු යන්නන්ට දැන්වීම් සකස් කොට නිකුත් කිරීම හා

(ඉ) මෙම ලියවිලි නොකඩවාම යාවත්කාලීන කිරීම

2.0 <u>සේවක පිරිස්.</u>

1990 වසරේ ජාතික ජල ශාස්ත්‍රීය කාර්යාලයේ සේවක මණ්ඩලය පහත සඳහන් පරිදි විය.

(අ) ජාතික ජල ශාස්ත්‍රීය කාර්යාලයේ
වැඩබලන ප්‍රධානියා - ආචාර්ය.ඩබ්.එස්.වික්‍රමරත්න
සමුද්‍රවිද්‍යා විද්‍යා අධ්‍යක්ෂ
(90.01.25 දිනදක්වා)

ජාතික ජල ශාස්ත්‍රීය කාර්යාලයේ
ප්‍රධානියා - ආර්.ද.එස්.එස්.අමරසේකර මහතා
විද්‍යාවේ දී ලුයිතේරුත්ති, (90.01.25 සිට මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ සිට ද්විතීයතය මතය)

- 68 ....

(ආ) ප්‍රධාන ගොඩබිම් මිනින්දෝරු - විමල් කුමාර සිංහ - 90.07.31 සිට
මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ සිට
ද්විතීයනය මත

(ඇ) පුහුණු මිනින්දෝරුවන් - එස්.ඩබ්.එස්.වීරසිංහ මහතා, විද්‍යාවේ දී
වැඩයටහන් ඩිප්ලෝමා.

- එස්.විතාන මයා , විද්‍යාවේ දී

- එම්.ඒ.ආරියවංශ මහතා , විද්‍යාවේ දී
සංඛ්‍යාලේඛන පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා.

(ඈ) ජලමාන මිනින්දෝරු- බීඑච්.බී.නිශාල් සිල්වා මයා, මිනින්දෝරු සහ
තලමිති ඩිප්ලෝමා.

(ඉ) ගොඩබිම මිනින්දෝරු- එල්.ජේ.ගුණසේකර මයා - එම -
මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ සිට ද්විතීයනය මත

කේ.ඒ.පෙරේරා මයා, එම - එම -

ඒ.ඩබ්.ගුණසේකර මයා, එම

එච්.එච්.එම්.එන්.වීරකුමාර මයා - එම -
නාරා ආයතනය විසින් බඳවා ගන්නා ලදී.

(ඊ) මිනින්දෝරු වාර්තා
කරුවන් - ඩී.එස්.ආර්.ඩබ්.කේ.වෛද්දිය මයා -නාවුක
හමුදාවේ සිට ද්විතීයනය පදනම මත.

ඒ.පී.තිලකරත්න මයා , එම-

ඒ.ඩබ්.එච්.තිලකසිරිමයා , එම

(උ) සැලසුම්කරු - පී.බී.රත්නපාල මහතා - බලය ලත් සැලසුම්කරු
සඳහා පොදු මිනින්දෝරු බලපත්‍රය.
ඩබ්.ඒ.විල්ප්‍රඩ් මයා - එම -

(ඌ)ලඝුලේඛක/යතුරුලියන්නා - එම්.ඩී.සී.ජයන්ති රොඩ්රිගු මෙනෙවිය.

(එ) සිතියම් විද්‍යා උපදේශක - වෝල්ටර් ගුණරත්න මහතා, සිතියම් විද්‍යා
ඩිප්ලෝමාව.

(ඒ) ව්‍යාපෘති සේවක පිරිය නාරා/ජීටීඉසෙඩ් ව්‍යාපෘතිය - මයිකල් ගෘබර් -
සිතියම් විද්‍යා උපදේශක සහ කණ්ඩායම් නායක
යූ.බ්ලේක් මෙනෙවිය - ජලමාන විශේෂඥ - කෙටිකාලීන
හර්මන් න/පර් - විද්යුද් විශේෂඥ

69 ....

3.0 සේවා ඔන්ඩල වෙනස් වීම්, උසස්වීම්, සේවය ස්ථිර කිරීම් ආදිය හා පුහුණු පාඨ මාලා හැදෑරීමේ විස්තර -

(අ) එස්.ඩබ්.එස්.වීරසිංහ මහතා - පුහුණු මිනින්දෝරු - පරිගණක වැඩ සටහන් සම්පාදනය පිළිබඳ සිවි මසක පුහුණුවක් ලැබූ අතර සිං.ස.අයිඩීඑම් සමාගම විසින් ඩිප්ලෝමා සහතිකය ලැබ ඇත.

(ආ) යතුරු ලේඛිකා එම්.ඩී.සී.ජයන්ති රොද්රිගු මහත්මිය වචන සැකසීම පිළිබඳ තුන් මසක පුහුණුවක් ලැබුවාය.

## 4.0 පැවැත්වූ සම්මන්ත්‍රණ, ඉහළපෙළේ සාකච්ඡා සහ වැඩ මුළු.

### අ.පරමාර්ථ දිගාන්ත ව්‍යාපෘති සැලසුම් සම්මන්ත්‍රණය.(ඉසෙඩ්ඕපීපී)

ජාතික ජලශාස්ත්‍රීය කාර්යාලය ශක්තිමත් කිරීම සඳහා වූ ව්‍යාපෘතිය මගින් සංවිධානය කරන ලද මෙම සම්මන්ත්‍රණය 1990 පෙබරවාරි 12 - 16 දින දක්වා කළුතර දී පැවැත්වුණි.

වැඩ මුළුවෙහි ප්‍රධාන පරමාර්ථ නම් :

I. ව්‍යාපෘතියේ පරමාර්ථ පැහැදිලිවුත්, ගැලපෙන පරිදිවුත්, උපලබ්ධිවුත් හා අගැයිය හැකි වුත් ආකාරයට අර්ථදීපනය කිරීම.

II. ව්‍යාපෘතියේ සංකල්පය සංවර්ධනය කිරීම.

III. ශ්‍රී ලංකා සහ ජර්මානු ව්‍යාපෘති සේවක පිරිස නව සැලසුම් තාක්ෂණය සමග වැඩ මුළුවට සහභාගී වුවත් පහත සඳහන් පරිදි විය.

විදේශික උපදේශක වරුන් තිදෙනෙකු ද ඇතුළුව නාරා හා ජා.ජ.කා. වෙනුවෙන් සහභාගී වූ ගණන 12 කි.

මිනින්දෝරු දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා නාවික හමුදාව හා නාරා ආයතනයේ සම්පත් පිළිබඳ නිලධාරී මහතුන් 03 යි.

තාක්ෂණික සහයෝගිතාවය සඳහා වූ ජර්මානු ආයතනයේ (ජී.ටීඉසෙඩ්) ව්‍යාපෘති කළමනාකරුවන් 02 යි.

(ජර්මනියෙන් එක් අයෙකු ද, ශ්‍රී ලංකාවෙන් එක් අයෙකු ද වශයෙන්) ප්‍රමාණික උපදේශක වරුන් 03 යි.

ධීවර හා ජලජ සම්පත් රාජ්‍ය අමාත්‍ය තුමා ද සහභාගී වූ ආරම්භක උත්සවයට පැමිණීමට නියමිතව සිටි( ඒ ඒ ක්ෂෙත්‍ර වලින්) ආරාධිතයින් 16 යි.

නාරා ආයතනයේ /ජීටීඉසෙඩ් ආයතනයේ නායක මයිකල් ශෘබර් මහතා ද සමග ආචාර්ය එක්හාඩ්ට් ස්ප්‍රීන්(ප්‍රමාණික) හා මල්ලිකා සමරනායක මහත්මිය(ප්‍රමාණික) යන නිලධාරීහු විසින් මෙම වැඩ මුළුවේ සංක්ෂිප්ත වාර්තාව සකස් කරන ලදී.

70 ....

(ආ) <u>ප්‍රතිඵල ලාභීන් දිශානත සම්මන්ත්‍රණය :</u>

කළුතර දී පැවැත්වුණු පරමාර්ථ දිශානත ව්‍යාපෘති සැලසුම් සම්මන්ත්‍රණයේ දී ප්‍රතිඵල ලාභීන් දිශානත සම්මන්ත්‍රණයක් ද පැවැත්විය යුතු යැයි තීරණය විණ. මෙහි පරමාර්ථය යුයේ අන්‍යෝන්‍ය සිතැඟි හා සහයෝගිතාවයන් කවරේද යන්න හඳුනාගෙන ඒ අනුව විස්තරාත්මක දීර්ඝ කාලීන මෙහෙයුම් සැලැස්මක් පිළියෙල කිරීමට ජාතික ජල ශාස්ත්‍රීය කාර්යාලයට හැකිවනු ඇත. මේ සඳහා පිටස්තර නියෝජිතායතන 15 කට ද රජයේ දෙපාර්තමේන්තුවලට ද සංස්ථාවලට ද ආරාධනා කරනු ලැබීය. සම්මන්ත්‍රණය 1990 අප්‍රේල් මස 10 දින නාරා ආයතනයේ ශ්‍රවණාගාරයේ දී පැවැත්විණ.

ජාතික ජල ශාස්ත්‍රීය කාර්යාලයට මෙහිලා විවිධ කටයුතු සම්බන්ධීකරණය කිරීමේ ලා වැදගත් කාර්ය භාරයක් ඉටු කිරීමට පමණක් නොව ඒ වැඩ කටයුතු වලින් සෑහෙන ප්‍රමාණයකට සහභාගි වීමට ද හැකිවන බැව් මෙහි දී පෙනී යන ලදී. සම්මන්ත්‍රණය විවෘත සාකච්ඡාවක ස්වරූපයක් ගන්නා ලදී.

සමාරම්භක දේශනය ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශයේ ලේකම්, එච්. වී. කේ. කේ. වීරගොඩ මහතා විසින් කරන ලදී.

(ඇ) ජාතික ජල ශාස්ත්‍රීය කාර්යාලය ශක්තිමත් කිරීම උදෙසා මෙහෙයුම් සැලැස්ම සකස් කිරීම පිණිස සම්මන්ත්‍රණයක් හා වැඩ මුළුවක්.

කළුතර පැවැත් වූ පරමාර්ථ දිශානත ව්‍යාපෘති සැලසුම් වැඩමුළුවේ ප්‍රතිඵලයක් වශයෙන් 1990 ඔක්තෝබර් සිට 1993 සැප්තැම්බර් දක්වා කාලය සඳහා මෙහෙයුම් සැලැස්මක් සැකසීම පිණිස වැඩ මුළුවක් 1990 මැයි මස 12 සිට 14 දින දක්වා කොළඹ දී පැවැත් විණ. මෙයට සහභාගී වූ පිරිස ශ්‍රී ලංකාවේ නාවික හමුදාවේ, මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ හා නාරා ආයතනයේ/ජාතික ජලශාස්ත්‍රීය කාර්යාලයේ නියෝජිතයින්ට පමණක් සීමාවීය.

1990 පෙබරවාරි මාසයේ දී පැවැති සම්මන්ත්‍රණයේ දී ව්‍යාපෘති අවශ්‍යතාවන් මුදුන්පත් කර ගැනීම සඳහා වූ නිපැයුම් ද ඒ එක් එක් නිපැයුමට සම්බන්ධ ක්‍රියා කටයුතු ද හඳුනා ගන්නා ලදී. එක් එක් කටයුත්තක් සඳහා වූ අනු කටයුතු මොනවා දැයි මෙම සම්මන්ත්‍රණයේ දී හඳුනාගත් අතර ව්‍යාපෘතිය නිම කිරීම පිණිසගතවන ඉලක්ක කාලය ද තක්සේරු කරනු ලැබීය. වෙනස් විය හැකි කරුණු හා වෙනස් වීමේ ප්‍රමාදයන් මොනවා ද යන්නත් හඳුනාගෙන ඒවා උප කල්පනයන් සමග ලේඛනගත කරන ලදී.

14 වැනි දින එනම් වැඩ මුළුවේ ප්‍රතිඵලසටහන් කෙරෙන අවසාන දිනයේ සහභාගී වූ පිරිසට ජාතික ජල ශාස්ත්‍රීය කාර්යාලයේ අධ්‍යක්ෂ මණ්ඩලයත්, නාරා ආයතනයේ සභාපතිතුමාත් අදාල අමාත්‍යාංශවල නියෝජිතයනුත් ඇතුලත් වූහ.

ඇ. විද්‍යුත් සටහන් ප්‍රදර්ශන පද්ධතිය ප්‍රදර්ශණය කිරීම.

නාරා /පීටීඉසෙඩ් ව්‍යාපෘති සේවක පිරිස් විසින් සංවර්ධනය කරනු ලැබූ විද්‍යුද් සටහන් ප්‍රදර්ශන පද්ධතිය ප්‍රදර්ශනය කර පෙන්වීමේ එක්දින සම්මන්ත්‍රණයක් 1990 මැයි මස 23 දින නාරා ශ්‍රවනාගාරයේ දී පැවැත්විණ.
මේ සඳහා සහභාගී වූවන් අතර, මිනින්දෝරු දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා නාවික හමුදාව, ශ්‍රී ලංකා ගුවන් හමුදාව, ශ්‍රී ලංකා යුද හමුදාව නාරා ආයතනය හා ජාතික ජලශාස්ත්‍රීය කාර්යාලයේ ද නියෝජිත පිරිස් ද වූහ.

ජල ශාස්ත්‍රීය උපදේශක මයිකල් ගෲබර් මහතාගේ උපකාරය ද ඇතිව ජල ශාස්ත්‍රීය විශේෂඥ බිල්කේ මෙතෙව්ය විසින් මෙම පද්ධතිය ප්‍රදර්ශනය කොට පෙන්වන ලද අතර මෙය කුඩා පරිගණකයක වැඩ සටහනක් විකරණය කිරීමෙන් පෞද්ගලික පරිගණකයක් මගින් ක්‍රියා කරවිය හැකි අනු පද්ධතිය ප්‍රදර්ශණය කිරීමෙන් අනතුරුව විවෘත සාකච්ඡාවක් ද පැවැත්වින.

ඉ. මෙහෙයුම් සැලැස්ම සම්බන්ධ ජාතික ජලමාන කාර්යාලයේ ක්‍රියාකාරී කණ්ඩායමේ රැස්වීම්.

මෙහි පහත කෙටියෙන් සඳහන් කර ඇති පරිදි ජාතික ජල ශාස්ත්‍රීය කාර්යාලය ශක්තිමත් කිරීම පිණිස වූ මෙහෙයුම් සැලැස්මේ ප්‍රධාන ක්‍රියා කටයුතු පහක් ක්‍රියාවට නැංවීම පිණිස ජාතික ජල ශාස්ත්‍රීය කාර්යාලයේ නිලධාරීන්ගෙන් සමන්විත කාරක කණ්ඩායම් පහක් පිහිටුවා ගන්නා ලදී.

I. ව්‍යාපෘති ගත ක්‍රියා කටයුතු සපුරා ගැනීමට සේවක පිරිස් පුහුණු කරන ලදී.

II. ජාතික ජල ශාස්ත්‍රීය කාර්යාලයේ කළමනාකාරිත්වය කාර්යක්ෂම හා ක්‍රියා ශීලීයය.

III. අවශ්‍ය උපකරණ සවිකොට ක්‍රියා කාරී වෙමින් පවතී.

IV. වැඩ සැලසුමේ ප්‍රකාර ජල ශාස්ත්‍රීය තොරතුරු ලබා ගත හැකිව ඇත.

V. ජාතික හා අන්තර් ජාතික සහයෝගය ස්ථාපිත කොට තිබේ.

1990 වසර තුළ කාරක කණ්ඩායම් වල රැස්වීම් හයක් පවත්වා ඇත.

ඊ. එක්සත් රාජධානියේ හැමිල්ටන් හි පැවැති "හයිඩ්‍රෝ '90' රැස්වීම.

ජල ශාස්ත්‍රීය සංගමයේ 'හයිඩ්‍රෝ 90' නම්වූ ද්විවාර්ෂික අන්තර් ජාතික රැස්වීමට පහළ සඳහන් නිලධාරීහු සහභාගී වූහ. මෙම රැස්වීම එක්සත් රාජධානියේ සවුදැම්ප්ටන් විශ්ව විද්‍යාලයේ 1990 දෙසැම්බර් 18 සිට 20 දින දක්වා පැවැත්විණ.

**සහභාගී වූ නිලධාරී පිරිස.**

ආර්.ද එස්.එස්. අමරසේකර මහතා - ජා.ජ.කා/ප්‍රධානියා.
එස්.විතාන මහතා - ජා.ජ.කා/ ප්‍රධාන මිනින්දෝරු.
එච්.එම්.ගණබර් මහතා - නාරා/පීටීඉසෙඩ් ව්‍යාපෘතියේ සම්බන්ධී කරණ නිලධාරී.

රැස්වීමේ දී ඉදිරිපත් කරන ලද ප්‍රකාශන පහත සඳහන් නම් වලින් හඳුන්වනු ලැබිය.

I. නීති සහ ව්‍යාප්තිමය කරුණු
II. ධීවනික මිනුම්
III. පරිසරය
IV. භෞතීය පිහිටුවීමේ පද්ධතිය
V. විද්‍යුද් සටහන
VI. හැරීමේ මෙහෙයුම්.

**උ. ජාතික ජල ශාස්ත්‍රීය කාර්යාලයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීම්.**

සමාලෝචනයට භාජනය වන කාල සීමාව තුල ජාතික ජල ශාස්ත්‍රීය කාර්යාලයේ අධ්‍යක්ෂ මණ්ඩල හයක් පවත්වා ඇත.

ආචාර්ය හිරාන් ඩබ්ලිව්.ජයවර්ධන නාරා/ සභාපති( 90.08.14 දක්වා)
එස්.මී.හේරත් මහතා - මිනින්දෝරු ජනරාල්
කොමදෝරු එච්.එන්.කිවු. වික්‍රමරත්න - ශ්‍රී ලංකා නාවික හමුදාව ( 90.03.02 දක්වා)
කොම දෝරු සී.ඒ.එම්.ජයමහ - ශ්‍රී ලංකා නාවික හමුදාව ( 90.05.23 සිට)

5.0 කොන්ත්‍රාත්තු මත 1900 වසර තුල සිදු කරන ලද ජල ශාස්ත්‍රීය සමීක්ෂණ පිළිබඳ වාර්තාව.

අ. බෙන්තොට සිට අම්බලන්ගොඩ දක්වා වූ වෙරළ විහිදුමේ වෙරළ ඉංජිනේරු පරීක්ෂණ.

වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවත් / තාක්ෂණික සහයෝගිතාවය සඳහා වූ ජර්මානු ඒජන්සියත් සඳහා කොන්ත්‍රාත්තුවක් යටතේ ජාතික ජල ශාස්ත්‍රීය කාර්යාලය විසින් මෙම සමීක්ෂණය භාරගෙන ඇත. රු.3.18,306/00 ක් සඳහා වූ මෙම කොන්ත්‍රාත්තුව 1990 මාර්තු මස 14 වැනි දින ආරම්භ කරන ලදී.

, 73 ......

මෙම සමීක්ෂණයෙන් ආවරණය වනුයේ දිගින් කි.මී.2..5 ක් වූත් බෙන්තොටට කිට්ටුව ඇති ගොඩගල සිට අම්බලන්ගොඩට දකුණෙන් පිහිටි උස් මුදුලාව යන ප්‍රදේශ ඇතුළත් වෙරළ තීරුවකි. මීට අදාල වැඩ කටයුතු අතර වෙරළ පාලනය හා වෙරළ ඉදිරියෙන් සවිස්තරාත්මක සමීක්ෂණයන් වැල්ලේ පැතිකඩ කිරීම් ,ආගාධමිතික සමීක්ෂණ පතුළ නියැදි කිරීම හා වැල්ලේ නියැදි කිරීමයි.

සමාලෝචනයට භාජනය වන කාල සීමාව තුල සමීක්ෂණ කටයුතු අවසන් කරනු ලැබූ අතර අවසාන සැලසුම් හා ලියවිලි වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව/ තාක්ෂණික සහයෝගිතාවය සඳහා වූ ජර්මානු ඒජන්සියේ ව්‍යාපෘතිකළමනාකාර වෙත 1990 දෙසැම්බර් මස 20 වැනි දින භාර දෙන ලදී. මෙම ව්‍යාපෘතියටම අයත් ඉඳුරුව විහිදුමේ වෛකල්පික වැඩ සඳහා කොන්ත්‍රාත්තුව ද වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව/ තාක්ෂණික සහයෝගිතාවය සඳහා වූ ජර්මානු ඒජන්සිය විසින් ජල ශාස්ත්‍රීය කාර්යාලයට පවරන ලදී. රුපියල් 4,12,733/00 ක් සඳහා වූ මෙම කොන්ත්‍රාත්තුව 1990 අප්‍රේල් 16 දින භාර දෙනු ලැබීය. ඉඳුරුව විහිදුමේ වසරක් තුල මාස් පතා වෙරළ පැතිකඩ කිරීම මෙම මෛවකල්පික වැඩ කටයුතු වලින් ආවරණය වේ. වසර පුරා පැතිකඩ කිරීම් 671 ක් කළ අතර 1990 ඔක්තෝබර්/නොවැම්බර් නිරිත දිග මෝසම් සමයේ දී නැවත පිරික්සීම් ද කරන ලදී. මෙම කාලය තුලදී වැලි නියැදි කොට විශ්ලේෂණය කිරීම ද නිම කරන ලදී.1990 තුල අධීක්ෂණ වැඩ සටහන් අටක් අවසන් කරන ලදී.

ආ. <u>වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව සඳහා කන්ද කුලිය වෙරළ විහිදුමේ වෙරළ ඉංජිනේරු පරීක්ෂණ.</u>

රු.2,10,637/50 ක් සඳහා වූ මෙම කොන්ත්‍රාත්තුව 90.04.11 දින නාරා/ජා.ජ.කාර්යාලයට පවරන ලදී.

මේ යටතේ වෙරළ පාලනය, ඉදිරි වෙරළ විස්තරාත්මක සමීක්ෂණය, මට්ටම් කිරීම,පාලන ලක්ෂ්‍යයවල ස්මාරක පිහිටුවීම වෙරළ පැතිකඩකිරීම හා ආගාධමිතික කටයුතු 1990 අවසාන භාගයේ දී නිම කරන ලදී. කාර්යාල කටයුතු හා අවසාන සැලසුම් හා වාර්තා සැකසීමේ වැඩ 1991 ජනවාරි මාසයේ දී අවසන් කිරීමට බලාපොරොත්තු වනු ලැබේ.

ඇ. <u>වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව සඳහා වෙරළ ඉංජිනේරු පරීක්ෂණ අඹකන්දවිල/හොඩුවාව වෙරළ තීරුව.</u>

රු.2,05,375/= ක් සඳහා වූ මෙම සමීක්ෂණ කොන්ත්‍රාත්තුව 90.4.11 දින නාරා/ජා.ජ.කාර්යාලය වෙත පැවරිණ.
සමාලෝචනයට භාජනය වන කාල සීමාව තුල වෙරළ පාලනය හා ඉදිරි වෙරළ සවිස්තරාත්මක සමීක්ෂණ කටයුතු වලින් 50% ක් පමණ අවසන් කරනු ලැබීය. වෙරළ පැතිකඩ 31 ක වැඩ අවසන් කෙරිණ. 19[illegible] පළමු කාර්තුවේ දී මෙහි වැඩ අවසන් කිරීමට බලාපොරොත්තු වේ.

74 .....

6.0. තාරා ආයතනයේ ඒ ඒ අංශවලට හා වෙනත් සංවිධානවලට සැපයූ සේවා පිළිබඳ වාර්තා.

(අ) කොළඹ ගාලු මුවදොරට ඔබ්බෙන් චුම්බක ප්‍රමිතික සමීක්ෂණය.

වේල්ස් හි බ්‍රිතාන්‍ය ජාතික කෞතුකාගාරයේ ආචාර්ය මාක් රෙඩ්නැප් සහ තාරා ආයතනයේ සභාපතිග් අතර ඇති කර ගත් ගිවිසුමක් යටතේ 'ගෝල් බක්' ස්ථානයට ඔබ්බෙන් දියෙහි ඇති 'ඩංකන් සේලර්' නමැති යාත්‍රාවේ සුං බුං සොයා ගත හැකි වේ දැයි දැන ගැනීමට චුම්බක ප්‍රමිතික හා ආගාධ මිතික සමීක්ෂණයක් පවත්වන ලදී. මේ සඳහා සමුද්‍ර විද්‍යා අංශයේ සහයෝගය ද ලබා ගෙන 1 : 1000 ප්‍රමාණයේ සැලැස්මක් ද සකස් කරන ලදී.

(ආ) කඩොල් කැලේ ගොඩබිම සමීක්ෂණය.

පාරක් තැනීම පිණිස පස් වැඩ ධාරිතාවය ඇස්තමේන්තු කිරීම සඳහා කඩොල් කැලේ දී සමීක්ෂණයක් කරන ලදී. මේ පිළිබඳව ක්ෂෙත්‍ර වැඩ හා සැලැසුම් සැකසීමට ආයත කොටස් හා හරස් කොටස් ලකුණු කිරීමේ වැඩ අවසන් කරන ලද අතර පස් වැඩ පිළිබඳ ඇස්තමේන්තු ද ගණනය කරන ලදී.

(ඇ) වැලිගම වරායේ ජල ශාස්ත්‍රීය සමීක්ෂණය.

1990 පෙබරවාරි මස දී ක්ෂෙත්‍ර වැඩ අවසන් කරන ලදී. 1990 මාර්තු මස දී වරායේ සැලැස්ම ඇඳීමේ වැඩ අවසන් කරන ලදී. සමුද්‍ර විද්‍යා අංශය සඳහා වරායේ හා අවට ප්‍රදේශවල හෑ විද්‍යාත්මක සිතියම් ද සකස් කරන ලදී.

(ඇ) පුරාණවැල්ලේ ජල ශාස්ත්‍රීය සමීක්ෂණය.

මෙම සමීක්ෂණය ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශයේ කොන්ත්‍රාත් පදනම මත භාරගත් කාර්යයකි. මෙම සමීක්ෂණයේ අරමුණ දැනට තිබෙන දියකඩනයේ පාරිසරික පල විපාක මොනවා ද යන්න නිශ්චයනය කිරීමයි. සමුද්‍ර විද්‍යා අංශයේ ද සහයෝගය ඇතිව ජාතික ජල ශාස්ත්‍රීය කාර්යාලය විසින් වෙරළ පාලනය, වෙරළ පැතිකඩ කිරීම් හා සාමාන්‍ය ආගාධමිතික කටයුතු කරන ලදී. වෙරළ තීරුව මාතර හා ගන්දර අතර ප්‍රදේශයය.

කාර්යාල කටයුතු සහ අවසාන සැලසුම් සහ වාර්තා සැකසීමේ කටයුතු 1990 දෙසැම්බර් අග භාගයේ දී කරන ලදී. 1991 ජනවාරි මස දී ද මෙම කටයුතුවල නිරත වනු ඇත. මෙම ව්‍යාපෘතියේ කොන්ත්‍රාත් මුදල රු. 10,56,000/= කි.

## 7.0 විවිධ කටයුතු.

1990 වසර තුළ පහත සඳහන් විවිධ කටයුතු කරන ලදී.

අ. ජාතික ජල ශාස්ත්‍රීය කාර්යාලයට අයත් පරිගණකාගාරය, පොදු කාර්යාලය සහ සමුද්‍ර විද්‍යා අංශය ද පිළිබඳ සැලැස්මක් සකස් කරන ලදී. මෙම යෝජිත ඒකක ව්‍යාප්ති කටයුතු සඳහාය.

ආ. අයොමැක් II සම්මන්ත්‍රණය සඳහා ' සිතියම් විද්‍යාව දැක්වෙන ආකාරයට ඉන්දියානු සාගරයේ පරිනාමය ' යන බිත්ති පෝස්ටරයක් සැකසීම.

ඇ. මීගමු නගරය පිළිබඳ මිනුම්පත් වල විචිත්‍රයක් සැකසීම.

ඈ. කල්පිටියේ යෝජිත මුහුදු අභය භූමිය පෙන්නුම් කරන සිතියමක් සැකසීම.

ඉ. නාරා අත්පොත සඳහා සිංහල පරිවර්තනයක් ද සහිතව ජාතික ජල ශාස්ත්‍රීය කාර්යාලය පිළිබඳ ලියවිලි තුනක් සහ සටහන් සැකසීම.

ඊ. ඉහත සඳහන් වැඩ වලට අමතරව සමාලෝචනයට භාජනය වන කාල සීමාව තුළ නාරා ආයතනයේ ඒ ඒ ඒකක සඳහා සිතියම් ඵහන් පත්‍ර, රේඛා සටහන් සහ කටු සටහන් සකස් කිරීමට ආධාර කිරීමත්, මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ සමීක්ෂණ කටයුතුවලට අදාල විවිධ පරීක්ෂණ වලට සම්බන්ධ වීමත් වෙනත් ඒජන්සි ආයතනවලට සේවා කටයුතු සැපයීමත් මෙම අංශය විසින් කරන ලදී.

- 0 -

මගේ අංකය: එල්එස්/පී/තාරා/11/90　　විගණකාධිපති දෙපාර්තමේන්තුව,
නිදහස් චතුරශ්‍රය, කොළ 07.

1992 අප්‍රේල් 10 දින.

සභාපති,
ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය.

**ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනයේ 1990 දෙසැම්බර් 31 වෙනි දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ගිණුම් පිළිබඳව 1971 අංක 38 දරණ මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රාකර විගණකාධිපති වාර්තාව.**

ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනයේ 1990 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ගිණුම්, 1971 අංක 38 දරණ මුදල් පනතේ 13 (1) වගන්තිය සමඟ සංයෝජිතව කියැවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංග්‍රහයේ 154 (1) ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර නියෝජිතායතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කල යුතු යයි මා අදහස් කරන මාගේ නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13 (7) (ඒ) වගන්තිය ප්‍රකාර සවිස්තර වාර්තාවක් 1991 ඔක්තෝම්බර් 15 දින නියෝජිතායතනයේ සභාපති වරයා වෙත යවන ලදී.

1:2

1:2 විගණන විෂය පථය

මෙම වාර්තාවේ අඩංගු විගණන මතය, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම් විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනයන් පිළිබඳ සමාලෝචනය සහ ගණුදෙනු පිළිබඳ ප්‍රමාණවත් තියැදි පරීක්‍ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය මට ලැබී ඇති කාර්ය මණ්ඩලය හා වෙනත් සම්පත් සහ කාලවේලාව යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළහැකිවන පරිදි පිලියෙල කරන ලද්දකි. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

## 2. ගිණුම්

### 2:1 විගණන මතය

මෙම වාර්තාවේ දැක්වෙන අදහස් දැක්වීම් හේතුකොට ගෙන ඉදිරිපත් කර ඇති ගිණුම් පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට මට නොහැකිය. මේ පිළිබඳව නිරීක්ෂණය කරන ලද ප්‍රධාන අඩුපාඩු පහත වගු කොට දැක්වේ.

| අඩුපාඩුව | වාර්තාවේ ඇතුලත් ඡේදයට යොමුව |
|---|---|
| (I) සාවද්‍ය ගිණුම් ප්‍රතිපත්ති | 2:5:1 |
| (II) නො සසඳන ලද වෙනස්කම් | 2:5:2 |
| (III) ගිණුම් වලින් අත්හැරීම් | 2:5:3 |
| (IV) ගිණුම් වල අනුචිත අනාවරණය කිරීම් | 2:5:4 |
| (V) දීඝ කාලීනව හිඟ මුදල් හිමිකම් | 2:5:5 |
| (VI) විගණනය සඳහා සාක්ෂි නොමැතිවීම | 2:5:6 |
| (VII) නතිරීති, රෙගුලාසි, කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම | 2:5:7 |
| (IX) පද්ධති හා පාලන අඩුපාඩු | 4 |

**2:2** **මූල්‍ය ප්‍රතිඵල.**

ගිණුම් අනුව සමාලෝචිත වර්ෂය තුල නියෝජිතායතනයේ වැඩ කටයුතු වල ප්‍රතිඵලය රු.87,15,370 ක ඌනතාවක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂය තුල රු.61,29,198 ක ඌනතාවක් විය. සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා මූල්‍යමය ප්‍රතිඵල පිළිබඳ සාරාංශයක් පහත ප්‍රකාශයෙන් දැක්වේ.

| | දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය | | | |
|---|---|---|---|---|
| | 1990 | | 1989 | |
| | රු. | රු. | රු. | රු. |
| **ආදායම.** | | | | |
| රජයේ දායකය | 1,35,00,000 | | 1,21,66,600 | |
| විවිධ ආදායම | 2,40,066 | | 1,88,157 | |
| | | 1,37,40,066 | | 1,23,54[illegible] |
| **වියදම** | | | | |
| පරිපාලන වියදම් | 1,88,08,939 | | 1,48,38,798 | |
| ආයතන වියදම් | 11,65,722 | | 8,25,822 | |
| ක්ෂය ප්‍රතිපාදනය | 29,43,534 | | 2[illegible] 19,335 | |
| | 2,29,18,195 | | | |
| අඩුකලා: ව්‍යාපෘති වලින් අයකර ගැනීම් | 4,62,759 | 2,24,55,436 | - | 1,84,83,955 |
| | | (87,15,370) | | (61,29,198) |
| සමුච්චිත ඌනතාව ඉදිරියට ගෙන ආවා | (2,77,35,552) | | (2,05,48,220) | |
| අඩුකලා: පෙර වර්ෂය සඳහා ගැලපුම් | 4,75,250 | (2,72,60,302) | (10,58,134) | (2,16,06,35[illegible] |
| සමුච්චිත ඌනතාව ඉදිරියට ගෙන ගියා | | (3,59,75,672) | | (2,77,35,558) |

## 2:3 මූල්‍ය ව්‍යුහය.

නියෝජිතායතනයේ 1990 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ව්‍යුහය 1989 දෙසැම්බර් 31 දිනට පැවති තත්වය සමඟ සසඳා පහත ප්‍රකාශයෙහි දැක්වේ.

| | | දෙසැම්බර් 31 වෙනි දිනට | |
|---|---|---|---|
| **සම්පත්** | | | |
| රජයේ දායකය | | 4,74,53,380 | 3,95,53,380 |
| විදේශාධාර | 4,15,05,960 | | |
| අඩුකලා: විශේෂ ඩොලර් ගිණුමේ ශේෂය සඳහා ගැලපුම් | 88,53,775) | 3,26,52,185 | 3,98,11,261 |
| වෙනත් දායකයන් | | 4,71,409 | 3,50,000 |
| | | 8,05,76,974 | 7,97,14,641 |
| අඩුකලා: සමුච්චිත ඌනතාව | | (3,59,75,672) | (2,77,35,552) |
| | | 4,46,01,302 | 5,19,79,089 |
| **උපයෝජනය** | | | |
| ස්ථාවර වත්කම් ලියා අත්හළ වටිනාකමට | | 1,65,98,556 | 1,85,29,206 |
| විදේශාධාර ව්‍යාපෘති | | 2,15,62,094 | 1,93,22,445 |
| වෙනත් ව්‍යාපෘති | | 49,80,034 | 36,14,152 |
| නොනිමි වැඩ | | 3,66,835 | 4,77,609 |
| ශුද්ධ ජංගම වත්කම් | | 10,93,783 | 1,00,35,677 |
| | | 4,46,01,302 | 5,19,79,089 |

## 2:4 අරමුදල් ප්‍රභවය සහ යෙදවීම

සමාලෝචිත වර්ෂයේදී ආයතනයේ අරමුදල් ප්‍රභවය සහ යෙදවීම පහත ප්‍රකාශයෙන් දැක්වේ.

| | | | |
|---|---|---|---|
| **ප්‍රභවය:** | | | |
| රජයේ දායකය | | | 79,00,000 |
| විදේශාධාර | | | 16,94,699 |
| ආසියාතු ධීවර සමාජයේ දායකය | | | 1,21,409 |
| | | | 97,16,108 |
| **යෙදවීම** | | | |
| වර්ෂයේ ඌනතාව | | (87,15,370) | |
| අරමුදල් චලනය නොවන විෂයයන් සඳහා ගැලපීම්--ක්ෂය | | 29,43,535 | |
| | | (57,71,835) | |
| -පෙර වර්ෂය සඳහා ගැලපීම් | | 4,75,250 | |
| | | (52,96,585) | |
| පෙර වර්ෂය තුළ ගිණුම් ගතකළ විශේෂ ඩොලර් ගිණුමේ ශේෂය වෙනුවෙන් ගැලපීම් | | (88,53,775) | |
| | | (1,41,50,360) | |
| ස්ථාවර වත්කම් වලට එකතු කිරීම් | 10,12,885 | | |
| අඩුකලා: නොනිමි ප්‍රාග්ධන වැඩ වලින් මාරු කිරීම් | (1,10,774) | (9,02,111) | |
| විදේශාධාර ව්‍යාපෘති වියදම් වැඩිවීම | | (22,39,649) | |
| වෙනත් ව්‍යාපෘති වියදම් වැඩිවීම | | (13,65,882) | (1,86,58,002) |
| පහත විශ්ලේෂණය කර ඇති පරිදි කාරක ප්‍රාග්ධනයේ අඩුවීම | | | (89,41,894) |

| | | කාරක ප්‍රාග්ධනයට බලපෑම | |
|---|---|---|---|
| | වැඩිවීම | අඩුවීම | |
| | රු. | රු. | රු. |
| තොග | 6,88,022 | 1,15,599 | |
| ණය ගැතියන් | 6,88,022 | - | |
| ලැබිය යුතු තැන්පත් | 4,200 | - | |
| අත්තිකාරම් | 3,79,035 | | |
| ලැබිය යුතු සේවක ණය | 7,41,830 | | |
| මුදල් හා බැංකු ශේෂ | - | 85,39,425 | |
| ණය හිමියන් සහ උපචිත වියදම් | | 9,54,898 | |
| ගෙවිය යුතු තැන්පත් | - | 8,13,539 | |
| සේවක පාරිතෝෂිකය සඳහා ප්‍රතිපාදනය | - | 3,31,520 | |
| | 18,13,087 | 1,07,54,981 | (89,41,894) |

2:5 ගිණුම් පිළිබඳ අදහස් දැක්වීම්

2:5:1 සාවද්‍ය ගණකාධිකරණ ප්‍රතිපත්ති

සමාලෝචිත වර්ෂය අවසානයට විදේශාධාර ව්‍යාපෘති යටතේ රු.2,15,62,094 ක් ද, වෙනත් ව්‍යාපෘති යටතේ රු.49,80,034 ක් ද යනුවෙන් එකතුව රු.2,65,42,128 ක් වූ ව්‍යාපෘති වියදම්, ස්ථාවර වත්කම් ලෙස පෙන්වාදී තිබුණි. පෙර වර්ෂය අවසානයට ඊට අනුරූප මුදල් ප්‍රමාණයක් පිළිවෙලින් රු.1,93,22,445 ක් සහ රු.36,14,152 ක් විය. කෙසේ වුවද ව්‍යාපෘති වියදම් වලින් ස්පෘශ්‍ය වත්කම් කිසිවක් නියෝජනය නොවන අතර ක්‍රමානුකූල පදනමක් මත ව්‍යාපෘති වියදම් අනුපාතික ප්‍රමාණයන් ගෙන් ලියාහැරිය යුතු බව පෙනී යයි.

2:5:2 නොසැසඳුනු වෙනස්කම්

වාර්ෂික ඇස්තමේන්තුවල ශීර්ෂ 580 වැඩ සටහන 1 - ව්‍යාපෘතිය 108 යටතේ ප්‍රාග්ධන වියදම් සඳහා රජයේ ප්‍රදානය ලෙස ප්‍රතිපාදනය කල මුදල රු.3,35,00,000 ක් වූ අතර, ඉන් නියෝජිතායතනයට මුදාහල බවට භාණ්ඩාගාර පොත්වල සඳහන් වූ මුදල රු.1,25,47,439 ක් විය. නෙසේ වුවද රජයේ ප්‍රදානය ලෙස ගිණුම් වල දක්වා තිබුණේ රු.25,94,699 කි. ඒ අනුව වෙනස රු.29,52,740 ක් විය.

## 2:5:3 ගිණුම් වලින් අත්හැරීම්

පහත සඳහන් අත්හැරීම් නිරීක්ෂණය විය.

| වත්කම් | වටිනාකම<br>රු. | කිවයුතු කරුණු |
| --- | --- | --- |
| (අ) වත්කම් | ගණනය කර නැත. | (I) 1981 සැප්තැම්බර් මස නියෝජිතායතනය පිහිටුවීමේදී එවකට ධීවර අමාත්‍යාංශයේ ධීවර තාක්ෂණික අංශයෙන් මාරු කරන ලද වත්කම් 1981 අංක 54 දරණ ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතන පනතේ 35 වගන්තිය යටතේ නියෝජිතායතනයට පවරාදී නොතිබුණි අතර අදාල අගය ගිණුම් වලට ගෙන නොතිබුණි.<br>(II) 1985 පෙ.මස නියෝජිතායතනයට මාරු කරන ලද 'සමුද්‍රමාරු' පර්යේෂණ නෞකාව නියමානුකූලව පවරා දී නොතිබුණි අතර අදාල අගය ගිණුම් වලට ගෙන නොතිබුණි. |
| (ආ) උපචිත වියදම් | 17,53,043 | (I) 1983 ජුලි සිට 1988 ජනවාරි දක්වා වූ කාල සීමාව සඳහා දායක මුදල් වශයෙන් සේවක අර්ථසාධක අරමුදල්ට රු.6,08,840 ක අධිභාරයක් ද ඇතුලුව එකතුව රු.18,76,043 ක් ගෙවිය යුතුව තිබුණි. ඉන් රු.1,25,000 ක් පමණක් සමාලෝචිත වර්ෂය තුල ගෙවා තිබුණු අතර ඉතිරි බැරකම් වූ රු.17,51,043 ගිණුම් වලින් අත්හැර තිබුණි.<br>(II) 'බලයා' නෞකාවේ නඩත්තු වියදම් සඳහා ගෙවිය යුතු රු.2,000 ක මුදලක් අත් - අත්හැර තිබුණි. |
| (ඇ) මත්ස්‍ය තොගය | ගණනය කර නැත | 1990 දෙසැම්බර් 31 දිනට ඉතිරි තොගය ගිණුම් වලට ගෙන නොතිබුණි. |

## 2:5:4 අතිසි අනාවරණය කිරීම

'සමුද්‍රමාරු' නෞකාව වෙනුවෙන් පසු වර්ෂයේ රක්ෂණ වාරිකය වූ රු.2,32,166 ක් සහ පෙර වර්ෂය වෙනුවෙන් වූ වියදම් වල එකතුව රු.19,305 ක් සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස දක්වා තිබුණි.

2:5:5 දිගු කාලීනව හිඟ හිටි මුදල් හිමිකම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වයස් විශ්ලේෂණය අනුව සමාලෝචිත වර්ෂය අවසානයට සැපයුම් හා සේවා අත්තිකාරම් හිඟ මුදල රු.19,23,507 ක් විය. ඊට එකතුව රු.15,71,648 ක් වූ වර්ෂ එක සිට පහ දක්වා වූ කාල සීමාවක් සඳහා වන හිඟ මුදල් ඇතුලත් විය.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට වැටුප් අත්තිකාරම්, ගමන් වියදම් අත්තිකාරම් සහ සුළු මුදල් අත්තිකාරම් හිඟ මුදල රු.2,28,441 ක් විය. ඊට රු.1,14,426 ක් වූ වර්ෂ එක සිට පහ දක්වා වූ කාලසීමාවක් සඳහා වන හිඟ මුදල් ඇතුලත් විය.

2:5:6 විගණනය සඳහා සාක්ෂි නොමැතිවීම.

පහත එක් එක් විෂයය යටතේ සඳහන් කර ඇති ලිඛිත සාක්ෂි නොමැතිවීම හේතුවෙන් එම විෂයයන් විගණනයේ දී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට හෝ විගණනයේදී පිළිගැනීමට හෝ නොහැකි විය.

| විෂයය | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|
| (අ) ස්ථාවර වත්කම් | 5,74,74,015 | (I) ස්ථාවර වත්කම් ලේඛණය<br>(II) භෞතික පැවැත්ම සනාථ කිරීම සඳහා 1990 දෙසැම්බර් 31 දිනට සමීක්ෂණය වාර්තා. |
| (ආ) ගෙවීම් | 7,86,642 | ගෙවීම් සනාථ කිරීම සඳහා වවුචර් 34 ක්. |
| (ඇ) මෝටර් වාහන ධාවන වියදම් | ගණනය කර නැත | මෝටර් වාහන සමහරකට අදාල දෛනික ධාවන සටහන්. |
| (ඈ) සුභසාධක වෙළඳ සැල ඉදිකිරීම සඳහා ගෙවූ අත්තිකාරම් | 1,06,937 | වියදම් විස්තර සහ ගෙවීම් සනාථ කිරීම සඳහා බිල්පත්. |

(9..

**2:5:7 නීති, රීති, රෙගුලාසි කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම්.**

පහත සඳහන් අනුකූල නොවූ අවස්ථාවන් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති රෙගුලාසි ආදියට යොමුව. | අවශ්‍යතාවය | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) 1971 අංක 38 දරණ මුදල් පනත | | |
| - 12 වගන්තිය | ගිණුම් ආකෘතිය සහ අන්තර්ගත වියයුතු කරුණු මුදල් අමාත්‍යවරයාගේ අනුදැනුම සහිතව අදාල අමාත්‍යවරයා විසින් නියම කල යුතුය. | නිශ්චිතව සඳහන් කර නැත. |
| -13(5) (ඕ)වගන්තිය | විගණකාධිපති විසින් නියම කල පරිදි එම වාර්තා ඔහුට ඉදිරිපත් කළ යුතුය. | වාර්තා ඉදිරිපත් නොකැරිණි |
| -13(6) වගන්තිය | විගණකාධිපති විසින් නියම කල පරිදි ගිණුම් පිළිබඳ වාර්තා ගිණුම් සමඟ ඉදිරිපත් කළ යුතුය. | අදාල වාර්තා ගිණුම් සමඟ ඉදිරිපත් නොකැරිණි |
| -13(8) වගන්තිය | 13(7) (අ) වගන්තිය යටතේ විගණකාධිපති විසින් නියෝජිතායතනයට නිකුත් කරන ලද වාර්තාවේ ඇතුළත් කරුණු සම්බන්ධයෙන් කටයුතු කර ඇති ආකාරය ඔහුට දැනුම් දිය යුතුය. | 1989 වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද වාර්තා සම්බන්ධයෙන් පිළිතුරු ඉදිරිපත් නොකැරිණි. |
| -14 (1) වගන්තිය | මුදල් වර්ෂය අවසන් වී මාස 4 ක් තුළ වාර්ෂික කෙටුම්පත් වාර්තාවේ පිටපතක් ඉදිරිපත් කළ යුතුය. | අනුකූලව කටයුතු කර ඇත. |
| (ආ) ආයතන සංග්‍රහයේ XV පරිච්ඡේදයේ | අධ්‍යයනයන් සඳහා ශිෂ්‍යත්ව පිරිනමනු ලබන නිලධාරීන් නිශ්චිත කාල පරිච්ඡේදයක් අනිවාර්යයෙන් සේවය කළයුතුය. | විදේශ ශිෂ්‍යත්වලාභී නිලධාරීන් 05 දෙනෙකු අධ්‍යයනයන් නිම කිරීමෙන් පසු ආපසු සේවයට වාර්තා කර නොතිබුණි. |
| (ඇ) අංක.842 හා 1978 දෙසැම්බර් 19 දින ද දරණ භාණ්ඩාගාර චක්‍රලේඛය. | ස්ථාවර වත්කම් වෙනුවෙන් චක්‍රලේඛයෙන් නියම කරන ලද වාර්තා පවත්වාගෙන යුතුය. | අදාල ලේඛන හා වාර්තා පවත්වා ගෙන නොතිබුණි. |

2:5:8 නොසැදෙන ලද පාලන ගිණුම්.

පහත සඳහන් පාලන ගිණුම් සැසඳා නොතිබුණි.

| ගිණුම | ගිණුම් අනුව ශේෂය | උපයෝගී ලේඛන ශේෂය | වෙනස |
|---|---|---|---|
| ගමන් අත්තිකාරම් | 14,432 | 12,100 | 2,332 |
| ආපදා ණය | 10,23,303 | 9,90,405 | 32,898 |
| විශේෂ වැටුප් අත්තිකාරම් | 26,695 | 24,695 | 2,000 |
| බැංකු ණය | 4,220 | 4,070 | 150 |

## 3. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 3:1 මූල්‍ය ප්‍රතිඵල

1990 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුලදී නියෝජිතායතනයේ කටයුතු වල මූල්‍ය ප්‍රතිඵලය රු.87,15,370 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂය තුලදී රු.61,29,198 ක ඌනතාවක් වුයෙන් රු.25,86,172 ක්වූ පිරිහීමක් තවදුරටත් ගිණුම් වලින් පිළිබිඹුවිනි. පහත විස්තර කර ඇති පරිදි මූල්‍ය ප්‍රකාශ වලින් පිළිබිඹුවන ද්‍රව්‍යාත්මක අස්ථාවරත්වය හේතුකොට ගෙන මෙම විචලනය විශ්ලේෂණය කිරීමට උත්සාහ කිරීමෙන් අර්ථවත් ප්‍රතිඵලයක් ලඟා කර දෙනු ඇතැයි සිතිය නොහැකිය.

නියෝජිතායතනයේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශ වලින් අනාවරණය කැරුණු මූල්‍ය ප්‍රතිඵල, ඊට පසු වර්ෂ වලදී නිරීක්ෂණය කැරුණු වැරදි හා අත්හැරීම් ආදිය සඳහා ගැලපීම නියෝජිතායතනයේ නියත ලක්ෂණයක්ව පැවතුනි. නිදසුනක් ලෙස, පෙර වර්ෂයේ ගිණුම් වලින් දැක්වුණු රු.61,29,198ක් වූ ඌනතාව සමාලෝචිත වර්ෂය තුලදී රු.4,75,250 කින් ගැලපුම් කර තිබුණි. පසුගිය වර්ෂ 04 ක තුළ කරන ලද එවැනි ගැලපුම් පහත දැක්වේ.

| වර්ෂය | මූල්‍ය ප්‍රතිඵලය | පසු වර්ෂය තුලදී කරන ලද ගැලපුම් |
|---|---|---|
| | රු. | රු. |
| 1985 | (19,74,832) | 1,10,123 |
| 1986 | (45,38,360) | (83,26,598) |
| 1987 | (38,58,065) | ( 37,962) |
| 1988 | (63,35,457) | (10,58,134) |

මේ අනුව, සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රතිඵල සහ මූල්‍ය තත්වය පසු වර්ෂ වලදී එවැනි ගැලපුම් වලට ලක්විය නොහැකි බවට නිගමනය කළ නොහැකිය. එබැවින්, ගිණුම් වලින් පිළිබිඹු වුණු මූල්‍ය ප්‍රතිඵල සහ මූල්‍ය තත්වය පිළිබඳව විශ්වාසයක් රැඳවිය නොහැකිය.

3:2 විශේෂ ඩොලර් ගිණුම

නියෝජිතායතනයේ වත්කමක් ලෙස මේ වන තෙක් දැක්වුණු භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් ගේ නමින් වූ විශේෂ ඩොලර් ගිණුමේ ශේෂය සමාලෝචිත වර්ෂය තුලදී එම වත්කම් සහ සමුච්චිත විදේශධාර රු.88,53,775 කින් අඩු කිරීමෙන් ගලපනු ලැබ තිබුණි.

3:3 නිශ්ක්‍රීය සහ ඌන උපයෝජිත වත්කම්

විගණනයේදී නිරීක්ෂණය වුණු නිශ්ක්‍රීය සහ ඌන උපයෝජිත වත්කම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| විෂයය | උපයෝජිත වටිනාකම රු. | උපයෝජනය නොකළ හෝ ඌන උපයෝජනය කළ කාල පරිච්ඡේදය |
|---|---|---|
| මත්ස්‍යයන් බෝකිරීමේ තටාක | ගණනය කර නැත | අවුරුදු 06 ක් |
| ගොඩනැගිල්ල(ක්‍රීඩා කාමරය) | -එම- | අවුරුදු 05 ක් |

මත්ස්‍යයන් බෝකිරීමේ තටාක උපයෝජනය නොකිරීමට හේතු වූයේ උපදේශක විසින් දෙන ලද උපදෙස් නිසා බව සභාපතිවරයා 1992 මාර්තු මාසයේ දී මට දැන්වීය.

3:4 'සමුද්‍රමාරු' නෞකාව අළුත්වැඩියා කිරීම සහ නඩත්තු කිරීම

1985 පෙබරවාරි මාසයේ දී ධීවර අමාත්‍යාංශයෙන් භාර දෙන ලද 'සමුද්‍රමාරු' නෞකාව සමාලෝචිත වර්ෂය අවසානයට ද 09 දෙනෙකුගෙන් සමන්විත කාර්ය මණ්ඩලයක් සහිතව මෙහෙයුම් වලින් තොරව පැවතිනි.

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) නෞකාව නියෝජිතායතනයට නීත්‍යානුකූලව පවරාදී නොතිබුණු නමුත් රු.1,20,00,000 ක්වූ ඇස්තමේන්තුගත වටිනාකමකට රක්ෂණය කර තිබුණු අතර වාර්ෂික වාරිකය වශයෙන් රු.3,98,905 ක් ගෙවනු ලැබ තිබුණි.

(ආ) 1990 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂ 04 ක් තුළ අළුත්වැඩියා හා නඩත්තු කිරීම් සඳහා එකතුව රු.44,54,373 ක් වැය කරනු ලැබ තිබුණි. 1990 අයවැය ලේඛනයේ අළුත්වැඩියා කිරීම් සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණු නමුත් ඒ වෙනුවෙන් රු.24,66,748 ක මුදලක් වැය කරනු ලැබ තිබුණි.

(ඇ) අළුත්වැඩියා කටයුතු රු.2,50,000 ක මුදලකට කොන්ත්‍රාත්කරුවෙකුට පවරාදී තිබුණු අතර, අතර, එම මුදල පසුව රු.3,50,000 ක් වනසේ සංශෝධනය කරන ලදුව රු.1,75,000 ක් වූ සියයට 50 ක අත්තිකාරමක් ගිවිසුමකින් තොරව ගෙවනු ලැබ තිබුනි. කොන්ත්‍රාත්කරු වස්තු භංගත්වයට පත්වීමේ හේතුවෙන් කොන්ත්‍රාත්තුවේ බැඳීම සම්පූර්ණ කිරීමට අපොහොසත් විය. එබැවින් ගෙවන ලද අත්තිකාරම අයකර ගත නොහැකි බවක් පෙනිනි.

(ආ) ඊට පසුව අළුත්වැඩියා කටයුතු රු.1,50,000 කට වෙනත් කොන්ත්‍රාත්කරුවෙකුට පවරා දී තිබුණි. එහෙත්, සමාලෝචිත වර්ෂය අවසානය තෙක් ගෙවන ලද එකතුව රු.22,57,362 ක් සඳහා ටෙන්ඩර් මණ්ඩලයේ අනුමැතිය ලබා දී නොතිබුණි.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් භාණ්ඩ ඉංජිනේරුවෙකුගේ වාර්තාවක් සලකා බැලීමෙන් පසුව කොන්ත්‍රාත්කරුට මුදල් ගෙවීමට තීරණය කළ බව 1992 මාර්තු මාසයේ දී සභාපතිවරයා මට දැන්වීය.

(ඉ) තොකාවේ කාර්ය මණ්ඩලයේ වාර්ෂික වැටුප් පිරිවැය, දීමනා හැර රු.1,56,000 ක් විය.

## 3:5 වාහන ඇණිය

සමාලෝචිත වර්ෂය අවසානයට වාහන 28 ක ඇණියක් නියෝජිතායතනය සතුව තිබුණි. එම වාහන ඇණියේ ධාවන හා නඩත්තු ආදියෙහි මුළු පිරිවැය සමාලෝචිත වර්ෂය තුළදී රු.21,22,980 ක් ද ඊට අනුරූපව පෙර වර්ෂයේ දී රු.20,67,342 ක් ද විය.

එම වාහන වලට අදාල සැලකිය යුතු දත්ත සමහරක් පහත දැක්වේ.

| | 1990 |
|---|---|
| – ධාවනය කරන ලද මුළු දුර කිලෝමීටර් | 1,28,976 |
| – පරිභෝජනය කරන ලද ඉන්ධන – ලීටර් | 58,860 |
| – ලීටරයකට සාමාන්‍ය, සමස්ථ කාර්ය සාධනය--කිලෝ මීටර් | 12.38 |
| – ඉන්ධන සඳහා දරන ලද මුළු වියදම – | රු.12,34,816 |
| – කිලෝ මීටරයක් සඳහා සාමාන්‍ය ඉන්ධන වියදම | රු. 1.69 |
| – අළුත්වැඩියා කිරීම සඳහා මුළු වියදම | රු. 8,88,164 |
| – අළුත්වැඩියා කිරීම් සඳහා කිලෝ මීටරයකට සාමාන්‍ය වියදම | රු. 1.21 |

## 3:6 අයවැය ලේඛනමය පාලනය

සමාලෝචිත වර්ෂය තුල අයවැය ලේඛනගත සහ නියම ආදායම් හා වියදම් අතර සැලකිය යුතු විචලනයක් නිරීක්ෂණය වුනු අතර අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණමය පාලන කාරකයක් වශයෙන් යොදා ගනු ලැබ නොතිබුණු බව ඉන් පෙනී යයි.

4. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු, මුදල් පනතේ 13(1) (අ) වගන්තිය ප්‍රකාර ම විසින් ඉදිරිපත් කරන ලද සවිස්තර වාර්තාව මගින් නියෝජිතායතනයේ සභාපති වරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශෙ විශේෂ අවධානය යොමු කලයුතු වේ.

(අ) මූල්‍ය අධිකාර බලය පැවරීම.
(ආ) ස්ථාවර වත්කම්
(ඇ) ණය ගැතියන්
(ඈ) සුළු මුදල්
(ඉ) අභ්‍යන්තර විගණක විසින් සමාලෝචනය කිරීම.

(එස්.එම්.සබ්රි)
වැඩ බලන විගණකාධිපති

ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය

1990 දෙසැම්බර් 31 දින පැවති අයුරු ශේෂ පත්‍රය

| 1989 | | | | | 1990 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | **දායක මුදල** | | | | |
| | | | 21658558.56 | ගතවූ වර්ෂයේ ශෙ/ප ඉදිරියට - ගෙන් එන ලද ශේෂය (උ.11) | | | | 51979089.44 |
| | | | 21658558.56 | | | | | 8 853775.44 |
| | | | | | | | | 43125314.00 |
| | | | 8783300.00 | 1990 වර්ෂය සඳහා ලැබුණු ආධාර දීමනා | | | | 7900000.00 |
| | | | 28724562.96 | විදේශ ආධාර (උ.02) | | | | 1694699.00 |
| | | | - | වෙනත් ආධාර | | | | 121409.00 |
| | | | | | | | | 52841422.60 |
| | | | 7187332.08 | ආදායමට වැඩි වියදම් අතිරික්තය | | | | 8240120.49 |
| | | | 51979089.44 | | | | | 44601301.51 |
| | | | =========== | | | | | =========== |
| | | | | **දායක මුදල යෙදවීම** | | | | |
| | | | | **ස්ථිර වත්කම්** | | | | |
| 12613979.82 | 5814303.36 | 6799676.46 | | ගොඩනැගිලි | 12929227.34 | 7063812.14 | 5860415.20 | 315248.00 |
| 2951289.00 | 935062 .18 | 2016226.82 | | යන්ත්‍ර උපකරණ | 2985516.20 | 1221340.38 | 1758175.82 | 39227. |
| 9048177.54 | 2694411.57 | 6353765.97 | | උපකරණ | 9529444.74 | 3599229.32 | 5930215.42 | 451267. |
| 733115.76 | 258679.94 | 474435.82 | | ලී බඩු | 862737.67 | 331991.51 | 530746.16 | 129621. |
| 908386.04 | 276672.31 | 631713.73 | | පුස්තකාල පොත් සඳහා | 927363.04 | 366765.91 | 560627.13 | 15977 |
| 2423321.33 | 906687.52 | 1516633.81 | | වාහන | 2455585.33 | 1141819.65 | 1307765.68 | 32260 |
| 360126.27 | 66994.08 | 293132.19 | | ප්‍රධාන පොකුණ | 361376.27 | 103006.68 | 258379.59 | - |
| 513801.44 | 70180.65 | 443620.79 | | ශ්‍රවණාගාරය | 513801.44 | 721560.79 | 392240.65 | - |
| 3614152.12 | - | 3614152.12 | | වෙනත් ප්‍රධාන යෝජනා ක්‍රම (උ.14) | 4980033.68 | - | 4980033.68 | 136588 |
| 477609.25 | - | 477609.25 | | | 366835.50 | - | 366835.50 | - |
| 19322444.92 | - | 19322444.92 | 41943411.28 | විදේශ ආධාර යෝජනා ක්‍රම(උ.15) | 21562093.58 | - | 21562093.58 | 223865 |
| | | | | | 57474014.79 | 13966562.38 | 43507518.41 | 43507518.41 |
| | | | | | =========== | =========== | ========== | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | **<u>ප්‍රවර්ථන වත්කම්</u>** | | | |
| 518208.69 | | | තොග (උ.16) | 398610.29 | | |
| 766747.17 | | | ණයකරුවෝ (උ.17) | 1454768.97 | | |
| 234015.00 | | | තැන්පතු (උ.18) | 238215.00 | | |
| 1544673.75 | | | අත්තිකාරම් (උ.1[illegible]) | 1923708.16 | | |
| 679910.36 | | | ණයකරු සේවකයන් (උ.20) | 1421740.44 | | |
| 12256271.39 | 15995825.96 | | බැංකුව හා මුදල (උ.21) | 3716846.19 | 9153889.95 | |
| | | | **<u>ප්‍රවර්ථන වගකීම්</u>** | | | |
| 2154096.12 | | | ණය හිමියන් හා එකතු වූ වියදම් (උ.22)3108995.00 | | | |
| 2633634.28 | | | තැන්පතු (උ.23) | 3447173.21 | | |
| 1172418.00 | 5960144840 | 10035677.56 | ප්‍රතිපාදන (උ.24) | 1503937.74 | 8060105.95 | 1093783.10 |
| | | 51979089.56 | | | | 44601301.51 |

අ.කලේ/එච්.ආර්.පී.වෙල්ලිගොඩ
සභාපති

ආචාර්යඑම්.යූ.ජයසේකර
අධ්‍යක්ෂ ජෙනරාල්

## 1990 දෙසැම්බර් 31 දිනින් අවසන් වර්ෂය සඳහා ආදායම් වියදම් පිළිබඳ ගිණුම

| 1989 | | | 1990 | |
|---|---|---|---|---|
| | 12166600.00 | රජයේ දායක මුදල | | 13500000.00 |
| | 188157.17 | විවිධ ආදායම් (උප 01) | | 240066.08 |
| | - | වෙනත් ආධාර (උ.02) | | 462759.34 |
| | 12354757.17 | **පුනරාවර්තන වියදම්** | | 14202825.42 |
| | | **පරිපාලන වියදම්** | | |
| 7380120.68 | | වැටුප් හා දීමනා (උ.03) | 7715916.01 | |
| 2[illegible]816.00 | | පාරිතෝෂික වෙන්කිරීම් | 367224.00 | |
| 1060587.22 | | සේවක අර්ථ සාධක අරමුදල් (උ.4) | 1011115.75 | |
| 600728.37 | | අතිකාල | 718918.19 | |
| 696309.78 | | ගමන් වියදම් | 568723.97 | |
| 546632.87 | | ආරක්ෂක වියදම් | [illegible] | |
| 62883.00 | | ගාස්තු | [illegible] | |
| 988206.38 | | ඉන්ධන | [illegible] | |
| 46584.00 | | දැන්වීම් | 118414.00 | |
| 501542.39 | | ලිපි ද්‍රව්‍ය (උ.5) | 573946.05 | |
| 26615.30 | | තැපැල් ගාස්තු | 48635.86 | |
| 103131.35 | | සංග්‍රහ | 122495.23 | |
| 12891.10 | | සුභ සාධන | 20508.30 | |
| 211582.80 | | දුරකථන | 347735.70 | |
| 120588.69 | | විදේශීය ගමන් | 70841.10 | |
| 271242.14 | | විවිධ සේවාවන් | 181233.15 | |
| 1158057.45 | | මෝටර් රථ, ගොඩනැගිලි හා වෙනත් වාහන නඩත්තු | 3791937.85 | |
| 5789.20 | | තිල ඇඳුම් | 2380.00 | |
| 50000.00 | | විගණක ගාස්තු | 50000.00 | |
| 9066.65 | | බැංකු ගාස්තුව | 8960.51 | |
| 508462.81 | | | 472710.22 | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 29955.79 | | | මුද්‍රණ වැඩ | | | 75501.80 |
| | | | බොල් ණය සඳහා ප්‍රතිපාදනය | | | 95990.24 |
| | 14839897.87 | | විශේෂ යෝජනා ක්‍රම සඳහා වියදම්(උ. ) | 462759.34 | 18808939.19 | |
| | | | **ආයතන වියදම්** | | | |
| 790835.75 | | | විදුලි බලය | 1160578.50 | | |
| 34986.30 | | | ගෑස් | 4643.40 | | |
| | | | | 500.00 | | |
| 2819335.17 | 3645157.02 | 18483954.89 | ක්ෂයවීම් සඳහා ප්‍රතිපාදන (උ.10) | 2943534.77 | 4109256.67 | 22918195.86 |
| | | 6129197.72 | ආදායමට වැඩියෙන් වියදම | | | 8715370.44 |
| | | 1658134.36 | පසුගිය වර්ෂය සඳහා හරි ගැස්වීම | | | 475249.95 |
| | | 7187332.08 | | | | 8240120.49 |
| | | =========== | | | | ========== |

එම්. ආර්. පී. මෙල්ලිගොඩ
සභාපති

ආචාර්ය එම්. යූ. ජයසේකර
අධ්‍යක්ෂ ජෙනරාල්